FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER





FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2563 - ක්‍රි.ව. 2019
දෙසැම්බර් (උදුවප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

13




දඹුලු විහාරය

## දඹුලු රන්ගිරි වෙහෙර නමදිමු

සුවඳැති කුසුම් ලොව පුබුදු කරයි
බොදු බැති දනෝ නිබඳව පින් දහම් කරයි
රන්ගිරි වෙහෙර දසතින් සිල් සුවඳ ගලයි
දෙසූ දහමට මුළු ලොවම යටයි

-නිමල්-

## ඇතුළු පිටු...

- අප්‍රමාණ මෛත්‍රිය නිවන් දොරටුවකි.
- මිනිස් ඇසට නොපෙනෙන ලෝකය.
- ථේරි ථේරි ගාථා.
- බුදුදහමේ ඉගැන්වෙන දානය ගැන දැනගනිමු.

සමග 'සුරස' ශාස්ත්‍රීය අතිරේකය.


රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# උදුවප් පෝය වර්ණාව

දඹදිව සිට ශ්‍රී සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ රැගෙන ශ්‍රී ලංකා ද්වීපයට වැඩම කරවීම සමරන උතුම් පොහොයක් ලෙස උදුවප් පොහොය හඳුන්වාදීමට පුළුවන. ආගමික හා සාමාජික නිදහසක් නොමැතිව අප්‍රමාණ පීඩාවට පත් කාන්තා සමාජයට ලොව්තුරා නිවන් සුවය ලබාගැනීමේ ප්‍රධාන ප්‍රභූකාන්තාවන්ගේ ප්‍රව්‍රජ්‍යාව ආරම්භවී භික්ෂුණී සසුනක් ශ්‍රී ලංකාද්වීපයේ ස්ථාපිත වන්නේ මෙම පොහොය මූලික කරගෙනය.

සංඝමිත්තා රහත් මෙහෙණින් මෙරටට වැඩමකරවූ ජයශ්‍රීමහා බෝධීන් වහන්සේගේ දක්ඛිණ ශාඛාව අනුරාධපුර මහමෙවුනා උයනෙහි රෝපණය කිරීමද සිදුවූයේ මෙම පොහොය මූලික කරගෙනය. වර්තමාන ලෝකයේ ජීවමානව පවතින වෘක්ෂය ලෙස සලකනු ලබන්නේ මෙම ජයශ්‍රීමහා බෝධීන් වහන්සේය. වාර්ෂිකව පැවැත්වෙන සහල් මංගල්‍යය ආරම්භවන්නේ ද උඳුවප් පොහොය මූලික කරගෙනය. අනුරාධපුර අටමස්ථානයන්හි විශේෂ පූජාවිධිද මෙම පොහොය සම්බන්ධ කරගෙන පැවැත්වෙන බව සඳහන් කිරීමට පුළුවන.

සොළොස්මස්ථානයන්ගෙන් එකක්වන සිරිපාවන්දනා කාලය උද්‍රවන්නේද උඳුවප් පොහොය ආරම්භයත් සමඟය. වස් කාලය තුළ ආරාමවල එක්තැන්වී සිටි භික්ෂූන් වහන්සේලා ධර්මචර්යාවේ යෙදීම ආරම්භ වන්නේ මෙම කාල සීමාවේ සිටය. ලක්දිවපුරා විසිරී සිටින මෙහෙණින් වහන්සේලා තමන්ගේ විමුක්තිද්‍රයිකාව වූ ශ්‍රී සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේට ගෞරව පිණිස පෙරහැරවල් පැවැත්වීම සිදුවන්නේ උඳුවප් පොහොය දින හෝ එයට ආසන්න දිනයකවීම වැදගත්වේ.

වාර්ෂික වශයෙන් භික්ෂුණීන් වහන්සේලාගේ විශේෂ ගුණ සැමරුම් සම්මේලනයන්ද මෙම පොහොය දින හෝ පසුදින පැවැත්වීම සිරිතක් බවට පත්ව තිබේ. මේ සඳහා ලාංකික බෞද්ධ ජනතාවගේ සහයෝගය නොඅඩුව ලැබීම විශේෂත්වයකි. ලංකාවේ ප්‍රධාන විහාරස්ථානයන්හි මෙම පොහොය වෙනුවෙන් ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජාවන්හි බෞද්ධ ජනතාව යෙදෙති. මේ අනුව පෙනීයන්නේ වප් පොහොය උතුම් පොහෝ දිනයක් වන බවයි.

ඇම්.ඩී.විජයවර්ධන

පුදබිමක අසිරිය

# රුවන්වැලි මහදාගැබ් වහන්සේ



අනුරාධපුර රාජධානිය තුළ නිර්මාණය වූ සුවිශේෂී දාගැබක් ලෙස රුවන්වැලි මහදාගැබ හඳුන්වාදීමට පුළුවන. මහාවංශයේ සඳහන් වන්නේ මෙම දාගැබ නිර්මාණය කලයුතු ස්ථානය මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලකුණු කොට දුන් බවයි. මහමෙව්නා උයනයට අයත් භූමි ප්‍රදේශයක පිහිටි තෙලඹුගසක් විමානයක් කොට ජීවත්වූ ස්වර්ණමාලි දෙව්දුව එම ස්ථානයෙන් ඉවත්කර මෙය නිර්මානය කළ නිසා ''ස්වර්ණමාලි'' යන නාමය තැබූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි ස්වර්ණමාලි, රත්නමාලි, රුවන්වැලි, මහාථූප යන නම් වලින් හඳුන්වා ඇත. මෙම ස්ථූපය (ක්‍රි:පූ:161-137) දුටුගැමුණු මහරජතුමා විසින් ආරම්භ කරන ලදි. මෙම ස්තූපයේ වැඩ කටයුතු නිමවීමට ප්‍රථම රජතුමා රෝගාතුර විය. දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජතුමා මෙම ස්ථූපයේ ඉතිරිවැඩ අවසන් කෙළේය. ලංකාවේ ඉදිකරන ලද ස්ථූප අතරින් මෙයට සුවිශේෂී තැනක් හිමිවන්නේ සර්වඥ ධාතූන් වහන්සේලා ද්‍රෝණයක් පමණ නිධන් කර තිබීමය. මෙම ස්ථූපයේ ධාතු නිධානෝත්ස්වයට ලංකාවේ සතර දිසාවෙන්ම රහතන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නය විශාල ප්‍රමාණයක් වැඩමකළ බව මහාවංශයෙහි සඳහන් වෙයි. මෙම ස්ථූපය උසින් අඩි (300)තුන්සියයකි. වටප්‍රමාණය අඩි (900) නමසියයක් පමණවේ. මෙහි සතර දිසාවෙහි වාහල්කඩ සතරකි. වැලිමළුවෙන් ඇතුල්වීමෙන් පසු සලපතල මළුවට ඇතුළුවිය හැකිය. සලපතල මළුවට පිටතින් ඇත් පවුරකි. මළුවේ සතර දිසාවෙහි කුඩා ප්‍රමාණයේ පරිවාර ස්ථූප හතරකි. මෙම ස්ථූපයේ මුල් අවස්ථාවේ මුදුනට ඡත්‍රයක් සවිකර තිබූ බවට සාධක තිබේ. ලජ්ජිතිස්ස රජතුමා මෙම ස්ථූපයට මල්පූජා කිරීම සඳහා විශේෂ පේසාවළලු තුනක් ඉදිකළ බව සඳහන්වෙයි. මහානාග රජතුමා ආමණ්ඩගාමිණී රජතුමා, Iසිරිනාග රජතුමා, සංඝතිස්ස රජතුමා, Iවෙනි අග්‍රබෝධි රජතුමා වැනි රජදරුවන් මෙම ස්ථූපයේ දියුණුව සඳහා සේවාවන් රැසක් ඉටුකර ඇතිබව මහාවංශය, ථූපවංශය යන ඓතිහාසික ග්‍රන්ථවල සඳහන්වෙයි. තුන්වැනි මුගලන් රජතුමා මෙම ස්ථූපය ප්‍රතිසංස්කරණය සිදුකර ඇත. විදේශයන්ගෙන් එල්ල වූ පරසතුරු උවදුරු නිසා 1017දී අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු බෞද්ධ ගොඩනැගිලිද සොලීන්ට යටත්විය. රුවන්වැලිසෑයත් උවදුරුවලට ගොදුරුවිය. අවස්ථා කිහිපයකදී මෙම ස්ථූපය ගිලාබැසීමකට භාජනය වී ඇති බව ථූපවංශයේ සඳහන් වෙයි. යලිත්වරක් මෙම ස්ථූපයට ආසන්න මළුවේ සංඝාවාස වැනි ගොඩනැගිලි පැවැති බවට සාධක හමුවී තිබේ. දියබුබුලක හැඩයට නිර්මාණය කර ඇති මෙම ස්ථූපය ජනීජනයා තුළ ශ්‍රද්ධාව වැඩි දියුණු කරවන්නකි. වාර්ෂිකව පැවැත්වෙන සති පිරිත් දේශනා පෙරහැර වැනි ආගමික අංශයන් රැසක් මෙම ස්ථූපය මූලික කරගෙන පැවැත්වේ. වර්තමානය වනවිට රුවන්වැලිසෑරදුන් ලෝක පූජිත තත්වයට පත්ව තිබේ. දෙස්, විදෙස් ජනතාවගේ ගෞරවාදරයට පාත්‍රවී ඇති මෙම රුවන්වැලි දාගැබ ඉදිරියටත් රැකබලා ගැනීම අපසතු වගකීම වන්නේමය.



ඇම්.ඩී.විජයවර්ධන
තලවත්තේගෙදර

# අප්‍රමාණ මෛත්‍රිය නිවන් දොරටුවකි.



භාග්‍යවතුන් වහන්සේ ධර්මය අවබෝධය සඳහා මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බඹසර වැඩිය යුතු බව දේශනා කර ඇත. ඒ සඳහා පටිපදා හතරක් භාවිතා කළ යුතු බව, අඞගුත්තර නිකායේ, චතුක්ක නිපාතයේ එන තතිය පටිපදා සූත්‍රය (බු.ජ.ත්‍රි, අං.නි 2-290 පිටුව) තුළින් පෙන්වා දී ඇත. එම පටිපදා හතර පහතින් දැක්වේ.

**1. දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා** - දුක් වූ පිළිවෙත් ඇති ලැසිව ලබන අභිඥා

**2. දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා** - දුක් වූ පිළිවෙත් ඇති සීඝ්‍ර ව ලබන අභිඥා

**3. සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා** - සුඛ වූ පිළිවෙත් ඇති ලැසි ව ලබන අභිඥා

**4. සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා** - සුඛ වූ පිළිවෙත් ඇති සීඝ්‍ර ව ලබන අභිඥා

එයින් දුක්ඛපටිපදා දන්ධාභිඤ්ඤා මෙසේ විස්තර කර ඇත.

*"කතමා ච භික්ඛවේ දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා? ඉධභික්ඛවේ භික්ඛු අසුභානුපස්සී කායේ විහරති, ආහාරේ පටික්කූලසඤ්ඤා, සබ්බලෝකේ අනභිරතසඤ්ඤා, සබ්බසංඛාරේසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛෝ පනස්ස අජ්ඣත්තං සූපට්ඨිතා හෝති. සෝ ඉමානි පඤ්ච සේඛබලානි උපනිස්සාය විහරති. සද්ධාබලං, හිරිබලං, ඔත්තප්පබලං, විරියබලං, පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං. සෝ ඉමේසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවේ දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා."*

*"මහණෙනි, දුක් වූ පිළිවෙත් ඇති ලැසි ව ලබන අභිඥා කවරද? මහණෙනි, මෙ සස්නෙහි මහණ තමාගේ කයෙහි අසුභානුපස්සී වූයේ, කබලිංකාර ආහාරයේ පටික්කූල සංඥා ඇත්තේ, මුළුලොවෙහි උකටලී සංඥා ඇත්තේ, සියලු සංස්කාරයන් හි අනිත්‍යානුපස්සී වූයේ වෙසේ. ඔහුගේ සිතෙහි මරණ සංඥාව මැනවින් එළඹ සිටියේ වෙයි. හේ ශ්‍රද්ධාබලය, හිරිබලය, ඔත්තප්පබලය, විරියබලය, ප්‍රඥාබලය යන පඤ්ච සේඛබලයන් ඇසුරු කොට වෙසෙයි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය, වීර්යේන්ද්‍රිය, සතීන්ද්‍රිය, සමාධීන්ද්‍රිය, ප්‍රඥේන්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියෝ මෘදුව පහළ වෙති.*

*හේ මේ පඤ්චේන්ද්‍රියන්ගේ මෘදු බැවින් ආසවක්ෂය පිණිස ආනන්තරික මාර්ග සමාධියට ලැසිව පැමිණේ. මහණෙනි, මෙය දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා යී කියනු ලැබේ."*

මෙම පටිපදාව අනුව යම් භාවනා කරන අයෙක් කයේකෙස්, ලොම්, නිය ආදී පිළිකුල් කොටස් තිස්දෙක අනුව භාවනා කරමින් හෝ කනබොන ආහාරයේ පිළිකුල් ස්වභාවය අනුව භාවනා කරමින් හෝ ගිරිමානන්ද සූත්‍රයේ එන සබ්බලෝකේ අනභිරතසංඥා අනුව භාවනා කරමින් හෝ සබ්බසඞ්ඛාරේසු අනිච්චසංඥා අනුව භාවනා කරමින් හෝ නිරතවනවිට, ඔහුට මරණානුස්සතිය මැනවින් වැඩෙන බව පෙන්වා දී ඇත.

එහිදී ඔහුගේ ශ්‍රද්ධාබලය ආදී පඤ්ච සේඛ බලයන් ඇතිවී, ශ්‍රද්ධෙන්ද්‍රිය ආදී පඤ්ච ඉන්ද්‍රියන් මෘදුව හෙවත් සියුම්ව පහල වේ. එබැවින් ඔහු කෙලෙස් ආස්‍රව ප්‍රහීන කිරීම සඳහා ලැසිව හෙවත් හෙමෙන් ගමන් කරයි.

මෙහි එන සබ්බලෝකේ අනභිරතසංඥා වැඩීමේදී, තමන්ගේ හිසේ සිට දෙපතුල දක්වා වන පුද්ගල පැවැත්ම හෙවත් රූප, වේදනා, සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණ ලෝකයේ පවතින සියලු සංඥා තෘෂ්ණා, දෘෂ්ටි වශයෙන් උපාදාන කර නොගත යුතුය. එනම් සිතට ස්ථාන වන දේ වලින් හෙවත් අධිෂ්ඨාන (සත්‍ය ,ත්‍යාග, ප්‍රාඥා, උපසමාධි) වලින්ද, සංස්කාරවලට ඇති ඇලීම් හෙවත් අභිනිවේසයෙන් ද , සිතේ අභ්‍යන්තරික වශයෙන් අප්‍රකටව පවතින රාගානුසය, පටිගානුසය, අවිද්‍යානුසය ආදී අනුසය ධර්ම වලින් ද සිත අලවා නොගැනීමයි.

මෙහි එන සබ්බසඞ්ඛාරේසු අනිච්ච සංඥා වැඩීමේදී, සියලු සංස්කාරයන්හි ඇතිවීම නැතිවීම දකිමින් වාසය කරයි. එහිදී සියලු සංස්කාරයන්, (අට්ටීයති) පීඩාගෙනදෙන බව, (හරායති) ලැජ්ජාවට පත්වන බව සහ (ජිගුච්ඡති) පිළිකුල් සහගත බව අවබෝධ කරමින් බැහැර කරයි.

මෙම දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාව තුළින් මෛත්‍රී අප්‍රමාණය වැඩිය හැකි බව දේශනා කර ඇත. එය පෙටකොපදේසේ (බු.ජ.පෙ.දෙ.315) දක්වා ඇත.

ඉහත ආකාරයෙන් දුක්ඛාපටිපදා දන්ධා අභිඤ්ඤා වඩන කල්හි, බහුලකරන කල්හි ප්‍රථම ධ්‍යානය සම්පූර්ණ කරයි. මෙම ධ්‍යානය සමථය වැඩීම නිසා ඇතිවන්නකි. මෙම ප්‍රථම ධ්‍යානය වැඩුන විට පළමු සතිපට්ඨානය හෙවත් කායානුපස්සනාව වැඩේ. කායානුපස්සනාව පරිපූර්ණය වූ විට ප්‍රථම විහාරය හෙවත් දිබ්බ විහාරය සම්පූර්ණය කෙරෙයි.

දිබ්බ විහාරය යනු සතර ධ්‍යානයි. මෙය යම් පටිච්ච සමුප්පාදයක් අවබෝධයෙන් ඇති වන්නකි. දිබ්බ විහාරය පරිපූර්ණ වූ විට ප්‍රථම සම්යක් ප්‍රධාන වීර්ය සම්පූර්ණය කෙරෙයි. එනම් නූපන් ලාමක අකුසල ධර්මයන් හෙවත් කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක නූපදනා පිණිස කරනු ලබන පළමු වීර්යයි.

ප්‍රථම සම්‍යක් ප්‍රධාන වීර්ය පරිපූර්ණය වූ විට ප්‍රථම ආශ්චර්ය අද්භූත ධර්මය හෙවත් දුක්ඛ ආර්ය සත්‍යය පරිපූර්ණය කෙරෙයි.

දුක්ඛ ආර්ය සත්‍යය පරිපුරණය වූ විට ප්‍රථම අධිෂ්ඨානය හෙවත් සත්‍යාධිෂ්ඨානය පරිපූර්ණය කෙරෙයි. සත්‍යාධිෂ්ඨානය පරිපූර්ණය වූ විට ඡන්ද සමාධිය ඇතිවේ. ඡන්ද සමාධිය පරිපූර්ණය වූ විට ඉන්ද්‍රිය සංවරය ඇතිවේ. ඉන්ද්‍රිය සංවරය පරිපූර්ණය වූයේ මෛත්‍රී අප්‍රමාණය පරිපූර්ණය කෙරෙයි.

මෙලෙස දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා වඩන කල්හි, බහුලකරන කල්හි ප්‍රථම ධ්‍යානය සම්පූර්ණ කරයි. කෙස්, ලොම් ආදිය අසාර, අසුභ වශයෙන් මෙනෙහිකරන විට විතක්ක විචාර සහිත ප්‍රථම ධ්‍යානය ඇතිවේ. එම චිත්ත සමාධිය පදනම් කරගෙන ඇතිවෙන කායානුපස්සනාව හෙවත් කය අනුව ඇත්ත දකිනවිට, රූපයේ ඇතිවීම සහ නැතිවීම අවබෝධයෙන් වන දිබ්බ විහාර හෙවත් සතර දැහැන් ඇතිවේ.

මෙලෙස සතර දැහැන් පවත්වාගෙන යාමටනම් නැවත කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක ඇතිවීම වැළැක්වීමට වීර්ය කළ යුතුය. එවිට පළමු සම්‍යක් ප්‍රධාන වීර්ය සම්පූර්ණ වේ. මෙසේ සිත පිරිසිදු වූ කල්හි ලෝකයේ සිටින සියලු ම සත්වයන් ජාති වී ජරා වී ව්‍යාධි වී මරණයට පත්වන බව අවබෝධ වේ. එනම් එය දුක්ඛ ආර්ය සත්‍යය යි.

මේ අනුව මෙම සත්වයා විඳින දුකට ලෝක ධර්මයන් තුළින් කොතරම් ලෝකෝත්තර නිර්වාණය තුළ පමණක් ඇතිබවත් අවබෝධ වේ (මුසා යං මෝසධම්මං තං සච්චං, යං අමෝසධම්මං නිබ්බානං).

එය සිදුවන්නේ සත්‍යාවධිෂ්ඨානය තුළිනි. එබැවින් නොපවතින ලෝකයට ඇති කැමැත්ත නැතිවී, පවතින නිවනට කැමැත්ත ඇතිවේ. එමගින් ඡන්ද සමාධිය ඇතිවේ. මෙම ඡන්ද සමාධිය පැවැත්වීමට අභිජ්ජාව (රූපාදී අරමුණු වලට ඇලීම) සහ දෝමනස්ස ය(රූපා දී අරමුණු වලට ගැටීම) බාධකයන්ය. එනම් ඡන්ද සමාධිය පැවැත්වීමට නම් ඇස, කණ ආදී ඉන්ද්‍රියන් සංවර කරගත යුතුය.

මෙසේ ඉන්ද්‍රිය සංවරය ඇතිකරගෙන මෙලෙස ලෝකයෙන් වෙන්ව ලෝකෝත්තර සැපය සියලු සත්වයෝ ලබත්වා! යි මෙත්තාවක් ඇතිවේ. එම මෙත්තාව සියලු සත්වයන්ට වෙනසක් නොකර සිදුකරන්නට හැකිනම් මෙත්තාවෙන් අප්‍රමාණයට ගමන්කළ හැකිය.

සාමාන්‍යයෙන් තමන්ගේ භවය පැවැත්මට උපකාර කරන අයට මෙත්තාව වැඩිය. උදාහරණයක් ලෙස ආයතනයේ ප්‍රධානියාගේ පෞද්ගලික කටයුත්තකට තමා නොවැරදීම සහභාගීවීමත්, ආයතනයේ ලිපිකරුගේ පෞද්ගලික කටයුත්තකට තමා සහභාගී නොවීමත් දැක්විය හැකිය. මෙසේ සිදුවන්නේ තමන්ගේ භවය පැවැත්වීමට ලිපිකරුට වඩා වැඩි උපකාරක් ප්‍රධානියා තමන්ට කරන නිසාය. තමන් මෙත්තා අප්‍රමාණයේදී ප්‍රධානියාත්, ලිපිකරුත් දෙදෙනාම "දුක්විඳින සත්වයන්" බව අවබෝධ කරගෙන කුලයක නොඇලී මෙත්තාව පැවැත්විය යුතුය.

මේ අනුව මෛත්‍රී අප්‍රමාණය සිදුකිරීමට නම්, තමන් ද ලෝකය දුක බව අවබෝධ කරගෙන සියලු සත්වයන් දුක්විඳින සත්වයන් ලෙස සලකා ඔවුන්ට එක හා සමානව මෙත්තාව පැවැත්විය යුතුය. එවිට ඔහුට මෛත්‍රි වැඩීම දක්වා ගමන්කළ හැකිය. මෛත්‍රී අප්‍රමාණය නිවන් දොරටුවකි. සැවොම අවබෝධයෙන් මෙත්තාව වැඩීමට අධිෂ්ඨාන කර ගනිමු. සියලු සත්වයෝ සුවපත් වෙත්වා.

**පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි**
**ආර්ය නිකේතනය**
**කන්නිමහර - වතුරුගම.**

# ප්‍රායෝගික වූ බුදුදහම

අනුරාධපුර රාජධානිය තුළ නිර්මාණය වූ සුවිශේෂි දාගැබක් ලෙස රුවන්වැලි මහදාගැබ හඳුන්වාදීමට පුළුවන. මහාවංශයේ සඳහන් වන්නේ මෙම දාගැබ නිර්මාණය කලයුතු ස්ථානය මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලකුණු කොට දුන් බවයි. මහමෙව්නා උද්‍යානයට අයත් භූමි ප්‍රදේශයක පිහිටි තෙලඹුගසක් විමානයක් කොට ජීවත්වූ ස්වර්ණමාලි දෙව්දුව එම ස්ථානයෙන් ඉවත්කර මෙය නිර්මානය කළ නිසා ''ස්වර්ණමාලි'' යන නාමය තැබූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි ස්වර්ණමාලි, රත්නමාලි, රුවන්වැලි, මහාථූප යන නම් වලින් හඳුන්වා ඇත. මෙම ස්ථූපය (ක්‍රි:පූ:161-137) දුටුගැමුණු රජතුමා විසින් ආරම්භ කරන ලදි. මෙම ස්තූපයේ වැඩ කටයුතු නිමවීමට ප්‍රථම රජතුමා රෝගාතුර විය. දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජතුමා මෙම ස්ථූපයේ ඉතිරිවැඩ අවසන් කෙළේය. ලංකාවේ ඉදිකරන ලද ස්ථූප අතරින් මෙයට සුවිශේෂි තැනක් හිමිවන්නේ සර්වඥ ධාතුන් වහන්සේලා ද්‍රෝණයක් පමණ නිධන් කර තිබීමය. මෙම ස්ථූපයේ ධාතු නිධානෝත්ස්වයට ලංකාවේ සතර දිසාවෙන්ම රහතන් වහන්සේලා ප්‍රධාන මහා සංඝරත්නය විශාල ප්‍රමාණයක් වැඩමකළ බව මහාවංශයෙහි සඳහන් වෙයි. මෙම ස්ථූපය උසින් අඩි (300)තුන්සියයකි. වටප්‍රමාණය අඩි (900) නමසියයක් පමණවේ. මෙහි සතර දිසාවෙහි වාහල්කඩ සතරකි. වැලිමළුවෙන් ඇතුල්වීමෙන් පසු සලපතල මළුවට ඇතුළුවිය හැකිය. සලපතල මළුවට පිටතින් ඇත් පවුරකි. මළුවේ සතර දිසාවෙහි කුඩා ප්‍රමාණයේ පරිවාර ස්ථූප හතරකි. මෙම ස්ථූපයේ මුල් අවස්ථාවේ මුදුනට ඡත්‍රයක් සවිකර තිබූ බවට සාධක තිබේ. ලජ්ජිතිස්ස රජතුමා මෙම ස්ථූපයට මල්පූජා කිරීම සඳහා විශේෂ ජේසාවළලු තුනක් ඉදිකළ බව සඳහන්වෙයි. මහානාග රජතුමා ආමණ්ඩගාමිණී රජතුමා ।සිරිනාග රජතුමා සංඝතිස්ස රජතුමා ।වෙනි අග්‍රබෝධි රජතුමා වැනි රජදරුවන් මෙම ස්ථූපයේ දියුණුව සඳහා සේවාවන් රැසක් ඉටුකර ඇතිබව මහාවංශය, ථූපවංශය යන ඓතිහාසික ග්‍රන්ථවල සඳහන්වෙයි. තුන්වැනි මුගලන් රජතුමා මෙම ස්ථූපය ප්‍රතිසංස්කරණය සිදුකර ඇත. විදේශයන්ගෙන් එල්ල වූ පරසතුරු උවදුරු නිසා 1017දී අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු බෞද්ධ ගොඩනැගිලිද සොලීන්ට යටත්විය. රුවන්වැලිසෑයත් උවදුරුවලට ගොදුරුවිය. අවස්ථා කිහිපයකදී මෙම ස්ථූපය ගිලාබැසීමකට භාජනය වී ඇති බව ඇතැම් ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වෙයි. යළිත්වරක් මෙම ස්ථූපයට ආසන්න මළුවේ සංඝාවාස වැනි ගොඩනැගිලි පැවැති බවට සාධක හමුවී තිබේ. දියබුබුලක හැඩයට නිර්මාණය කර ඇති මෙම ස්ථූපය ජනීජනයා තුළ ශ්‍රද්ධව වැඩි දියුණු කරවන්නකි. වාර්ෂිකව පැවැත්වෙන සති පිරිත් දේශනා පෙරහැර වැනි ආගමික අංශයන් රැසක් මෙම ස්ථූපය මූලික කරගෙන පැවැත්වේ. වර්තමානය වනවිට රුවන්වැලිසෑරදුන් ලෝක පූජිත තත්වයට පත්ව තිබේ. දෙස්, විදෙස් ජනතාවගේ ගෞරවාදරයට පාත්‍රවී ඇති මෙම රුවන්වැලි දාගැබ ඉදිරියටත් රැකබලා ගැනීම අපසතු වගකීම වන්නේමය.

**ශාස්ත්‍රපති
ඇම්.ඩී.විජයවර්ධන
තලවත්තේගෙදර**



# ධම්ම පද ගීතය
## " සසර ගිමන.... "

පමා වෙලා පහර වදින
විටදී වේගයෙන්...
අජානේය අසෙකු
දුවනු වගේ වේගයෙන්...
නිවාලන්න සසර ගිමන
දැවෙන තාපයෙන්...
විලිය වැඩිය යුතු
මිදෙන්න කෙළෙස් දාමයෙන්...



කළ නොහැක එය
මඩ ගොහොරුවක ලැග...
කළ නොහැක හිස
ජටා බැඳගෙන...
කළ නොහැක ගත
විලි නොවැස හිඳ...
කළ යුතුය කෙලෙසුන්
දවාගෙන...

දියාලුවෝ දියගෙන යති
කැමති දිශාවෙක...
ලී වඩුවෝ ලීය නමති
කැමති ලතාවට...
සිත කීකරු කර සැනසෙමු
දහමට යොමුකර...
සීල සමාදි විදසුන්
මිණිකැට ඔපකර...

දණ්ඩ වග්ග (144 - 145 ඇසුරිණි)

**පී.එම්. අහංගම**

**බුදුන් උපන් දේශයේ සිට**

# ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට මූලික වූ
# සාංචි පුදබිම

ඉන්දියාවේ සාංචි පුදබිම පිහිටා තිබෙන්නේ මධ්‍ය ප්‍රදේශයේ බෝපාල් අගනගරයේයි. එම පුණ්‍ය භූමිය බෞද්ධ අපට ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස හැඳින්විය හැක. අග්‍රශ්‍රාවක ධාතුන් වහන්සේ දෙනම චේතියගිරි විහාරයේ වැඩ සිටීම හා එහි ඇති සංස්කෘත වටිනාකම ඉන් පිළිඹිබු වේ.

මදුරාසියේ සිට කි.මී.1486ක් පමණ ගිය විට බොපාල් ප්‍රධාන නගරය හමුවේ. එහි සිට කි.මී. 45ක් පමණ දුරින් සාංචි පුදබිම පිහිටා තිබේ. බෝපාල් නුවරට ළඟා වීමට සීඝ්‍රගාමී දුම්රියෙන් ගමන් කරීම වඩාත් පහසුය. අන්ඩමාර් හෝ දාදර් දුම්රියෙන් ගමන් කළහොත් සාංචි දුම්රිය ස්ථානයෙන්ම බැසිය හැක. සාංචි පුදබිම වැඳපුදා ගැනීමට එන ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට ශ්‍රී ලංකා මහබෝධි ධර්ම ශාලාවේ නවාතැන් පහසුකම් ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

ලෝක උරුමයක් වූ සාංචි පුදබිම වර්තමානයේ ශ්‍රී ලංකා මහබෝධි සංගමය විසින් පාලනය කෙරේ. චේතියගිරි විහාරස්ථානයේ විහාරාධිපති ලෙස බානගල උපතිස්ස ස්වාමීන් වහන්සේ වැඩ වෙසෙති. ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් වන සාංචි පුදබිම ඉන්දියාවේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ආරක්ෂාව හා නඩත්තු කටයුතු වෙනුවෙන් මහත් කැපවීමක් සිදුකරයි. බුද්ධ කාලයේ පැවති සොළොස් මහජනපද අතරින් අවන්ති දේශය ලෙස හඳුන්වා ඇත්තේ මධ්‍ය දේශයයි. එසමයෙහි මෙහි ධර්ම ප්‍රචාර කටයුතු වල මූලිකත්වය ගෙන කටයුතු කොට ඇත්තේ මහා කච්චායන මහ රහතන්වහන්සේය. මෙහි ප්‍රධාන දායකයා වී ඇත්තේ වේදිස සිටුවරයාය. යුවරජ ලෙස අවන්ති දේශයට පැමිණි අශෝක රජතුමා වේදිස සිටුවරයාගේ දියණිය වූ දේවි විවාහ කරගෙන උධිජේන් ප්‍රදේශයේ පාලනය ගෙන ගොස් ඇත. බින්දුසාර රජතුමාගේ අභාවයෙන් පසු, අශෝක රජතුමා සාංචි ස්ථූපයත්, සංඝාවාසයත් මෙම පුදබිමෙහි ගොඩ නැංවීමට කටයුතු කළේය.

ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට විශාල දායකත්වයක් කළ මිහිඳු හිමි සහ සංඝමිත්තා තෙරණිය ඉපිද ඇත්තේ ද මධ්‍ය ප්‍රදේශයේ බව ඉතිහාසය සඳහන් කරයි. වේදිසා දේවිය වෛශ්‍ය කුලයේ කාන්තාවක් හෙයින් අශෝක රජතුමා බුදුදහම ගැන බොහෝ කරුණු ඉගෙන ගත්තේ ද දේවියගෙන් බව ශිලා ලිපි වල සඳහන් වේ.



මෙහිදී අශෝක අධිරාජයා වසර ගණනාවක් යුද්ධ කිරීමෙන් පසු ධර්මාශෝක ලෙස අගතැන්පත් වීමෙන් පසු සාංචි පුදබිමට විශේෂ අවධානයක් යොමු කරමින් එහි පුනර්ජීවය සඳහා කටයුතු කිරීම වැදගත්ය. ක්‍රි.පූ. පළමුවෙනි ශතවර්ෂයේ දී ලෝක උරුමක් බවට පත්වූ පසු සාංචි තොරණ නිර්මාණය විය. ඉන්පසු එළැඹෙන ගුප්ත රජසමයේ සාංචි තොරණ අසල ප්‍රතිමා සතරක් මහා විහාරය අසල විහාරගෙය හා ගරාදි වැටවල් ඉදිකොට ඇත.

ශතවර්ෂ 14-19 අතර කාලවකවානුවේදී සාංචියට එල්ලවුණු සතුරු ආක්‍රමණ ආදිය නිසා පුදබිම කාලයාගේ අවෑමෙන් කැලයෙන් වැසී ගොස් ඇත.

1818 දී බ්‍රිතාන්‍ය ජාතික ජනරලා් ටෙල් මහතාගේ සංචාරයෙන් පසු, සාංචි පුදබිම පුනරුත්ථාපනය කිරීමට කටයුතු සලසා ඇත. 1851 දී පැමිණි බ්‍රිතාන්‍ය ජාතික කනින්හැම් පුරාවිද්‍යාඥයා විසින් ද මෙහි පුනරුත්ථාපන කටයුතු සිදු කොට ඇත. වර්ෂ 1861 දී ඉන්දියාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව නැවත සාංචි පුදබිම සංරක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට පදනම දැමූ සාංචි පුදබිම ශ්‍රී ලාංකික බෞද්ධයනට ඉතා වැදගත් වේ. තුන්වන ධර්ම සංගායනාව පවත්වා රටවල් නවයකට ධර්ම ප්‍රචාරය කරන ලදී. එහිදී ශ්‍රී ලංකාවට බුදු දහම වැඩම කිරීම, මිහිඳු මාහිමියන්ගේ මූලිකත්වයෙන් සිදුවිය. ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට විශේෂ දායකත්වයක් සිදු කළ මිහිඳු මහ රහතන්වහන්සේ හා සංඝමිත්තා තෙරණිය ද අවන්ති දේශයේ සිට එම කාර්යයට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ.

**චචින්ද්‍රා වෛද්‍යරත්න**



# මිනිස් ඇසට නොපෙනෙන ලෝකය

**කෝටි** සංඛ්‍යාත සත්ව වර්ගයා අතරින් විශ්ව යථාර්ථය අවබෝධ කර ගැනීම හා එහි පවත්නා ස්වභාවය හඳුනා ගනිමින් එය තම වර්ගයාගේ සහ විශ්වයේ ඉදිරි පැවැත්මට උපයෝගී කර ගන්නා එකම සත්ව විශේෂය දීහෝමෝ සාපියන් හෙවත්, දීමානවයාය. ඔහු ආරම්භයේ පටන් මෙ දක්වාම මේ වෙනුවෙන් ගන්නා ලද උත්සහයන්ගේ ප්‍රතිඵල වශයෙන් ආගම, දර්ශනය, විද්‍යාවන් වැනි විෂයානුබද්ධ දැනුම සම්භාරයන් මෙන්ම නේක විද තාක්ෂණික මෙවලම් ද ගණනින් කියා නිමකළ නොහැකි සංඛ්‍යාවක් ව්‍යවහාරයට එකතු කරගෙන තිබේ. මිනිසාගේ ඉදිරිපැවැත්ම හා අභිවෘද්ධිය සඳහා හේතුවන කාර්යක්ෂමතාව, ඵලදායිතාව, දෛනික කටයුතු පහසු කර ගැනීම් මෙන්ම විශ්ව ව්‍යාප්තව පවතින සම්පත් ප්‍රයෝජනයට ගැනීම වැනි බහුවිධ අරමුණු එම සොයා ගැනීම් වලට පාදක වී තිබෙන බව කිව යුතුයි. ස්වභාව ධර්මයා විසින් නිමවන ලද දෙයට පරිබාහිර වු යමක් විශ්වයේ පවතීද, එවා මිනිස් නිමැවුමයි. මිනිසා තුළ ඇති නිර්මාණාත්මක බව බුද්ධියෙන් අනූන බව මෙන්ම උසස් චින්තනයද ඊට හේතුවී තිබේ. මානව විද්‍යාඥයින් මනෝ මෙන්ම ජීව විද්‍යාඥයින් පිළිගන්නා පොදු සත්‍යයක් නම් කාලානුරූපව මිනිසාගේ බුද්ධිමය ශක්‍යතාවයන් වර්ධනය වන බවයි. ඔගස්ට් කොමට් නම් ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයා පෙන්වා දී ඇත්තේ මානව සමාජයේ ගමන් මග වෙනස් කළ ග්‍රාහක බලවේගය මිනිසා බුද්ධිමය වශයෙන් සංවර්ධනය විම බවයි. **Interlectual Development** බ්‍රිතාන්‍ය ජාතික හර්බට් ස්පෙන්සර් ද මිනිස් සමාජයේ ප්‍රගතිශීලි වෙනස් වීම මිනිසා තුළ ඇති අතෘප්තිකර ආශාව නිසා සිදුවන බව ප්‍රකාශ කර තිබේ. මෙයින් අදහස් කරන්නේ මිහිමත විද්‍යමාන වන ජීවි අජිවී සෑම දෙයක්ම ස්වභාවික හෝ මිනිස් නිමැවුමක් බවයි. මිනිසා මනසින් ද ලෝකය දකින සත්වයෙකි

ස්වභාවික නිර්මානයේ යථාස්වභාවය දැකීමට තරම් බුද්ධියක් ඇති එකම සත්වයා ද වේ. විශ්වයේ පැවැත්මට ඉවහල් වන සියලු ක්‍රියාකාරකම් මෙහෙය වීමේ බලධරයා ස්වභාව ධර්මයාය. ස්වභාවික වර්ණවාදය තුළින්ද මේ අදහස ගම්‍යවේ. ලොව මෙතෙක් බිහිවු ආගමික ශාස්තෘවරුන් දාර්ශනිකයන්, චින්තකයන්, බුද්ධිමතුන්, විද්‍යාඥයින් සිය බුද්ධිය මෙහෙයවා පර්යේෂණාත්මක විමසා බැලීම් තුළින් ද උත්සහකර තිබෙන්නේ විශ්වයේ යථාර්තය පසක් කර ගැනීමටයි මෙහිදී ආගමික ශාස්තෘවරුන් හා දාර්ශනිකයන් මේ වෙනුවෙන් කරන ලද බුද්ධිමය දායකත්වය සුවිශේෂී තැනක් ගනී. ඒ හේතුවෙන් ඔවුන් ලෝකය පසක් කර ගත් අකාරය අනුව ලෝකය දකින එම දර්ශනය තුළින් ජීවිතය හැඩගස්වා ගත් අනුගාමිකයන් කෝටි සංඛ්‍යාත පිරිසක් ලෝකය තුළ වසර දහස් ගණනක් ජීවත් වේ. බුදුන්වහන්සේගේ දර්ශනය පිළිගත් පිරිස බෞද්ධයන් ද ජේසුතුමන් අනුව යන පිරිස කිතුනුවන්ද ඉස්ලාම් භක්තිකයන් මහමද්තුමාගේ දෘෂ්ඨියෙන් ලෝකය දකින්නන්ය. මෙවැනි මතවාද තුළින් ලෝක යථාර්තය දකින අතරම මේ සඳහා මිනිසා ගත් උත්සාහයේ තවත් ප්‍රථිපලයක් ලෙස ඔහු ලබන බුද්ධිමය සංවර්ධනයේ ඉදිරි පියවරක් නැතිනම් අග්‍රඵලය ලෙසින් 14 වන සියවසේ බිහිවූ විද්‍යාත්මක චින්තනය නම් කළ හැකියි. සත්‍ය දැනුම මත පදනම්ව වාස්තවික සංසිද්ධි ඇසුරෙන් හේතුඵලවාදීව විද්‍යාත්මක ක්‍රමවේදයක් තුළින් ලෝකය තේරුම් ගැනීම විද්‍යාවේ ඇති විශේෂත්වයයි. මානව ශිෂ්ටාචාරයේ ගමන් මග විප්ලවීය වෙනසකට භාජනය කරන විද්‍යාව පසු ගිය සියවස් 07ක කාලය තුළ මිනිසාට ලෝකය නිවැරදිව දකින්නට ආලෝකයක් සපයා තිබේ. භෞතික ලෝකයේ යථා ස්වභාවයත් සමාජ පරිසරය හා බැඳුණු ගති ලක්ෂණත් පවත්නා සැටියෙන් පෙන්වා දෙන්නට ශුද්ධ විද්‍යාවන් හා සමාජීය විද්‍යා වශයෙන් කොටස් දෙකක් ව්‍යවහාරයේ පවති. ආගමික ශාස්තෘවරුන් දාර්ශනිකයන් මෙන්ම විද්‍යාඥයින්ද මේ වන විට විශ්වයේ පවතින බොහෝ දේවල් තේරුම් ගෙන තිබෙන බව කිව යුතුයි. එසේම හඳුනාගත යුතු දේවල් ද පවති. විශ්වයේ යථා ස්වභාවය විමසා බලන විට එහි සැකැස්ම පැවැත්ම ක්‍රියාකාරීත්වය ආරම්භය අවසානය ජීවි අජිවි වස්තු වල සැකැස්ම හා ක්‍රියාකාරීත්වය නිවැරදි ලෙස තේරුම් ගතයුතුවේ. විද්‍යාව බොහෝ දුරට වාස්තවික සංසිද්ධි හෙවත් පංච ඉන්ද්‍රියන්ට ගෝචර වන දේවල් කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබේ. විශේෂයෙන් ග්‍රීසිය මුල්කරගත් බටහිර විද්වතුන් භෞතික ලෝකයේ යථා ස්වභාවය හඳුනා ගන්නට වැඩි අවධානයක් යොමු කරන අතර පෙරදිග ලෝකයේ නියෝජනය කරන බුද්ධිමතුන් එයින් ඔබට පියෙවි ඇසට යොමුවන භෞතික ලෝකයේ ග්‍රහනය කර ගැනීමට යත්න දරණ බව එම ආගම, දර්ශන තුළින් මොනවට පැහැදිලි වේ. භෞතික හා අභෞතික වශයෙන් ලෝකය ප්‍රධාන කොටස් දෙකක් හඳුනාගත හැකිවේ. එයින් භෞතික ලෝකයට පංච ඉන්ද්‍රියන්ට ගෝචර වන සියලු ද්‍රව්‍යාත්මක දෑ ඇතුළත් වේ. අප අවට ලෝකයේ ඇති ගස්, ගල් ආදී වශයෙන් ගැනෙන සියලු ද්‍රව්‍යාත්මක දේවල් ඊට ඇතුළත්වේ. විශ්වයේ පැවැත්මට සහ ජීවමය දේවල්වල පැවැත්මට උපකාරි වන ශක්තීන්ද පවති. උදාහරණ වශයෙන් සිත, සිතුවිලි, බුද්ධිය, ආකල්ප, පිං, පව්, කර්මය, දේව නියමය, පුනර්භවය, ආත්මය, වැනි දෑ ඊට ඇතුළත් වේ. මෙම අභෞතික ලෝකය නිවැරදිව හඳුනා ගැනිම භෞතික තරම් පහසු නොවේ.

භෞතික ලෝකයෙන් පරිබාහිර වු මෙවැනි අභෞතික ලෝකයක් පවතින බව ඈත අතිතයේ පටන්ම මිනිසා විශ්වාස කළ බවට සාක්ෂි හමුවේ. මානව ශිෂ්ටාචාරයේ මුල්ම අවධියේ මිනිසා විශ්වාස කළේ අවට පරිසරයේ සදුවන බොහෝ දේවල් අධි භෞතික බලවේග විසින් මෙහෙය වන බවයි. නමුත් බුද්ධිමය වශයෙන් දියුණු වීමත් සමඟ මිනිසා තුළ ඇති තාර්කික හැකියාව වර්ධනයත් සමඟ අවට ලෝකයේ සිදුවන දේවල් ස්වභාවික සංසිද්ධි මත තීරණය වන බව ප්‍රත්‍යක්ෂ කරගනි. විශ්ව යථාර්තය හඳුනා ගැනිමේ හැකියාව ඇති බුද්ධිමතුන් ඉතිහාසය පුරා හමුවේ. ඒ අය අතර විශ්වයේ ඇතැඹුලක් සේ දකින ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුද්ධඥානයට හසු නොවන දෙයක් නොමැති තරම් මිනිසාගේ අධ්‍යාත්මික අංශයේ හදුනා ගැනීම අතින් උන්වහන්සේ සියලු මිනිසුන් අභිබවා සටි. චිත්ත, චෛතසික, නිබ්බාන යන අද්‍යාත්මික ගති ලක්ෂණ විග්‍රහ කරන අභිධර්මය ඊට නිදසුන් සපයයි. දීමනෝ පුබ්බංගමා ධම්මාං සියලු මිනිස් ක්‍රියාකාරකම් වලට මනස මුල්වන බවත් දීචිත්තං පුනාතිතී පුඤ්ඤං චේතනාහං භික්කවේ කම්මං වදාමි" වැනි ප්‍රකාශන තුළින් අභෞතික ලෝකය පිළිබඳ උන්වහන්සේ දේශනාකළ කරුණු තහවුරු වේ. ත්‍රිපිටකයේ එන බොහෝ සූත්‍ර ගත කරුණු වලින් බුද්ධ ඥානයට හසු වු අභෞතික ලෝකය ප්‍රකාශවේ. විශ්වයේ ඇති අනිත්‍ය බවත් එහි ඉමක් කොනක් ආරම්භයක් අවසානයක් පුහුදුන් සිතකට අවබෝධ කොට ගැනීම දුෂ්කර කරුණක් බව බුදුන්වහන්සේ විසින් පෙන්වා දී තිබේ. ජීවන දර්ශනයක් ලෙසින් සැළකෙන බුදු දහම අදටත් බටහිර ලෝකයේ බුද්ධිමතුන්ගේ සම්භාවනාවට පත් වී ඇත්තේ විශ්ව විශ්ව යථාර්තය හඳුනා ගන්නට බුදු සමයෙන් ලැබෙන මඟ පෙන්වීම නිසායි. ලෝකයේ බොහෝ ආගම් දර්ශන විමසා බැලීමෙන් පැහැදිළිවන කරුනක් නම් මිනිසාගේ ආධ්‍යාත්මික අංශය මෙන්ම නොපෙනෙන ලෝකය විග්‍රහකරන බුද්ධිමතුන් අතර බුදුන් වහන්සේ ඉදිරියෙන් සිටින බවයි. ඍෂි වරුන් ලෙසින් සැළකෙන ඉන්දියානු පැරණි බුදධිමතුන් ද අචින්ත්‍ය වූ විශ්වයේ ග්‍රහ ලෝක වල පිහිටීම ඒවා මිහිමත ජීවත් වන සත්ව කොට්ඨාශ වලට මෙන්ම භෞතික දේවල් වලට ඇති කරන බලපෑම් ජ්‍යොතිශ්‍යය විසින් විග්‍රහ කර තිබේ. විද්‍යාව භෞතික ලෝකය යථා වු පරිද්දෙන් තේරුම් ගැනීමට අදාළ විද්‍යාත්මක ක්‍රමවේදයන් ගොඩනගා ගෙන තිබේ. නමුත් පංච ඉන්ද්‍රියන්ට හසු නොවන වාස්ථවික නොවන ලෝකය ගැනීමෙහිලා ප්‍රමානවත් අවධානයක් යොමුනොකරන බව බව කිව යුතුයි.

නිවන යනුවෙන් අදහස් කළේද එයයි. මෙම ප්‍රකාශණය ලොව බිහිවු බොහෝ දාර්ශනිකයන් බුද්ධිමතුන් විද්‍යාඥයින් පොදුවේ පිළිගන්නා න්‍යායාත්මක සත්‍යයකි විද්‍යාත්මක චින්තනය උපයෝගී කොට ගෙන චාල්ස් ඩාවින් පරිණාමවාදය තුළින් පෙන්වා දේන්නේද එම සදාතනික සත්‍යයයි. පංච ඉන්ද්‍රියන්ට හසුකර ගතහැකි ද්‍රව්‍යාත්මක දේවල් වල ස්වභාවය මිනිස් බුදධිය විසින් වැඩි කලක් යන්නට මත්තෙන් අවබෝධ කර ගන්නා ලදි.

ග්‍රීසිය මුල් කරගත් බටහිර ආගම්, දර්ශන, එම සියලු ශක්තීන්ට යොදෙන පොදු නාමය දේව නියමයයි. ලොව මෙතෙක් බිහි වු ආගමික ශාස්තෘවරුන් 90% ක්ම අසීමාන්තික බලයකින් යුතු දෙවියෙකු විසින් ලෝකය පාලනය කරන බව විශ්වාසකරයි. ඔහුගේ කැමැත්ත අනුව සියල්ල තීරණය වන බව පිළිගැනිමයි. කතෝලික ඉස්ලාම් වැනි ආගමික දර්ශන පරීක්ෂා කිරීමෙන් එම අදහස තහවුරු වේ. දෙවියන් විසින් ලෝකය මැවු බවත් එහි ක්‍රියාකාරීත්වය ඔහුගේ කැමැත්ත අනුව තීරණය වන බවත් පිළිගැනීමයි. එය පිළිගන්නා කෝටි සංඛ්‍යාත අනුගාමිකයින් ඒ අනුව ක්‍රියා කරයි. මිනිස් ජීවිතය හා එහි පැවැත්ම ක්‍රියාකාරීත්වය ද තීරණය කරන්නේ එම දේව බලවේගය විසිනි. ලෝකය මහා බ්‍රහ්මයාගේ නිමාවක් බව හින්දු ආගමික විශ්වාසයයි. ලෝකයේ සෙසු සෑම ආගමකම අධි භෞතික ජීවීන් සථාන සහ ශක්තීන් පිළිබද ප්‍රකාශවේ. සමාජ විද්‍යාත්මකව එම අධි භෞතික බලවේග සමාජ පාලනයට බෙහෙවින්ම උපකාරී වන බව පිළිගැනීමයි දෙවියන් යක්ෂයන්, භූතයන්, හොල්මන්, සාතුන් වැනි අධිභෞතික ජීවීන් මෙන්ම අපාය දිව්‍ය ලෝකය වැනි අධිභෞතික ලෝක සහ කර්මය පිං පව්, කුසල්, අකුසල් දේව නියම විශ්ව ශක්තිය වැනි අධිභෞතික ශක්තීන් පිළිබඳ මිනිසුන් අතර විශ්වාසයක් පවති. මිනිසාට වඩා එම බලවේගය ශක්තිමත් බවත් ලෝකය සියලු දේවල් තීරණය කරන්නට එම බලවේග වලට හැකියාව ඇතැයි ද ඒවා පාලනය කර ගැනීමට මිනිසාට ශක්තියක් නැතිබව විශ්වාසයයි. නමුත් කාල් මාක්ස් සඳහන් කරන්නේ මේ සියලු බලවේග වලට වඩා මිනිසා ප්‍රබල බවයි. මිනිස් චින්තනය, ශක්තීන් නිර්මාණාත්මක හැකියාවන් උපයෝගී කොටගෙන මිනිසා විසින් සංකල්පමය වශයෙන් මේවා නිර්මාණය කොට ඇති බවයි.

මෙම බලවේග පිළිබඳ විශ්වාස මිනිසා පරාරෝපනයට ලක්කරන බවයි මිනිසා තුළ ඇති දේශපාලන බලය ජනතා නියෝජිතයන්ට ඡන්දයකින් ලබා දී ඔවුන් වෙතින්ම තම ආරක්ෂාව තමාට කර ගත නොහැකි දේවල් සපුරා ගන්නේ යම් සේද මිනිසා විසින් මිනිස් වෙසින්ම නිර්මාණය කරගෙන ඇති බලවේග වලින් පිහිටාධාර අපේක්ෂා කරයි. දෙවියන් මිනිසාගේ පැහැපත් ශක්තිමත් උපාංග එක් කිරීමෙන් ගොඩ නගා ඇති බවත් ඒ තුළින් මිනිසාට පිහිටාධාර පැතීම සිදුවේ. මිනිසාගේ යහපත සාධනයට දේව බලවේග ක්‍රියාත්මක වන අතර අනර්ථකාරී ක්‍රියාකාරකම් වලට දරුණු භයානක විකෘති මිනිස් වේශයකින්ම නිර්මාණය කරගෙන ඇති යක්ෂයින්, භූතයින්, හොල්මන්, ප්‍රේත පිසාච, කුම්භාණ්ඩ බලවේග

06 පිටුවෙන්...

# බුදුබණ ඇසීමද භාවනාවකි




අප තිලෝගුරු භාග්‍යවත් සම්‍යක් සම්බුදුරාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කළා වූ ශ්‍රවණය කිරීම නිර්වාණාවබෝධයට පිවිසීමේ මූලික මාර්ගයක් නිසා ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම

බුදුදහමේ ඒකායන බලාපොරොත්තුව වන්නේ, නිවන අවබෝධකර ගැනීමයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් දෙරටු පහකි. එම දොරටු පහ 'විමුක්තායතන ශීර්ෂ පංචකය'ලෙස හඳුන්වා දී ඇත. විමුක්තිය යනු 'නිවන' හැඳින්වීමට යොදන නමකි. ආයතන යනු කාරණයට නමකි. ශීර්ෂ යනු මාතෘකාවයි. පංචකය යනු පහ යන සංඛ්‍යාවයි. මෙලෙස නිවනට පිවිසීමට හේතුවන කරුණු පහක් ඇති අතර ඒවා ශීර්ෂ පංචක නමින් හඳුන්වනු ලැබේ.

ධර්ම දේශනය සිදුකරනු ලබන දේශකයාණන්වහන්සේටද එම දේශනය නිවන් දෙරටුවක් වේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළේ **"න බො ආනන්ද සුකරං පරෙසං ධම්මො දෙසෙතුං"** ආනන්දය, අන්‍යයන්ට දහම් දෙසීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බවයි. කරුණු පහක් සිත්හි ධාරණය කොට ගෙන ධර්ම දේශනාව සිදුකළ යුතුව ඇත.

ඈත අතීතයේ බුදු දහම ප්‍රචලිතව පැවති යුගවල පවා ධර්ම දේශකයන් වහන්සේලා බහුල වශයෙන් නොසිටි බව අනුමාන කළ හැක. මක්නිසාද යත් බුදු බණ දේශනා කිරීම අමාරු කාර්යයක් නිසාවෙනි.

ලක්දිව පුරා දක්ෂ ධර්ම කථිකයන්හට රාජ්‍ය අනුග්‍රහය පවා ලබාදුන් අයුරුද විශේෂ පුදපූජා පැවැත්වූ අවස්ථාද වංශකථාවන්හි සඳහන්වේ.

ධර්මදේශනා කිරීමේ ඇති උසස් බව, දුෂ්කර බව, දුර්ලභ බව ඇසූ දුටුගැමුණු මහරජතුමා ලෝවාමහාපායෙහි මහරහතුන් මැද සංඝයා දකීමෙන් ඇති වූ තැති ගැන්ම නිසා බණකීම පසෙක තබා නමස්කාර පාඨයෙන් දේශනාව නවතා ඇති බව ඉතිහාස කථාවල සඳහන්වේ. අනුන්ට ධර්මය දේශනා කිරීම පහසුකාර්යයක් නොවේ. ඒ සඳහා පෙළ අටුවා පිළිබඳ දැනුම, වියත් බව, කථිකත්වය යනාදි සුදුසුකම් රැසක් අවශ්‍යය. ශ්‍රී ලංකාවේ වැඩ සිටි මලියදේව මහරහතන් වහන්සේ මෙලෙස රහත්භාවයට පත්වූයේද එලෙස සුදුසුකම් රාශියක් සපුරාලීමෙනි.

ධර්මදේශනය සිදුකරන අවස්ථාවේදී මාර්ගඵල නොලැබුවත් භාවනාවක් වශයෙන් ධර්මය දෙසීමෙන් සහ ඇසීමෙන් ප්‍රඥා පාරමිතාව සම්පූර්ණ කිරීමටත් එමගින් මාර්ගඵලයන්ට පත්වීමටත් හැකියාව ඇත.

ධර්මශ්‍රවණය හෙවත් බුදුබණ ඇසීම සිදුකළ හැක්කේ භාවනාවක් වඩන ආකාරයටයි.

**"අට්ඨිකත්වා මනසිකත්වා**
**සබ්බචෙතසො සමන්නාහරත්වා**
**ඔහිත සොතො ධම්ම සුනාති"**

කල්ප කෝටි ශත සහශ්‍ර ගණනාවකින් මෙලෙස බුදුබණ පද අසන්නට නොලැබේ. මේ උතුම් වූ ධර්මය ඇසෙන මට ලොව්තුරු සැප සිද්ධ වේවා. ඒකාන්තයි. යනුවෙන් සිතා ධර්මය ශ්‍රවණය කිරීමේ බලවත් කැමැත්තෙන් බණ ඇසිය යුතුයි.

දම්සක් සූත්‍ර දේශනාව අවසානයේදී දහඅටකෝටියක් බ්‍රහ්මයන් රහත්භාවයට පත්වූහ. කොණ්ඩඤ්ඤ හිමියන් ඇතුළු පිරිස සෝවාන් ඵලයට පත්වූහ. මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාව අවසානයේදී තිස්දහසක් භික්ෂූන්වහන්සේලා රහත්භාවයට පත්විය. චක්කවත්ති සූත්‍ර දේශනාව අවසානයේ භික්ෂූන්වහන්සේලා විසිදහසක් රහත් භාවයට පත්විය. පරාභව සූත්‍රය, මහාමංගල සූත්‍රය, බුද්ධවංශ දේශනාව ආදී දේශනාවන්හීදී දසලක්ෂ ගණන් පිරිස් මෙන්ම බොහෝ ධර්මදේශනා අවසානයේදී අයෙක් හෝ කිහිපදෙනෙක් නිවන් අවබෝධකරගත්හ.

මනාලෙස ධර්ම දේශනා කිරීමෙන් සහ ශ්‍රවණය කිරීමෙන් සිත සමාධිගතවීම, දහම්පද අමතක නොවී සිතට ඇතුළුවීම සහ දහම්පදයන්හි අර්ථය හොඳින් තේරුම් ගැනීමට හැකියාවද ලැබේ.

බෞද්ධයාගේ ඒකායන පරමාර්ථය වන නිර්වාණාවබෝධය සඳහා ඇති මාර්ගයක් වන දහම් දෙසීම සහ දහම් ඇසීම හුදු චාරිත්‍රයකට පමණක් සීමා නොකොට ආර්ථික ලාභ අපේක්ෂාවෙන් තොරව කරුණාවෙන් දහම් දෙසීමත් බුද්ධිමත්ව දහම් ඇසීමෙන් අප බලාපොරොත්තුවන රහත් බෝධිය, පසේබෝධිය, අභිසම්බෝධිය යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පත්වීමෙන් ලැබෙන සතර මඟ පිළිවෙළින් අවබෝධවී ශාන්ත අමාමහ නිවන්සුව සාක්ෂාත් වේවා.

**"මනාලෙස ධර්ම දේශනා කිරීමෙන් සහ ශ්‍රවණය කිරීමෙන් සිත සමාධිගතවීම, දහම්පද අමතක නොවී සිතට ඇතුළුවීම සහ දහම් පදයන්හි අර්ථය**

මෙත්තානි අසේකා මෙහෙණින් වහන්සේ

## 05 පිටුවෙන්

සුප්‍රසිද්ධ කවියෙකු වු විමලරත්න කුමාරගම දේශිය ජන ජීවිතය හා බැදුණු දේව විශ්වාස සිය අයියනායක කවි පන්තියෙන් මෙසේ පෙන්වා දී තිබේ.

සෙවනැලි අවධි නොම වන ඉවුරු කොනේ
කාලය විසින් හැරූව නුග ගසක බෙනේ
මලකා කළුව ගිය ආයුධ කැබලි පෙනේ
දෙවියෙක් නැත්ද මෙහි බලයක් තිබෙනු දැනේ

වන ඇතු කඩා ගස් දෙබලක දැවටීම
මා නොකෙරුවත් නොකළෙමි එය ගැරහීම
එන මේ පිරිස සැරසීමට නුවණ මලින්
පෙළඹෙන අයට අනුකම්පා කරමි

මුලින් දෙවියන් පිළිබඳ ඇති භක්තිය එයින් ජනතාව අපේක්ෂා කරන පිහිටාධාර එම බලවේග වල යථාස්වභාවය මැනවින් ප්‍රකට කරන සාහිත්‍ය නිර්මාණයක් වශයෙන් මෙම කවි පන්තිය සාක්ෂි සපයයි. සමාජය සංකීර්ණ වනවාත් සමඟම මිනිසුන්ට මුහුණ දෙන්නට සිදුවන ගැටලු ප්‍රශ්ණ අභියෝගද වැඩිවේ. ඒවායෙන් මිදීමට ආරක්ෂාවට අධිභෞතික බලවේග වල පිහිටාධාර පැතීම දිනෙන් දින වැඩි වන බවත් දැක ගත හැකිය දේවාල සහ මෙවැනි ගුප්ත බලවේග ඇති බවට විශ්වාස කරන තැන්වලට ඇදී එන ජනතාව දිනෙන් දින වැඩි වන බවත් එය ව්‍යාපාරයක් කරගන්නා කූට පුද්ගලයන් කරන සමාජ විරෝධී ක්‍රියා නිසා අද වන විට විවිධ සමාජ ගැටලු ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වී ඇති පසුගිය මාසයේ සිදු වු සෙනසුරු මාරුව කෙරෙහි සමාජය යොමුකර තැබූ අවධානයෙන් ද මේ අදහස තහවුරුවේ.

දේව බලවේග මෙන්ම මිනිස් ජීවිතය කෙරෙහි තීරණාත්මක ලෙස බලපාන අධිභෞතික ශක්තීන් පිළිබඳවද මිනිසුන් තුළ විශ්වාසයක් පවතී. බෞද්ධ සහ ජෛන වැනි පෙරදිග දර්ශන තුළින් විශ්වයේ ක්‍රියාකාරිත්වය හා බැදුණු ජීවින්ගේ ඉපදීම ජීවත්වීම, මරණය, ඉන්මතු ජීවිතය තීරණය කරන බලවේග ශක්තිය කර්මය යනුවෙන් හදුන්වයි. මිනිසා විසින් කරනු ලබන ක්‍රියාකරකම් වලදී මිනිස් සිත තුළ ජනිත වන ශක්තියයි. සමාජ හෝ භෞතික පරිසරයේ පැවැත්මට හානිකර දායි කිසියම් චර්යාවක නියැලෙන විට පුද්ගල චිත්ත සන්තානයේ පව් හෙවත් අකුසල් මූලයන් ජනිත වේ. අකුසල් පුද්ගලයා දුගතියකරා ගෙන යෑමට හේතු වන අතර සිතේ සතුට තුළින් ඇති වන ශක්තිය පිං වශයෙන් සැළකෙයි මිනිසාගේ මෙලොව පරලොව ජීවිත සැපවත්ව සාර්ථකව ගත කරන්නට ඒවා උපකාරීවේ. පුනර්භවය හෙවත් නැවත ඉපදීම පිළිබඳ සෑම ආගමකින්ම ඉගැන්වේ. විද්‍යාවද අද වන විට මෙහි සත්‍ය අසත්‍යතාව විමසා බලමින් සිටී. පොදුවේ ගත් කළ සෑම ආගමකින්ම භෞතික පරිසරය හා මානව පරිසරය මැනවින් පවත්වා ගෙන යෑමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරයි පිං පව්, හොද නරක දේව නියමය, සාතන් දිව්‍ය ලෝකය අපාය යන සංකල්ප වලින් සාකච්ඡා කරන්නේද එකම පොදු සිද්ධාන්තයකි. මිනිසා සැප විදීමට කැමති නිසා ස්වර්ගය, දිව්‍ය ලෝකය වැනි සැප ඇති අධි භෞතික ලෝක පිළිබඳ පෙන්වා දෙන අතර සමාජ අපගාමී ක්‍රියාවන් තුළින් අකුසල් නිර්මාණය වීම හරහා අපාය සාතන් වැනි දුක් ඇති ස්ථාන වල දුක් විදීමට සිදු වන බව විශ්වාස කරයි. දිව්‍ය ලෝකය ඇති සැප සහ අපායේ ඇති දුක් පරීක්ෂා කිරීමෙන් මේ අදහස තව දුරටත් තහවුරු වේ.

භෞතික දේවල් මිනිසාගේ පැවැත්මට උදව් වන්නේ යම් සේද මෙවැනි අභෞතික දේවල්ද මිනිසාගේ හා සමාජයේ පැවැත්මට කිසියම් වූ සේවාවක් ඉටු කරන බව කිව යුතුයි. බුද්ධිමය සංවාදයකට ඉඩ කඩ විවර කරමින් මාගේ පෞද්ගලික මතය විවිධ සංකල්ප ඔස්සේ විග්‍රහ කරන අධි භෞතික බලවේග හා ශක්තීන්ට දිය හැකි පොදු නාමය විශ්ව ශක්තිය බවයි. පුද්ගලයා විශ්ව ශක්තිය සමඟ සම්බන්ධ වීමේ ප්‍රමාණය මත ඔහුගේ ජීවිතයේ සැප දුක් සාර්ථක අසාර්ථක බව තීරණය වන බවයි.

සමාජ විද්‍යා ආචාර්ය එම්.එම්.සෙනවිරත්න
ඇක්වයිනාස් විශ්ව විද්‍යාලය
බොරැල්ල



# ථේර ථේරී ගාථා

"පාප මිත්‍රයන් හැර දමා උත්තම පුරුෂයන් ඇසුරු කරමින්ද ඔවුන්ගේ ඔවදන් පිළිගෙන සිටිමි. කුඩා දඬු කඩකට නැග යම් සේ මහා සයුරෙහි ගිලෙන්නේද එබඳු පාපීන්ගෙන් වෙන් වීමි. කුසීත වූ හීන වීර්ය ඇත්තා වූ දුරලමින් කාය විවේක ඇති නිවනට යැවූ සිතැතිව ධ්‍යාන වඩන සුළු නුවණැතියන් හා එක්ව විසීමි. ජීවිතයේ ලද උසස්ම සැනසීම මේ යැයි උන්වහන්සේ නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කළහ."

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙදහස් පන්සියයක් ඉකුත් වූ පසු ලක්දිව දියසේන නම් කාරුණික මහා පුරුෂයෙකු ඉපදීමෙන් පෙර නොවූ විරූ ආගමික, සාමාජික හා ආර්ථික පුනරුදයක් ඇති වේයැයි ලංකාවාසීහු සියවස් ගණනාවක් තිස්සේ අපේක්ෂා කළහ. කෝට්ටේ යුගයේදී ලියන ලද පැරකුම්බා සිරිතෙහි සඳහන් වන,

**"කියග මගිය එනු කොහි සිට ? සමනොල ගොසිනා නොය කිය මුතු එදිගැ බමුණු සුමණ සුරිඳු විසිනා ගිය කල දෙදහස් පන්සිය රජෙකු එතැයි දිය නා කියැවි නන් වැසියා එනම් ? "**

පැරකුම්බා රජ මෙදිනා පැදියෙන් එය පැහැදිළි වේ.

ඒ අනුව 2500 යේ බුද්ධ ජයන්තිය නිමිති කර එවක පැවති රජය විසින් 1954-10-12 දින පිහිටුවන ලද බෞද්ධ මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් ත්‍රිපිටක පරිවර්තනය කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී. ඉන්පසු පැවති සෑම රජයක්ම මේ සත් කාර්යයට උර දුන් නිසා 1989-03-31 දින වන විට මුළු ත්‍රිපිටකයම සිංහලයට නගා මුද්‍රණය කොට නිමා කරන ලදී.

ඒ සත් කාර්යයේ ප්‍රතිඵලයක් වශයෙන් කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන්ගෙන් ආරම්භව දහස් ගණනින් පහළ වූ ථෙර ථෙරීන් වහන්සේ මා විසින් මග ඵල සුව සිහි කිරීමෙන්ද සමාපත්ති සුව සිහි කිරීමෙන්ද ලද ශාසනයේ නෛරානිකභාවය සිහි කිරීමෙන්ද ශාසනයේ මිහිර නිරාමිස වින්දනයක් විඳින විරාගී ථෙර ථෙරීන් වහන්සේලා විසින් ප්‍රකාශ කරන ලද ප්‍රීති වාක්‍යයකින් පෘතග්ගජනයන් වූ අපටද දැක බලා ගැනීමේ වාසනාව උදා වී ඇත.

නිපාත වශයෙන් 34කින් සමන්විත මෙම ථෙර ථෙරී ගාථා අතර ගෝතම රහතන් වහන්සේ තම සංසාර ගමනේදී උපන් ජාති භවයන් විස්තර කර ඇත්තේ මෙසේය.

"මම නිරයට ගියෙමි. ප්‍රේත ලෝකයට ගියෙමි. ඉවසිය නොහැකි දුක් ගෙන දෙන නිරයන්ට අයත් යෝනියෙහි ද නොයෙක් අයුරින් බොහෝ කල් ගෙවුයෙමි. මිනිසත් බවද ලැබූ මා නොයෙක් වර කාමාවචර දිව්‍ය ලෝකයටද වරින් වර ගියෙමි. රූපාරූප භවයන්හි මෙන්ම නේව සංඥා නාසඤ්ඤා භවයන්හිද අසඥ භවයන්හිද ඉපදීමි. එමෙන්ම අසාර වූ අස්ථිර වූ හැම කල්හිම කම්පිත වු කාම භවාදී සම්බෝගයෝ මොනවට දක්නා ලදිමි. ආධ්‍යාත්මයෙහි සිහි ඇතිව නිවනට පැමිණියෙමි. "

ඒ වූ අතීතය සිහිපත් කරමින් වර්තමාන ජීවිතයේ කෙතරම් සැහැල්ලුද කෙතරම් සොම්නස් දැයි සිතමින් නිරාමිස ප්‍රීතිය භුක්ති විඳිනා අයුරු උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කර ඇත. එසේම විමල රහතන් වහන්සේද තමා ලත් අති සුන්දර වූ නිවන් සැප ගැන හඳුන්වන්නේ මෙසේය.

"පාප මිත්‍රයන් හැර දමා උත්තම පුරුෂයන් ඇසුරු කරමින්ද ඔවුන්ගේ ඔවදන් පිළිගෙන සිටිමි. කුඩා දඬු කඩකට නැග යම් සේ මහා සයුරෙහි ගිලෙන්නේද එබඳු පාපීන්ගෙන් වෙන් වීමි. කුසීත වූ හීන වීර්ය ඇත්තා වූ දුරලමින් කාය විවේක ඇති නිවනට යැවූ සිතැතිව ධ්‍යාන වඩන සුළු නුවණැතියන් හා එක්ව විසීමි."

ජීවිතයේ ලද උසස්ම සැනසීම මේ යැයි උන්වහන්සේ නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කළහ.

**"නානා ආභරණ වලින් හා අලංකාර වස්ත්‍රවලින් සැරසී අලංකාර මල්දමින් යුත් සඳුන් පැහැයෙන් දිලෙන සිරුරින් නලඟනන් මාවත මැද තූර්ය වාදනය කරමින් නටන විලාසය දුටු මම ඔවුන්ගේ ඒ මාර පාසයෙන් මිදුනෙමියි"** නාගසමාල රහතන් වහන්සේ තමා ලත් ජයග්‍රහණයන් පැහැදිළි කළහ.

එයින් එතුමන්ට යෝනිසෝ මනසිකාර උපන් බව නිර්වාණ ඥාණය ත්‍රිවිද්‍යාව ලත් බවත් නිරාමිස ප්‍රීතිය උද්දාමව ප්‍රකාශ කළ සේක. මේ අයුරින් තම ජීවිතය පිළිබඳව ආපසු හැරී බලන රහතුන් වහන්සේලා සියලු දුකින් මිදී අනන්ත වූ සැනසීමක් ලත් ආකාරය නොයෙක් ආකාරයෙන් ප්‍රකාශ කර ඇත.

**"රන්මුවා අභරණින් සැරසුණු රන්වන් සිරුරු ඇති දාසීන් විසින් පිරිවරන ලද මාගේ පෙර භාර්යාව ඇකයෙන් පුතු වඩාගෙනතුඩ ඇති මොණරාගේ කූජනය කෙතරම් මිහිරිද මනරම්ද මේ මහ පොලවද නිල් තණවලින් හා මනාව පැතිර ගිය දිය දහරවලින් යුත් ඒවා සේම සොදුරු වලාකුළු වලින් අහස මනරම් වී ඇත. එමෙන්ම මනා සිත් ඇති ඔහුට මෙම සෞන්දර්යාත්මක දර්ශනයන් කෙරෙහි සරාගික හැඟීම් වලින් තොරව මනා වීර්යෙන් යුතුව අතිශයින් දැකීමට දුෂ්කර වූ සුදෝ සුදුවන් වු නිවන ස්පර්ශ කිරීමට හැකියාව ඇති බව"**

චූලක මහරහතන් වහන්සේ ප්‍රකාශ කරනුයේ දකින උන්ගේ සිත් සතන් නිවී සැනසේ යන ආකාරයෙනි.

එමෙන්ම පැලලුප් නුවර වැසි චිත්‍ර කතා ආදියෙන් බහුශ්‍රැත වූ යම් ශ්‍රමණ කෙනෙක් වේද ඒ අතරින් මනා වූ ක්ලේශ යුද්ධයෙන්ද ධර්ම ඥානයෙන්ද පුහුණු කළ මග බඹසරින්ද අග්‍රස්ථානයෙහි මම බලසමවත් සුව විඳිමින් බුජ්ජ සෝභිත රහතන් වහන්සේ නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කළහ.

**"සසර පැවැත්මට හේතු වූ පස්කම් සැප ආත්මාර්ථ පරාර්ථය ඇති මා විසින් හෙලාලූහ. සියලු කාමයන් ප්‍රහීන කල මා සියලු භවයෝද නැසුවෙමි. ජාති සංසාරය ක්‍ෂය කලෙමි. මින්මතු ඉපදීමක් මට නැතැයි"** ඉතා සැහැල්ලුවෙන් උත්තරපාල මහ රහතන් වහන්සේ ප්‍රකාශ කර ඇත.

ගයා තීර්ත සමීපයෙහි උතුම් වූ දහම් දේශනා දෙසන මහත් වූ ශරීර ප්‍රභා ඇති ගනාචාර්ය **මා වෙත එළඹියාය. එවිට මට යෝනිසෝ මනසිකාරය ඇතිවේ. ගිහිගෙයි ඇති ආදීනව පහළ වුයෙන් කෙලෙසුන් කෙරෙන් මිදී ත්‍රිවිද්‍යාව ලබා මාර පාසයෙන් මිදි නිවන් අවබෝධ කර ගතිමි. "**

චන්දන මහ රහතන් වහන්සේ නිරාමිස මනසකින් ජීවිතයේ සංසුන් බව නිවී සැනසුන බව ප්‍රකාශ කර ඇත.


නොයෙකුත් බැඳීම්වලින් හා මතිමතාන්තර වලින් වෙලී පැවති එකළ සමාජය ආගමික මත වලින් මෙන්ම කුල අනුව පැවති බෙදීම් වලින්ද නොයෙකුත් ගැහැට විඳිමින් සිට බුදුන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් ලද සහනය කෙබඳුද යන්න මෙම ප්‍රකාශන වලින් මනාව අවබෝධ වේ.

**"මනා සිරු ඇති මනා පිල්කළඹ ඇති මනා නිල් ගෙල ඇති මනා මුව**

12 පිටුවෙන්...

එච්.එම්.පී.හේරත්
මොරගහවැව, විතිකුලිය

# බුදු වදනින් කායිකව නිරෝගි වෙමු



දිනක් බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන අවස්ථාවක එහි වැඩ සිටි ගිරිමානන්ද තෙරුන් වහන්සේ දැඩි ලෙස රෝගාතුර විය. මේ බව ආනන්ද තෙරුන් බුදුරදුන්ට දන්වීමෙන් පසු දස සංඥා ඇතුළත් ගිරිමානන්ද සූත්‍රය දේශනා කළහ. ඉක්බිති ආනන්ද තෙරුන් වහන්සේ එය ඉගෙනගෙන ගිරිමානන්ද තෙරුන් සමීපයට ගොස් මෙම සූත්‍රය දේශනා කිරීමෙන් පසු උන්වහන්සේ සුවපත්වූ බව කියවේ. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන්වන ආකාරයට පුද්ගලයාට හට ගන්නා කායික රෝග රාශියකි.

- ඇස් රෝග
- ශ්‍රවණ රෝග
- නාසා රෝග
- දිවෙහි රෝග
- හිසෙහි රෝග
- කනෙහි රෝග
- මුඛ රෝග
- දත් රෝග
- ක්ෂය රෝග
- පීනස
- දැවිල්ල
- උණ රෝග
- ලේ අතිසාරය
- කොළරාව
- කුෂ්ට
- ශ්වසන රෝග
- අපස්මාරය
- දද
- ගෙඩි
- පණු හොරි
- දියවැඩියාව
- අංශ භාග
- පිළිකා
- භගන්දලා
- කුසෙහි රෝග
- ඇදුම
- සිහි මූර්ජාවීම
- හමේ රෝග
- ගඩු
- කඩුවේගන්

මිට අමතරව බුදුරදුන් මෙහිදි රෝග වැළදීමට හේතු වන කරුණු අටක් ද දේශනාකොට ඇත.

01. ශරිරගත පිත් ධාතුව කිපිමෙන් වැළදෙන රෝග

02. සෙම් ධාතුව කිපිමෙන් වැළදෙන රෝග

03. වාතය කිපිමෙන් වැළදෙන රෝග

04. වා, පිත්, සෙම් යන තුන්දොස් කිපිමෙන් වැළදෙන රෝග

05. ඍතු විපර්යාසය නිසා වැළදෙන රෝග

06. වැරදි කායික ක්‍රියාකාරකම් වලින් හට ගන්නා රෝග

07. අනුන්ගේ උපක්‍රම නිසා හට ගන්නා රෝග

08. කර්ම විපාක අනුව හට ගන්නා රෝග

බුදුරජාණන් වහන්සේ භික්ෂුන් වහන්සේගේ කායික නිරෝගි බවට අදාළ ඖෂධීය ප්‍රතිකාර ද විනය පිටකයේ සදහන් කොට ඇත. ඒ අතර ප්‍රධානතම කාර්යකි පවිත්‍රත්වය. ශ්‍රාවකයන් පිරිසිදුව සිටීමත්, නිතර ස්නානය කිරිමත්, සිවුරු අදන පොරෝන ආදිය පිරිසිදුව තබා ගැනීමත්, මෙහිලා ඉතා වැදගත් වේ. ගිහි පැවිදි කාහට වුවද පවිත්‍රව සිටිමට මෙවැනි ක්‍රියාදාමයන් අත්‍යවශ්‍යය. සිව්පසයට අයත් ගිලන්පස යනු බෙහෙත් හේත් වැළදීමයි. අවේලාවේ ආහාර නො ගන්නා භික්ෂුන් වෙනුවෙන් කැප සරුප්පාන වර්ග වැළඳිය යුතු බව පෙන්වා දි ඇත.

භික්ෂුන් වහන්සේ විසින් සිව්පස පරිහරණයේ දි සිය නිරෝගිබව පිළිබඳ සැලකිළිමත් විය යුතුය. එමෙන්ම සිවුරු පෙරවීම, පාවහන් භාවිතය, ජලය පරිහරණය ආදි සියලු පෞද්ගලික කටයුතු වලදි පවා සෞඛ්‍ය සම්පන්නව ක්‍රියා කළයුතු බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දි ඇත.

කායික නිරෝගිතාව සඳහා අදාළ දෙවන කරුණ මනා පරිසරයක් පවත්වා ගැනීමයි. බුදුරජාණන් වහන්සේ බෝසත් අවධියේ සිටම පරිසරයට ඉතා ලැදිය. උන්වහන්සේ උපත ලැබුවේත් දුෂ්කර ක්‍රියා කළේත් බුදු බව ලැබුවේත් මංගල ධර්ම දේශනය පැවැත්වුයේත් පරිනිර්වාණයට පත්වුයේත් නිස්කලංක පරිසරය තුළය. බුදුරජාණන් වහන්සේ එතරම්ම ගහ කොළ ඇළදොළ කුඹුරු වතුපිටි ගංගා වැලිතලා අතිශයින්ම ප්‍රිය කළහ. එනිසාම පරිසරය ආරක්ෂා කිරිම පිළිබඳ විනය නීතිපනවා ඇත.

- නිල් තණ කොළ මත මළමුත්‍ර බැහැර කිරිම
- තණ කොළමතට කුණුරොඩු දැමීම
- ඉදුල්, හප, ඇට ආදිය දැමීම
- ජලයෙහි මළමුත්‍ර පහ කිරිම
- ජලයට කෙළ ගැසීම

ආදිය තහනම් කරමින් විනය නීති පනවා ඇත. පිරිසිදු ජලය පානය කිරිම සඳහා"පෙරහන් කඩය" අනුදන වදාරා ඇත. එමෙන්ම භික්ෂුන් වහන්සේට අදාළ වතාවත්හි මුළුමනින්ම පාහේ පරිසරය සංරක්ෂණය ක්‍රම අන්තර්ගතය.

- ආගන්තුක වත
- අවාසික වත
- ගමික වත
- හත්තග්ග වත
- වැසිකිළි වත

යනාදිය මීට නිදසුන්ය. කුසගින්න ලොව පවත්නා දරුණුතම රෝගය බව බුදුරදුන් වදාරා ඇත.

"ජිගච්ඡාපරමාරෝගා"

නමුත් මෙම රෝගි තත්වය සමනය කළ යුත්තේ වෙනත් රෝගාබාධයන්ට ඉඩ කඩ සලසා දීමෙන් නොවේ.

එනම් කායික නිරෝගිබව සඳහා වැදගත් තුන්වන කාරණය යෝග්‍ය ආහාර සුදුසු කල්හි ගැනිමයි. භද්දාලි සූත්‍රයට අනුව ආහාරයෙහි මත්තඤ්ඤුතා හෙවත් ආහාරයෙහි පමණ දැන වැළඳීම නිරෝගි දිවියකට උචිත බව පැහැදිළි වේ.

- රෝගාබාධ අඩු බව
- නිදුක්බව
- සැහැල්ලු බව
- කායබලය
- සුවපහසු පැවැත්ම

එම ප්‍රතිඵලයෝය ප්‍රමාණය දැන ආහාර ගැනීම නිසා ආහාර සෙමින් දිරවයි. ඔවුන්ගේ ආයුෂය වැඩෙයි. දුක්වේදනා තුනිවෙයි. මේ බව දෝණපාක සූත්‍රයේ සඳහන්වේ. තවද අවධිමත් ලෙස හා ගිජුලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනෙකු පිළිබඳ බුදුදහමේ සඳහන්වේ.

**ප්‍රමාණය දැන ආහාර ගැනීම නිසා ආහාර සෙමින් දිරවයි. ඔවුන්ගේ ආයුෂය වැඩෙයි. දුක්වේදනා තුනිවෙයි. මේ බව දෝණපාක සූත්‍රයේ සඳහන්වේ. තවද අවධිමත් ලෙස හා ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනෙකු පිළිබඳ බුදුදහමේ සඳහන්වේ.**

**01. ආහාර හත්ථක**
(අනුන්ගේ අත්උදව් නැතිව නැගිටින්නට බැරි තරමට ආහාර ගන්නා තැනැත්තා)

**02. අලංසාටක**
(ඇදුම ඇද ගැනීමටවත් නොහැකි ලෙස ආහාර ගන්නා තැනැත්තා)

**03. තත්වාට්ටක**
(නැගිට ගැනීමටවත් බැරි තරමට කැම ගෙනබිම පෙරළි සිටින තැනැත්තා)

**04. කාකමාසක**
(කපුටෙකුට හොටය දමා ගැනිමට හැකිවන තරමට උගුරට ම පිරෙන ලෙස ආහාර ගන්නා තැනැත්තා)

**05. භුත්තවම්තක**
(ආහාර වමාරා නැවතත් ආහාර ගන්නා තැනැත්තා)

ශිෂ්ට සම්පන්න ලෙසත් සෞඛ්‍ය සම්පන්න ලෙසත් ආහාර ගැනීම සඳහා දේශිත ආචාර ධර්ම "සේඛියා" නමින් විනය පිටකයෙහි සඳහන්වේ.

- න අනාහටේකබළෙ මුඛද්වාරං විවරිස්සා මිතිසික්ඛා කරණියා
(ආහාර ලං කිරිමට කළින්මමුඛයවිවෘත කිරිම)

- න භුඤ්ජ මානෙ සබ්බංහත්ථං මුඛෙ පක්ඛිස්සා මීතිසිකඛා කරණියා (ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරිම)

- න සකබළෙන මුඛෙ නබ්‍යාහරිස්සිමී තිසික්ඛාකරණියා (ආහාර මුඛයේ තිබියදිකතාකිරිම)

- න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමිතිසික්ඛාකරණිා (මුඛයවිවෘත කොට ඒ තුළටආහාරවීසිකිරිම)

- න කබලාවච්ඡේදකං භුඤ්ජිස්සාමීතිසික්ඛාකරණිා (බත්පිඩකටින් කඩ කඩා වැළදීම)

පුද්ගල කායික නිරෝගිබව සඳහා බුදුරදුන් ප්‍රමාණය දැන ආහාර ගැනීම නිසා ආහාර සෙමින් දිරවයි. ඔවුන්ගේ ආයුෂය වැඩෙයි. දුක්වේදනා තුනිවෙයි. මේ බව දෝණපාක සූත්‍රයේ සඳහන්වේ. තවද අවධිමත් ලෙස හා ගිජුලෙස ආහාර අනුභව කරන්නන්

පස්දෙනෙකු පිළිබඳ බුදුදහමේ සඳහන්වේ.

**01. ආහාර හත්ථක**
(අනුන්ගේ අත්උදව් නැතිව නැගිටින්නට බැරි තරමට ආහාර ගන්නා තැනැත්තා)

**02. අලංසාටක**
(ඇදුම ඇද ගැනීමටවත් නොහැකි ලෙස ආහාර ගන්නා තැනැත්තා)

**03. තත්වාට්ටක**
(නැගිට ගැනීමටවත් බැරි තරමට කැම ගෙනබිම පෙරළි සිටින තැනැත්තා)

**04. කාකමාසක**
(කපුටෙකුට හොටය දමා ගැනිමට හැකිවන තරමට උගුරට ම පිරෙන ලෙස ආහාර ගන්නා තැනැත්තා)

**05. භුත්තවම්තක**
(ආහාර වමාරා නැවතත් ආහාර ගන්නා තැනැත්තා)

ශිෂ්ට සම්පන්න ලෙසත් සෞඛ්‍ය සම්පන්න ලෙසත් ආහාර ගැනීම සඳහා දේශිත ආචාර ධර්ම "සේඛියා" නමින් විනය පිටකයෙහි සඳහන්වේ.

- න අනාහටේකබළෙ මුඛද්වාරං විවරිස්සා මිතිසික්ඛා කරණියා
(ආහාර ලං කිරිමට කළින්මමුඛයවිවෘත කිරිම)

- න භුඤ්ජ මානෙ සබ්බංහත්ථං මුඛෙ පක්ඛිස්සා මීතිසිකඛා කරණියා (ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරිම)

- න සකබළෙන මුඛෙ නබ්‍යාහරිස්සිමී තිසික්ඛාකරණියා (ආහාර මුඛයේ තිබියදිකතාකිරිම)

- න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමිතිසික්ඛාකරණිා (මුඛයවිවෘත කොට ඒ තුළටආහාරවීසිකිරිම)

- න කබලාවච්ඡේදකං

15 පිටුවෙන්...

ශාස්ත්‍රපති
බුදුගල සෝමරතන හිමි

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangiriprinters@gmail.com
වෙබ් අඩවිය: www.goldentemple.lk

# "උඳුවප් දායාදයෙන් පාඩම් උගනිමු"

අදින් වසර 2300 කටත් ඔබ්බෙන් දිනෙක උඳුවප් මස පුර පසළොස්වක පෝ දිනක ජය ශ්‍රී මා බෝ සමිඳුන් අප රටට වැඩම කරවන ලදහ.

ලෝක ධාතුවේ පවතින සජීවී ශ්‍රේෂ්ඨ වෘක්ෂයක් මුල් කරගනිමින් එතැන් සිට ශ්‍රී ලංකද්වීපය බුද්ධ, ධම්ම, සංඝ යන තුන් සරණේ ආනුභාවයෙන් උතුම් සංස්කෘතියක උරුමකම් ලද බව ලොවට හඬගා කීමට තවත් උදාහරණ අවැසි නොවෙති.

ශ්‍රී ලාංකීය ජාතියත්, සංස්කෘතියත් ශ්‍රීමා බෝධියත් එකම රන් හුයකින් ඇමිණූ අනර්ඝ මාණික්‍ය රත්නයම වෙති.

දළඳා සමිඳුන් ශ්‍රී ලංකාවට වැඩම කරවන තෙක්ම රාජ්‍යත්වයේ මාහැඟි සංකේතය වූ ජය ශ්‍රීමා බෝධිය, දඹදිව රාජ්‍ය දෙවරක්ද, ශ්‍රී ලංකා රාජ්‍ය තෙවරක්ද වශයෙන් ධර්මාශෝක සහ දෙවන පෑතිස් රජ දරුවන් වෙතින් පිදුම් ලබා ඇති බවද අප මෙනෙහි කළ යුතුව ඇත.

ශ්‍රීමා බෝධිය සමඟින් අපට සංස්කෘතියක්ද, චාරිත්‍ර වාරිත්‍ර රැසක්ද ඥාති සමූහයක්ද නව ජීවන මාර්ග හා සංස්කෘතින ආගමික පූජෝපහාර රැසක්ද ලැබිණි. එසේම නව ඇවතුම් පැවතුම් රටාවක්ද, ජනාවාස සමූහයක්ද අප වෙත දායාද විය. බෝධි පූජාව ඒ අතරින් ප්‍රමුඛ අංගයකි. එය අද පවා ලංකාවේ ගම් නියම් ගම් පුරා පවතින ශ්‍රේෂ්ඨ පුණ්‍යකර්මයකි.

මෙලෙස සැලකූ කළ රටත් එහි සමස්ත රට වැසියනුත්, අප සංස්කෘතියත් ජය ශ්‍රීමා බෝධින් වහන්සේට ණය ගැතිය. ජය ශ්‍රීමා බෝධිය මුල් කොට ගෙන ශ්‍රී ලංකාවේ ආධ්‍යාත්මය සකස් වී ඇතුවා සේම ගම් නියම් ගම් නගර හා පළාත් මට්ටමින් විහිදී ඇති අනේක බෝධි රාජයාණන් වහන්සේලා මුල් කරගනිමින් ගම්මාන දහස් ගණනක ආගමික කේන්ද්‍රස්ථාන ගොඩනැගී ඇති බව පැහැදිළි සත්‍යයකි. ඒ සියල්ල ශ්‍රී ලාංකීය විඥාණයේ මුදුන් මල්කඩ බඳු ආගමික වස්තූන් වී තිබේ. දෛනික ජීවිතය දුක සැප, නින්දා ප්‍රශංසා, ලෙඩ දුක ආදී සියල්ලේම අපේක්ෂාව, සංහිඳියාව මෙන්ම ප්‍රත්‍යක්‍ෂ මාහැඟි ඖෂධය වී ඇත්තේද ශ්‍රීමා බෝධින් වහන්සේමය. කිරි දරුවෙකුගේ පටන්ම නිර්වාණය දක්වා බෞද්ධයින් සියල්ල අපේක්‍ෂා කරන්නේ ඒ වෙතිනි.

මෙසේ බිහිවූ අන් සභ්‍යත්වයක් ලෝකයේ තවත් නම් තිබිය නොහැකිය. අතිපූජනීය ජය ශ්‍රීමා බෝධිය යනු ලෝවැසි බෞද්ධයින්ගේ ප්‍රාණ නාලිය බව ඉඳුරාම කිවහැකිය.

පවුල් ඒකකය ද, ගම ද, නගරය ද, රට ද, රාජ්‍යත්වය ද ගොඩනැගුනේ මේ මඟිනි.

එහෙත් අද වන විට රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, සදාචාරය මෙන්ම දෛනික ජන ජීවිතයම පවා මහා ඛේදවාචකයකට ගොදුරු වූ බවක් දිස්වෙයි. අනන්ත බුදු ගුණ ජය ශ්‍රීමා බෝ සමිඳුන්ගේ ආශිර්වාදයෙන් යළිත් මෙරට තුළ ආගමික, සංස්කෘතික පරිවර්තනයක් සිදුවේවායි ප්‍රාර්ථනා කරමු.

# රාජාවලිය පිළිබඳ විමසුමක්.....

ලක්දිව ඉතිහාසය මෙන්ම සිහළ බසෙහි විකාශය ආදී වූ කරුණු කාරණාවන් සොයා යෑමේදී ඓතිහාසික ග්‍රන්ථ අතුරින් රාජාවලියට හිමි වනුයේ අද්විතීය ස්ථානයක්මැයි. මෙය වූ කලි දඹදෙණි යුගයේ පටන් සම්පාදිත කඩඉම්, විත්ති ආදී ලේඛන සමූහයක් පසුබිම් කර ගනිමින් බිහි වූවකි. විජයගේ පටන් පෘතුගීසී යුගයේ අවසානය තෙක් ලංකා ඉතිහාසය සංක්ෂේපයෙන් දැක් වූ මෙම රාජාවලියෙහි විශේෂත්වය නම් දීපවංශය ආදී ඉතිහාස කෘතිවල නොමැති අමතර කරුණු රැසකින් පූරිත වීමයි. ලංකා ද්වීපය ගැන අඛණ්ඩ ඓතිහාසික වාර්තාවක් සම්පාදනයට තැත් කළ රාජාවලී කතුවරයා ජනප්‍රවාදයේ පැවත ආ පුරාවෘත්තයන්ගෙන් බැහැර වීමට කල්පනා නොකළ බව පැහැදිලි ය.

රාජාවලී නාමයෙන් හැඳින්වෙන ග්‍රන්ථයෝ රැසක් වෙති. මෙය ඇතැම්විට සමකාලීන ලංකාවේ ස්වරූපය විදහාපාන්නක් ද විය හැකිය. නමින් වෙනස්ව පැණෙතත් රාජාවලී නාමයෙන් විවිධ කතුවරුන් විසින් ලියූ ග්‍රන්ථ රැසක් රචනා කර ඇති බව පෙනේ. නමුත් මේ සියල්ල එකම පදනමකින් රචනා වී ඇතැයි සිතීම යුක්ති සහගත ය. ඒවා අතරින්,

වන්නි රාජාවලිය
රාජා වල්ලිය
විජිතවැල්ලේ රාජාවලිය
විජය රාජාවලිය
රාවණා රාජාවලිය
බුද්ධ රාජාවලිය කිහිපයකි.

රජුන්ගේ ආවලිය නොහොත් රාජාවලිය වූ කලි නිශ්චිතවම කතුවරයෙකු හෝ කීපයකගේ බව නිගමනයට අපොහොනා ග්‍රන්ථයක්මැයි. මන්ද එහි ගැබ්ව ඇති කරුණු හා භාෂා විවිධතා නිසැම ය. මෙහි කතුවරයා හෝ කතුවරුන් පිළිබඳ විද්වත් මත රැසක් ද වෙයි. කෙසේ වුවද ලක්දිව ඉතිහාස වාර්තා සම්පාදනයේ විශේෂ ලකුණ වූයේ කලින් කල පුරුකෙන් පුරුක එකට යා වී පූරිත වීමයි.


'සුනාථ සබ්බේ පනිධාය මානසං - වංසා පවක්ඛාමි පරම්පරාගතං
ථුතිප්පසත්ථං බහුනා හිවණ්ණිතා - එතම්හි නා නා කුසුමංච ගණිතං'
(දීපවංශය)

රාජාවලී කතුවර ව්‍යායාමය වූයේ එතෙක් සම්පාදිත රාජාවලිය, අලකේශ්වර යුද්ධය වැනි සිහළ වාර්තා ප්‍රයෝජනයට ගෙන එදා ජනශ්‍රැති මගේ ආ කුහුළ දනවන පුවත් ද මුහු කරමින් හැකිතාත් පූර්ණ ඉතිහාස කතාවක් සම්පාදනය කිරීමයි.

උදා - විජය රජු කුවේණියට දිවුට අයුරු
ඇගෙන් පඬුවස්දෙව් රජුට වැදුණු දිවි දොස
දුටුගැමුණු රජුගේ දස මහා යෝධයන් පිළිබඳ තොරතුරු දැක් වූ අවස්ථා.

ග්‍රන්ථ සම්පාදන ක්‍රමය අතින් මෙය දීපවංශය, පූජාවලිය වැනි ග්‍රන්ථවලට වඩා වෙනස් ය. එම කතුවරුන් තොරතුරු සෙවීම සඳහා අන් මූලාශ්‍ර වෙත යමින් නව නිපැයුම් ලෙස ස්වකීය ග්‍රන්ථ සම්පාදනය කළ ද රාජාවලී කර්තෘ තම ග්‍රන්ථයට මුල් වූ කෘති කෙරේ ඊට වඩා ණයගැති වූයේ ය. ඔහු බොහෝ අවස්ථාවන්හිදී ඒවා පදයෙන් පදය පිටපත් කළ අතර තමාට හුරු ලෙස බස හා වියරණ වෙනස් කළේ ය. මෙසේ පිටපත් කළ නොහැකි අවස්ථාවල තම බසින්ම ඒවා ලිවී ය. එමනිසා භාෂාව වෙනස් විය. තවද සම්පාදිත කාලයට විශේෂිත වූ භාෂා ලක්ෂණ මෙහි සැමතැනම විද්‍යමාන නොවේ. මෙයට තවත් හේතුවක් නම් කලින් කල වෙනස් වූ භාෂා ලක්ෂණ ඒ ඒ කලට අයත් සාහිත්‍ය කෘතිවල මැනවින් නිරූපණය නොවන අවස්ථා ද ඇති නිසාම ය. භාෂාවක දෘශ්‍යමාන වන ප්‍රබල ලකුණක් වනුයේ පුරාණස්ථිති සංරක්ෂණ ප්‍රවණතාවයයි. එනම් සම්භාව්‍ය භාෂා ප්‍රවණතාවය යළිත් භාවිතයට ගැනීමයි. මීට අමතරව බසක ප්‍රගතිශීලී ප්‍රවණතාවක් ද වෙයි. එනම් මේ තුළින් හැකිතාත් ඉක්මනින් හා අඩු උත්සහයකින් වචන ශබ්ද කිරීමට කයෝර වූ දුෂ්කර ශබ්ද සම්බන්ධයන් වලකමින් ශබ්ද ලුහුඬු කරයි. මෙකී ප්‍රවණතා දෙකෙහි පිළිඵලයක් ලෙසින් තවත් ප්‍රවණතාවක් ජනිත වන බව පරණවිතාණයෝ පවසති. එනම් පදයන්ගේ නිවැරදි ව්‍යවහාරය ගැන නිතර විනිශ්චයකාරී නොවූ පිරිසක් විසින් මෙම නව ක්‍රමය භාවිතා කරන ලදී. රාජාවලියේ ඇත්තේ මෙකී නව ප්‍රවණතාවයට අයත් බසකි. පුරාණස්ථිති ප්‍රවණතාව අනුව යමින් පැරණි සිංහල භාෂා රීති රැකීමට නම් පාලි, සංස්කෘත භාෂා ගැන දැනුම අවශ්‍යය. අඛණ්ඩ ඉතිහාසය ලියන්නෙකුට අමතක කළ නොහැකි මහාවංශය මෙයින් ඉවත් කළේ ඇතැම්විට පාලි නොදත් නිසා විය හැකිය.

ඡේක ප්‍රයෝග හරිහැටි නොදත් සාමාන්‍ය උගතෙකු වූ රාජාවලී කතුවරයා තමා නිවැරදි යැයි සිතූ බසින් රාජාවලිය රචනා කළ නිසා වියත් බසටත් ජන වහරේ බසටත් අතර නව බසක උපැත්මක් සිදු විය. මෙකී භාෂා ලක්ෂණ අනුව රාජාවලී කතුවරයාගේ ආවේණික භාෂා ශෛලියේ යම් සංකීර්ණතාවක් ද ප්‍රකට කරවයි. අවිදග්ධ බස් වහර කෘතිය පුරාම දිවේ. නමුදු සාහිත්‍ය හායන අවධියක මේ තරමින් හෝ සිහළ සාහිත දැහැනට දායක වීම අගය කළ යුත්තකි. සමස්තයක් ලෙසින් ගත් කල චූල ගණයේ කෘතියක් වුවද රාජාවලිය සංකීර්ණ භාෂා ව්‍යුහයකින් සුසැදුණක්ම බව පසක් වෙයි.



ආර්. එම්. එරන්දි සසිප්‍රභා මානෑව

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## නිසසලය

මලය රට පෙර ශ්‍රී විභූතිය යළිත් දෙරනත — පුබුදුවයි
නදී කුමරිය කොත්මලා ඔය ගලා යනවා — ලස්සනයි
මහවැලි මහ සෑ රදුන්ගේ සිසිල අද — සුවදායකයි
සසල වූ සිත මෙපින් බිම තුළ පින්බරයි හරි — නිසසලයි

කිතුල්ගල රත්නසේකර රූපසිංහ

## තවමත් ඉඳිමි රෝහිණී ගංතෙරට වෙලා

නවදළු හැදී තුරුමත මල් කැකුළු — රැසයි
වන වදුලේ විහඟුන් ගී ගයන — හඬයි
හෙමිහිට ගලන රෝහිණී ගඟ දෙගොඩ — බලයි
බුදුහිමි වඩින තුරු තවමත් කඳුළු — හලයි

සඟ පිළිවෙලින් වඩිනා හැටි සිතට — දනෙයි
ගඟ දිය බොර නොවී නිල් පැහැයෙන්ම — දිලෙයි
සොමිනස සතුට ඉපිලී සිත කය — සනසයි
අදටත් බුදුන් වැඩි ගංතෙර සිසිල — මවයි

ආසයි අහන්නට බණ පද ගං — තෙරදී
යෑමට නොහැක හිමි නොදකම පෙර — පරිදි
කීමට බැරිව දුක් ගින්දර සිතෙහි — රැදී
බුදුහිමි වඩින තුරු ඉන්නෙමි මෙහිම — රැදී

නෑයන් සමඟි කොට හැමදෙන එකතු — කොට
ලෝකය හදන්නට පෙරමෙන් සමඟි — කොට
බුදුහිමියනේ රෝහිණී ගං තෙර — ළඟට
තව සැරයක් වඩින් අපෙ දුක් — නිවන්නට

බුදුහිමි පුදන්නට මල් ගොන්නක් — කඩලා
දෑතේ තබා ඉන්නෙමි හිමි වඩිනු — බලා
යෑමට මඟක් නැත සසරෙන් එගොඩ — වෙලා
තවමත් ඉඳිමි රෝහිණී ගංතෙරට — වෙලා

ආචාරිනී, එස්. සමරසිංහ

සිංහයෙක් නොවුනමුත්..
එතරම් එඩිතරය..
රජෙක් නොවුනමුත්...
මා හට නම් ඔහු රජෙක්ය.
ඔහුගේ දුක සැප සොයා
නොබැලුවමුත්
අපගේ දුකේදීත් සැපේදීත්
අප ළඟමය...
ඔහුගේ වෙහෙස නොබලා
අපගේ අවශ්‍යතා සපුරන්නීය...
අන්සැමට වඩා මට වටිනා
ඔහු නම්... මගේ....
පියාණන්ය...

තෂ්මිලා නිශාදි
දඹුල්ල

## ජය ශ්‍රී මහා බෝධි

## සම්දුන් වැඩම කලදා.....

මහා සටනක වෙලී බෝසත්
　　දසමාර බල බිඳ දමා
සම්බුදුව කළගුණය පෑවා
　　බෝධියට මෙත්ගුණ මුදා
දැයට අභිමන් ජය උදානය
　　දඹ කොළ පටුන වෙත විදා
මහා සඝමිත් තෙරණි බැතිගෙන
　　බෝධි සම්දුන් වැඩමවා
දෙවන පෑතිස් මහා නරනිඳු
　　හෙළබිමට සිරි උපදවා
කරවටක් දියතුළින් බොධිය
　　හිසමතට ගෙන ගුණ දරා
දෙව්වරුන් නැගු දහම් ජය ඝොෂ
　　සිසාරා සිරිලක පුරා
මහාමෙවුනා උයනේ පින්බිම
　　අනුහසින් රෝපණ කළා
මෙහෙණි සසුනද සනිටු කරමින්
　　සංඝමිත්ත තෙරණිය එදා
අනුරපුරයෙන් විහිදු දම්හඬ
　　ලොවට බෙදුවා ගුණ සදා
දිලෙන බෝපත් මෙත් කිරණ මත
　　උතුම් සංකේතය රඳා
වසර ගණනක තැබූ ඉතිහාස
　　සැයේ කිරුළයි බෝ රජා
　　නමදිමි ගුණදම් ..... පුදා

ඒ.මුණසිංහ
අරුප්පල
මහනුවර

## සුපිපුන තල මලක් දුටුවා දිනෙක පෙර...



ඇවිදින දෙපා නොගනින ගව් ගනන් — දුර
නොතකන වෙහෙස නවතින තෙක් ගිමන් — හැර
රතුවෙන දෙතොල විට කෑ මොහොතකට — පෙර
බැඳගෙන මොණර පිල් ඇත රතු කඩක — තිර

අතගෙන කෙනෙකුගේ බලනා — පිටස්තර
බියගෙන දෙන අපල නොකියන වසන් — කර
පැකිලෙන කියන්නට දේවල් මුදල් — හැර
ගැන ගැන කියයි ධන රේඛා කැපෙන — ඉර

යන යන තැන බලන අත කිව් අයට — පෙර
කියවුන දෙයම කියවයි තව එකතු — කර
නොබලන අත බලා කෙනෙකුගෙ — මුහුණුවර
පවසන දෙය දෙකන් ඇතුලේ ගසයි — බෙර

නලවන නිතඹ වරලස නිල් නුවන් — ඇර
පොපියන දෙතොල් නාදළු කල පැහැය — තර
සිසිවන වුවන රණ තිසරුන් අරින — දොර
සුපිපුන තල මලක් දිනයක දුටිමි — පෙර

එම්. එම්. කුලසිරි ද සිල්වා - කැකිරාව

පරාර්ථිකාමීබව සැමදා ඇගැයීමට ලක්කෙරේ.



# බුදු දහමේ ඉගැන්වෙන
# දානය ගැන දැනගනිමු

**තමා සතු දෙයක් වෙනත් අයෙකුට සතුටු සිතින් කරුණා මෛත්‍රී සහගතව පරිත්‍යාග කිරීම දානයකි. දානය වනාහි බුද්ධ දේශනාවෙහි ප්‍රමුඛ ස්ථානයක් ගන්නා පුණ්‍ය ක්‍රියාවකි.**

දාන, ශීල, භාවනා යන තුන් පුණ්‍යක්‍රියාවන්ගෙන් දානය මුල්තැන ගනී. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහා වස්තුවෙහිද දානය මුලට ඇත. දාන, ශීල, පරිත්‍යාගය යන සතර ධර්මයන් ගේද මුලට දානය යෙදී ඇත. දාන, ශීල, නෙක්ඛම්ම, ආදී දස පාරමිතාවන්ගේ මුල්ම පාරමිතාව දාන පාරමිතාවයි. දස පුණ්‍යක්‍රියාවන්ගේ පළමු වැන්නද දානයයි.

මේ අනුව බුදු දහම තුළ දාන කුසල ක්‍රියාවකට සුවිශේෂ ස්ථානයක් ලැබී ඇති බව ඔබට පෙනී යනු ඇත.

අංගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයෙහි කාල දාන පහක්ගැන සඳහන් වේ.

**1. ආගන්තුකයන්ට දෙන දානය (ආගනතු ග සස දානංදෙති)**

**2. මගීන්ට දෙන දානය. (ගම් ක සස දානං දෙති)**

**3. ගිලනුන්ට දෙන දානය (ගිලාන සස දානං දෙති)**

**4. දුර්භික්ෂ කාලයෙහි දෙන දානය (දුබ්භිකෙඛ දානං දෙති)**

**5. අග්‍රශෂ්‍ය දානය (යානි යානි නවස සසති නවඵලානි නාති පඨමං සීලව නෙතසු පතිමඨාං පති)**

### 01. ආගන්තුක දානය

ආගන්තුකයෝ නම් වෙනත් ගමකින් හෝ නගරයකින් හෝ පිටරටකින් තමා වෙත එන පුද්ගල යෝය. තමා සමඟ කිසියම් සම්බන්ධතාවයක් ඇතිව අවශ්‍යතාවයකට හෝ එසේ නැතිව සා පිපාසාවෙන් පෙළෙන අය විය හැකිය.

එසේනම් එවැනි අය පැමිණි විට සාදරයෙන් පිළිගෙන අවශ්‍ය දේ දීම ආගන්තුක දානයක් ලෙස පිළිගත හැක. ඇතැම් විට වචනයෙන් ඉල්ලා නොසිටියත් ඔහුගේ හැසිරීම් රටාව අනුව අවශ්‍යතාවය නුවණින් සලකා බලා අවශ්‍ය දෙය දීම සත්පුරුෂ ලක්ෂණයකි.

සද්ධර්මාලංකාරයෙහි කාක වස්තුවෙහි" ආගන්තුක දානයට ඉතා කදිම නිදසුනක් ඇත.

දිනක් රෝහණ නම් ජනපදයෙහි මාතුල නම් විහාරයෙවහි භික්ෂූන් වහන්සේලා දානය වළඳ අවසන් වී භෝජන ශාලාවෙහි වතාවත් කරමින් සිටියදී ඉතාමත් බඩගින්නෙන් පෙළුණු කපුටෙක් විහාර සමීපයේම ගසක සිට දුකින් හැඬීය. ඒ විහාරයේ ප්‍රධාන තෙරුන් වහන්සේ කපුටාගේ විලාප හඬ අසා බඩගින්නේ පෙළෙන බව නුවණින් අවබෝධ කොට ගෙන සාමණේර හිමිනමක් ගෙන්වා රෙදි කඩකින් පහන් වැටි අඹරා ගිතෙලින් තෙමා මදක් රත්කොට කපුටාට දෙන ලදි. ඒ පහන් වැටි අනුභව කොට කපුටා කුසගිනි නිවාගන්නා ලදි.

### 2. මගීන්ට දෙන දානය

දුර බැහැර ගමන් යාමට අද මෙන් යාන වාහන පහසුකම් අතීතයේදී නොතිබිණ. එසේ හෙයින් ගමන් කිරීමෙන් වෙහෙසට පත්වූ මගීන්ට දෙන දානය මහත් ඵල ගෙදේ.

රුහුණේ ත්ස්සමහා විහාරයේ සිට අනුරාධපුර මමහා විහාරයට සාමාන්‍ය පුද්ගලයෙකුට යාම සඳහා දින ගණනාවක්ම පයින් යා යුතුව ඇත. මෙබඳු වූ දීර්ඝ ගමන් වලදී දින ගණනකට අවශ්‍ය ආහාර පාන රැගෙන යා නොහැකිය. අද මෙන් මාර්ගය දෙපස ආපනශාලා එකළ නොවීය. එවන් මඟියෙකුට අනික් කෙනෙකුගෙන් ලැබෙන ආහාරයක් මිස වෙනත් පිළිසරණක් නොවීය.

මෙයට නිදසුන් කතාවක් සද්ධර්මාලංකාරයෙහි සාලිරාජ වර්ගයෙහි නකුල වස්තුව දැක්විය හැක.

රුහුණු ජනපදයෙහි එක ගමක නකුල නම් දුගී පුරුෂයෙක් වාසය කළේය. ඔහුගේ දියණියක් කහවනු දොළසකට ණය ගැතිව මාගම එක් කුල ගෙයක බැල මෙහෙවර කරමින් සිටී. නකුල උපාසක තෙමේ තම දියණිය නිදහස් කරගැනීමට තිබූ කහවනු දොළොස දී වෙනත් අයෙකුගෙන් බත් මුලක් මිලට ගෙන උන්වහන්සේට පූජා කළේය. තෙරුන් වහන්සේ එම සිද්ධිය මෙනෙහි කරමින් භාවනා කොට රහත්වීමෙන් අනතුරුව දානය වැළඳූ සේක.

### 3. ගිලනුන්ට දෙන දානය

විවිධ වූ රෝගාබාද වලින් පෙළෙන ලෙඩුන් වෙනුවෙන් දෙන ආහාර පාන ගිලන් අයට දෙන දානයක් වෙයි. යම් පුද්ගලයෙකු ගිලන් වූ පසු ඔහුට අවශ්‍ය වන ආහාර පාන බෙහෙත් ඖෂධ ලබා ගැනීම දුෂ්කර විය හැකිය. එබඳු වූ අසරණ වූ අනාථවූ අය වෙනුවෙන් අවශ්‍යවන යම් දෙයක් අපට උපයා සපයා දිය හැකි නම් එය මහඟු පුණ්‍ය කර්මයකි.

සමහර අවස්ථාවලදී රෝගය උත්සන්න වූ අවස්ථාවක අවශ්‍ය වූ බෙහෙත් නොලැබීම නිසා ඔවුන් මරණයටද පත්විය හැක. එබැවින් එවැනි කෙනෙකුගේ ජීවිතය රැක දීමට අප කරන්නාවූ උපකාරය කොතරම් උතුම්ද, බලසම්පන්නද ගිලනුන්ට දෙන දානයේ උතුම්බව ප්‍රකාශවන කථාවක් සද්ධර්මාලංකාරයෙහි චූල ගල්ල වර්ගයෙහි චූල ගල්ල කතාවෙහි (සූළු ගල) මෙසේ දක්වෙයි.

ලක්දිව වයඹ දිසාවෙහි දදුරු ඔය අසබඩ චූල ගල්ලනම් ගමෙහි මහත් ශ්‍රද්ධා සම්පන්න සූළුගල් නම් උපාසක කෙනෙක් විසූහ. හෙතෙම බොහෝ ධනය වියදම් කොට දාන ශාලාවක් කරවා නිරන්තරයෙන්ම භික්ෂූන් වහන්සේලාට දන් පූජාකර වතාවත් කරමින් සිටින සමයේ මලියදේව" නම් මහරහතන් වහව්සේට දරුණු බඩේ අමාරුවක් ඇති විය. ඒ රෝගය සංසිඳවීමට නම් ඖෂධ වර්ග එකොළහක් දමා සකස්කරන ලද කැඳක් වැළඳුවහොත් පමණි. සුළුගල උපාසක තෙමේට මේ බව දන්වුවහොත් මේ බෙහෙත් කැඳ නොවරදවාම ලැබෙන බව සැළකූ තෙරුන් වහන්සේ පිඬුසිඟා ගොස් ඒ දාන ශාලාවට වැඩි සේක. උපාසක තෙමේ තෙරුන්වහන්සේගේ ආකාරය දුන ස්වාමීණි, ඔබ වහන්සේට යම් ආබාධයක් ඇත්ද?"යි විමසීය. උන්වහන්සේ රෝගය සහා පිළියම පිළිබඳව උපාසක තෙමේට දැන්වූ සේක. මඳක් වැඩසිටිය මැනව"යි පවසා ගෙට ගොස් බෙහෙත් කැඳ පිළියෙල කොටගෙන අවුත් උන්වහන්සේට පිළිගැන්වීය.

තෙරුන් වහන්සේ භෝජන ශාලාවෙහි වැඩහිඳ බෙහෙත් කැඳ වළඳ රෝගය සන්සිඳුවා ගත් සේක. පසුව තමන් වසන වේගිරිය විහාරයටම වැඩිසේක.

### 4. දුර්භීක්ෂ කාල දානය

වර්ෂාව නැති වීමෙන් මිනිසුන්ට ගොවිතැන් කළ නොහැකි වෙයි. ඒ කාලයට ආහාරයට අවශ්‍ය බත සපයන කුඹුරු සහ ගොඩ-මඩ ගොවිතැන් සියල්ල විනාශවී පාලු වී යයි. ලංකාවේද එබඳු දුර්භීක්ෂ කාල කීපයක්ම ඉතිහාසයෙහි සඳහන්ව ඇත.

බැමිණියා සාය, එක් නැළි සාය, කරකොළ සාය ඒ සමහරකි. මෙවන් කාල වලදී මිනිසුන් මෙන්ම ෂතුන්ද නිරහාරව මිය යති. මෙබඳු අවස්ථාවලදී සාගින්නෙන් පෙළෙන්නන්ට දෙන දානය දුර්භීක්ෂ කාල දානය නම් වේ.

අනුරාධපුරයට දකුණු දිග බ්‍රාහ්මණ චෝල" කුඹුරු කොටා උඳු වැපුරුවාහුය. උඳු පැසීගන එන අවස්ථාව වන විට මහා තද නියගයක් ඇති විය. මෙහිදී පිපාසය සංසිඳවා ගැනීමට මිනිසුන්ට හෝ සතුන්ට ජලය පොදක්වත් ලබාගත හැකි වෙතැයි සිතා ඒ කුඹුර දෙසට වැඩිසේක. එකල්හි එක් බාල ගම් දැරියක් පැන් සොයා වඩින භික්ෂූන් වහන්සේ පිපාසිතව වෙහෙස කරව ක්ලාන්ත බවින් යුක්තවූ ස්වරූපය දැක කිසිවෙකුටත් නොදන්වා සඟවා තිබූ වතුර කළය රැගෙන විත් උන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූවාය. භික්ෂූන් වහන්සේද ජල පාත්‍රය රැගෙන වැඩිය සේක.

ඉන් පසුව පිපාසිතව සිටි මිනිසුන් වතුර බීමට පැමිණ සඟවා තිබූ කළයෙහි දිය නැතිබව දැන මෙයින් දිය ගත්තේ කවුරුන්දැයි සෝෂා කරන්නට විය. එවිට ජලය පූජා කළ දැරිය පැන් පිපාසාවෙන් වැඩියාවූ ස්වාමින් වහන්සේ නමකට පැන් පූජා කළෙමි" යයි කීවාය.

එම්බල දැරිය පිපාසයට බොන්නට ගෙනවිත් සඟවා තිබූ වතුර කළය කොහෙදෝ යන භික්ෂුවකට පූජාකරල අපි මහත් පීඩාවකට පත්විමු. කොතනින් හෝ අපට පැන් ගෙනව" තර්ජනය කළාහුය. අසරණ බවට පත් වූ දැරිය බලවත් සිත් තැවුලෙන් යුතුව කළයත් රැගෙන මහ මඟට බැස යන විට ඈතින් මහත් ජල කඳක් මහාපොළවෙන් උඩට නැගී දිය බුබුලක් ලෙෂ දැක ඒ වෙතට ගොස් සිත්සේ පැන් බී සැනසී දිය දිය කළයක්ද රැගෙන විත් කුඹුරේ සිටි මිනිසුන්ට දුන්නාය. දැරියගේ පිනෙන් පහළ වූ මේ දිය බුබුල දුටු මිනිසුන් එහි ගොස් දිය බී නා පිරිසිදුව ෂතුටට පත් වූහ. මාතලේ ප්‍රදේශයේ අදත් මේ දිය බුබුල කවර නියං කාලයකදී වුවද මිනාසිදී මිනිසුන්ට ගොවිතැනට ජලය ලබාදෙන බව ගම්මු විසින් සඳහන් කරයි. මෙම කථා පුවත සද්ධර්මලංකාරයෙහි අභය ථෙර වර්ගයෙහි ගාම දාරිකා වස්තුවෙහි සඳහන් වන්නකි.

### 5. අග්‍රෂ්‍ය දානය

තමා විසින් වගාකරන ලද කෙතක හෝ වවන ලද ගසක මුලින්ම ලබන අස්වැන්නෙන් පිළියෙළ කළ ආහාරය හෝ ගසක හටගත් ඵලාපලයක් සීලාදි ගුණයන්ගෙන් පිරිපුන් වූ උතුම් පුද්ගලයෙකුට දන්දීම මෙනමින් හඳුන්වනු ලබයි.

අස්වැන්න වශයෙන් ගෙට ගෙනා වී වලින් මුලින්ම දානයක් පිළියෙල කොට පූජා කිරීම බෞද්ධ පින්වතුන්ගේ ස්වාභාවික පුරුද්දකි. බුදුරජාණන් වහන්සේ උදෙසාද අග්‍රෂ්‍ය දානය පිණිස බුද්ධ පූජා සහ භික්ෂූන් වහන්සේලාට අලුත් බත් දානය පූජා කරති. අනෙකුත් දාන වලට වඩා මෙහි විශේෂයක් වන්නේ අග්‍රශෂ්‍ය දානය දෙන්නේ හැම අතකින්ම තමන් උසස්කොට ෂලකන සිල්වත්, ගුණවත් කෙනෙකුට වීමය.

දඹදිව ගෞතම බුද්ධෝත්පාදයට පෙර එක්තරා වැදි පුරුෂයෙක් සිය අඹුව සමඟ තම ගෙය වටා අල, කෙසෙල්, පොල්, පුවක්, අඹ, කොස් ආදී වෘක්ෂයන් වවමින් ජීවත් විය. කලක් ගිය පසු එක් කොස් ගසක මහත්වූ විශාල වැල ගෙඩියක් ඉඳුණු කල්හි වැදි පුත්‍රයා වැල ගෙඩිය ගසින් බාගෙන ගෙට එන විට එයින් පැණි බේරෙන්නට පටන්ගත්තේය. එකළ වැදි පුත්‍රයානන් මේ අග්‍ර වූ ඵලය අනිකෙකුට සුදුසු නොවෙයි. විකිණීමටද සුදුසු නොවෙයි. මෙය මාගේ පසේ බුදුන්ටම පූජා කරමි යි සිතා පසේ බුදු කෙනෙකුටම පූජා කරන ලදි. ඔහු ඒ කළ පිනෙහි විපාක වශයෙන් මියගිය පසු කාමාවචර දෙව්ලොව ඉපිද බොහෝ දිව්‍ය සම්පත් ලැබූ බව එහි සඳහන්වෙයි.

ලලිතා හෙට්ටිආරච්චි දේවහුව.

07 පිටුවෙන්...

# ථෙර ථෙරී ගාථා

ගයා තීර්ත සමීපයෙහි උතුම් වූ දහම් දේශනා දෙසන මහත් වූ ශරීර ප්‍රභා ඇති ගනාචාර්ය වූ දෙවියන් සහිත ලෝකයාට අග්‍ර වූ විනායක වූ පස්මරුන් බිනූ අශ්‍රදෘෂ දර්ශන ඇති මහා වීර වූ මහත් ප්‍රතාප ඇති සියලු ආශ්‍රමයන් ප්‍රහීන කළ කිසිම බියක් නැති සමයයක් සම්බුද්ධයන් වහන්සේ බොහෝ කලෙක සිට කිලිටි වූ නොයෙකුත් බැඳීම්වලින් යුත් සේනක නම් වූ මා සියලු බැඳීම් වලින් මුදවාලූහයි සේනක රහතන් වහන්සේ තම නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කර ඇත.

එමෙන්ම මහා පන්තක ස්වාමීන් වහන්සේ තමා දැන් ගතකරන ජීවිතය පිළිබඳව ප්‍රකාශ කරන නිරාමිස ප්‍රීතිය දෙස බලන විට අද සමාජය පුහු ආටෝප වලින් රැවටී ඒ කෙරෙහි ඇලී ගැලී සිටින අයුරු පැහැදිලි වේ.

**''යම් දිනෙක ශාස්තෘන් වහන්සේ දුටුවද මට සංවේගය උපදින්නේය. ගෙට ආ සිරිකත අතින් පයින් පහර දී පලවා නොහරින්නාක් මෙන් අඹුදරුවන්ද දරුවන්ද හැර කෙහෙ රැවුල් බා සසුන් ගතවීමි. ඉන්ද්‍රියන් මනා සංයමයෙන් යුතුව අධිශික්ෂායෙන් හා ප්‍රඥාවෙන් අපරාජිත වීමි. තෘෂ්ණා නැමැති හුල නොදල්වා හිදිමි. මාගේ වීර පරාක්‍රමය බලව. ත්‍රිවිද්‍යාවෙන් ලදිමි. පෙර විසූ කද පිළිවෙල දනිමි. දිවැස් ලදිමි. කෙලෙසුන් නැසුවෙමි. උපදි රහිත වූ දක්ෂිනාර්හ වූ රහත් කෙනෙක් වීමි.''**

මහා පන්තක රහතන් වහන්සේ ප්‍රකාශ කර ඇත.

මේ අයුරින් සියලු කෙලෙසුන් නසා රහත් බවට පත් රහතන් වහන්සේලා තම අතීත ජීවිතය පිළිබඳ කෙතරම් සංවේගයක් දක්වන්නේද යන්න උන්වහන්සේ ගේ ප්‍රකාශ වලින් පැහැදිලි වේ.

මතු ආත්මයක් ගැන එතරම් විශ්වාසයක් නොමැතිව කටයුතු කරන නූතන සමාජයට මෙම ප්‍රකාශ කෙතරම් අගනේදැයි සිතිය යුතුය. මින් ඉදිරියට ද තවත් දහස් ගණන් රහතන් වහන්සේලා විසින් ප්‍රකාශ කරන ලද නිරාමිස ප්‍රීති වාක්‍යය අද සමාජයේ යහපත සඳහා ප්‍රකාශ කිරීමට අදහස් කරමි. එමෙන්ම ථෙරනීන් වහන්සේලාගේ ආත්ම ප්‍රකාශනද මීට බොහෝ සෙයින් සංවේදීජනක බව සිතිය යුතුය.

## රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම් - *(අන්තර්ජාල කලාපය අංක 02)*

**දෙසැම්බර් - උදුවප් මස පොහොය ප්‍රශ්නයඃ-**

බොදු පැනයට පිළිතුරු එවා
වටිනා දහම් පොත් පාර්සලයක්
දිනාගන්න.

**02). තිරියායේ පිහිටි ගිරිහඬුසෑය කවුරුන් විසින් සාදන ලද්දේද? එහි නිධන් කර ඇති පූජාර්හ වස්තූන් මොනවාද?**

**කූපනය**

**ප්‍රශ්න අංක 02:**

**නම :** ..........................................................................

**ලිපිනය :** ..........................................................................

**පිළිතුර :** ..........................................................................

**දුරකථනය අංකය :** ..........................................................................

**දිනය :** ..........................................................................

**අත්සන :** ..........................................................................

ඔබේ විසඳුම් තැපැල්පත්වල පමණක් ලියා **'රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම්', රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය, අංක 130, නුවරපාර, දඹුල්ල.** යන ලිපිනයට **2019-12-20 දිනට පෙර** එවිය යුතුය.



**ජයග්‍රාහිකයින් තෝරා ගැනීම කූසපත් ඇදීමෙන් තෝරා ගැනේ.**

# ජාතක කතාවේ උප්පත්ත

**"මෙකී කථා ප්‍රවෘත්තියේ ජෝසපට් නොහොත් ජෝසාප් යනුවෙන් හැඳින්වනුයේ බෝධිසත්වයන්ම යැයි බෞද්ධ ග්‍රන්ථ රාශියක ඉංග්‍රීසි පරිවර්ථකයා වශයෙන් කීර්තියට පත් රයිස් ඩේවිඩ් මහතා පවසයි."**



**බෞද්ධ සාහිත්‍ය විෂයෙහි බාල, තරුණ, මහළු කාගේත් සිත් ඇද ගන්නා සාහිත්‍ය කෘතියක් වශයෙන් ජාතක පොත් වහන්සේ හැඳින්විය හැකිය. කථාන්දර කීමට හා ඇසීමට මිනිස් හිතේපහල වන අභිලාෂය උගතුන්ට හා ඉගෙන ගන්නන්ට සිමා වුයේ නොවේ. අකුරු නොදත් ජනයා පවා කථා රසයෙන් විනෝද වීම ඈත අතිතයේ සිටම මනුෂ්‍යා පිළිබඳ ආවේණික ධර්මතාවක් පවති. මිනිස් චරිත විශිෂ්ඨ සම්පන්න කිරිමෙහිලා උපදේශාන්විත කථා තරම් ප්‍රබල මාර්ගයක් වෙන නැතැයි කිව යුත්තේ දර්ශන වාද චින්තන චෛතසික යන්ගේ ප්‍රභේදාදිය නිසි පරිදි අවබෝධ කර ගත හැක්කේ නුවණින් මුහුකුරු ගිය උගතුන්ට පමණක් වන බැවිනි.**

සෑම බෞද්ධ රටකම කථා රසාස්වාදය විඳිනු කැමති සියල්ලගේම ආදරය දිනා ගත් එක් ග්‍රන්ථයකි ජාතක පොත. ඊට හේතු බවට පත්වී තිබෙන්නේ එහි සරළ භාෂාවත් හාස්‍ය, අත්භූත, ශාන්ත, කරුණාදි කාව්‍ය රසයන්ගෙන් අනූන කථා ඇතුලත් වීම නිසා වෙනි. සිංහල සාහිත්‍යයේ පෝෂණයටද ජාතක පොතින් ලැබුණු පිටුවහල මුවදෙව්දාවත, කව්සිළුමිණ, සසදාවත හා කාව්‍ය ශේඛරය, ගුත්තිල ආදී විශිෂ්ඨ පද්‍ය ග්‍රන්ථ විමර්ශනය කිරීමේදී පෙනී යයි.

## පෙර හා අපර දිග

ඉතින් මේ කථා ජාතක පොතට ඇතුළත් වුයේ කෙසේද? එය එක් අයකුගේ කෘතියක්ද? එසේත් නොමැතිනම් බොහෝ දෙනෙකුගේ කෘතීන් සංග්‍රහ කිරිමෙන් පහළ වුවක්ද? එසෙත් නොමැතිනම් කිසිඳු සත්‍ය අංශුවක් නැති මනඃකල්පිත උපදේශාත්මක කථාද? යන ප්‍රශ්න පෙර අපර දෙදිග බොහෝ උගතුන්ගේ සැළකිල්ලට භාජනය වූ ප්‍රශ්නයෝ වෙති. ජාතක කථා හා භාරත වාසී හින්දුන් අතර ප්‍රචලිත වෘහත් කථා වේතාල පංච විංශති, මහා භාරත, පංච තන්ත්‍රාදියේ කථාත් ග්‍රීක රෝම ආදී ජනයාගේ නොයෙක් කථාත් අතර ඇති සාම්‍ය මේ කථාවන්ගේ ආරම්භයට පෙර හා අපර දිගින් කොතරම් පිටුවහලක් සැළසුනේ දැයි නිෂ්චය කිරීම ඉතා වැදගත් වේ.

ථේරවාද බෞද්ධයන්ගේ මතයේ හැටියට ජාතක ධර්ම දේශනාව සූත්‍ර පිඨකයේ කුදු ගොත් සඟියට අයත් චුන්දක පායාදී පසලොස් ප්‍රකරණයට ඇතුළත්ය. මහායාන බෞද්ධයින් අතර අවධානය යොමුවන්නේත් මේ ජාතක කථාමය. මහා වස්තවාවදාහ ආදී මහායාන ග්‍රන්ථ වල ථෙරවාදීන්ගේ ජාතක කථා ඇතුලත් වේ. පර්සියාවේ බෑග්ඩෑම් හී අල්මාන්සූර් රජහුගේ රාජ සභාවේ වැජඹුණු කවියෙකු විසින් නිබන්දිත කලිලා හා ඩිම්නා" නම් ග්‍රන්ථයේ ඇතුලත් බාර්ලාම් හා ජෝසාපට් පිළිබඳ කතා ප්‍රවෘත්තියත් ජාතක කථා ආරම්භයේ ඇති බුද්ධ චරිතයත් අතර සමානාත්මයක් ඇතැයි සැළකේ.

## බෝසතුන් හා ශු ජෝසාපට්

මෙකී කථා ප්‍රවෘත්තියේ ජෝසපට් නොහොත් ජෝසාප් යනුවෙන් හැඳින්වනුයේ බෝධිසත්වයන්ම යැයි බෞද්ධ ග්‍රන්ථ රාශියක ඉංග්‍රීසි පරිවර්ථකයා වශයෙන් කීර්තියට පත් රයිස් ඩේවිඩ් මහතා පවසයි.

අරාබි භාෂාවේ ජෝසාප් යුදාසන් යන වචන සමානාර්ථ ඇති බවත් යුදාසන්" යන්නෙහි ආදි ස්වරයවත ය" හා සමඟ ආරාබි අක්ෂර මාලාවේ බ" යන්නෙහි සාම්‍යයක් ඇති බවත් මෙය බෝධි සත්ව යනුවෙන්ද ශාස්ත්‍රයන්ගේ මතයකි.

මෙකී කථා ප්‍රවෘත්තියේ අන්දමට බාර්ලම් නම් තැනැත්තාගේ අවවාද අනුශාසනා වලට පැහැදුණුඉන්දියානු කුමාරයෙක් තපස් රැකිමෙහි යෙදි සුද්ධ වන්තයෙකු බවට පත්වෙයි. මේ කථාව ඇතුලත් ග්‍රන්ථය ලතින්, ප්‍රංශ, ස්පාඤ්ඤ, ජර්මන්. ඉංග්‍රිසි, ලන්දේසි ආදී භාෂා වලටද පරිවර්ථනය කොට ඇත. මෙය ලතින් භාෂාවට පෙරලන ලද්දේ ඩැමස්කස්හි ශු ජුවන් මුණිවරයා විසිණි.තවද 14 වන ශත වර්ෂයේ අපර භාගයේදි වැනීසිය අසල යෙසොලොපි නගරයේ විසු රාජගුරු ප්‍රාසාදි ජේතෘද්දනතාලිස් තුමා ප්‍රබන්ධ කළ මුණිවරයන්ගේ නාම ලේඛණයටද මේ භාර්ලම් හා ජෝසාපට් ශුද්ධවන්තයන්ගේ නම් ඇතුලත් වි ඇත.

ග්‍රීක් දේව ධර්ම ග්‍රන්ථ වල අද දක්වා ඇතුලත් වන ඉංදියාවේ ආවර්තීර් රජුගේ පුත්‍ර ශුද්ධවු ජොසප් යනුවෙන් දක්වා තිබෙන්නේ මේ සුද්ධ ජෝසාපට් තුමා බව තත්වඥයෝ පිළිගනිති. ගෞතම බුදුරජාණන් වහන්සේට ශුද්ධ ජෝසාපට් යන නමින් කතෝලික භක්තිකයන් සෑම දේනාම ශුද්ධ වු මුණිවරයෙකුට මෙන් වැදුම් පිදුම් කරතැයි ආචාර්ය මැක්ස් චුලර් මහතා එක හෙළාම ප්‍රකාශ කරයි.

අලියන්දර රජුගේ සංග්‍රාමයන් කරන කළ ක්‍රි:වඃ පෙර තුන්වන සතර වන සියවස් හිදී ඉන්දියාවත් ග්‍රීසියත් අතර පැවති සම්බන්ධතාව දේශාපාලනාත්මක වුවා සේම සාහිත්‍ය සම්මිශ්‍රණයකටද මඟ පැදුණු බව නොරහසකි. ග්‍රීක් ජනයා දිර්ඝ කාලයක් ගත කළ ඉන්දියාවේ හා අස්ගනිස්ථානය ජාතක කථා අතිශයින්ම ප්‍රචලිත වු භූමි භාගයකි. ග්‍රීක - බැට්රියන් රජවරුන්ගේ රාජධානිය වු මේ ස්ථානය ජාතක කථා රාශියක පිටු බිම සේ පෙනේ. තවද සුමේධ තාපසයන්ගේ මහා දන් වැසි වැස්සවීමද මේ අසල වු සිලාලභාද්හි සිදුවුයේ යැයි ආචාර්ය විලියම් සිම්ප්සන් මහතා විසින් කරන ලද පර්යේක්ෂණ අනුව ඇතිවු නිගමනයකි. ග්‍රීක් සාහිත්‍ය ධුරයෙන් ඉන්දීය මේ ජාතක කතාශ්‍රයෙන් ලියු පොත් ඉතාලි හෙබ්‍රෙව් ආදී භාෂාවලට පරිවර්ථනය වී ඒවා යලිත් පෝගියෝ, බොකොලියෝ, ගවර්, ඩෝසර්, සේපෙන්සර් ආදි කවි වරයන්ගේ කෘති වල කථා ශරීරය පෘෂ්ටිමත් කිරීමෙහි ප්‍රමුඛ වු බව පෙනේ.

"කලිලා හා ඕම්නා" නම් පර්ෂියන් ග්‍රන්ථ බෞද්ධ ජාතික කථා ආශ්‍රයෙන් ප්‍රබන්ධ කරන ලද මේ ඒ ග්‍රන්ථයේ නොයෙක් පළාත් වලින් ලැබුණු පිටපත් එකින් එකට බොහෝ සෙයින් විසදාගෙන වත්මන් එහි බුදුන් වහන්සේ ගැන

**සෑම බෞද්ධ රටකම කථා රසාස්වාදය විඳිනු කැමති සියල්ලගේම ආදරය දිනා ගත් එක් ග්‍රන්ථයකි ජාතක පොත.**

**ඊට හේතු බවට පත්වී තිබෙන්නේ එහි සරල භාෂාවත් හාස්‍ය, අත්භූත, ශාන්ත, කරුණාදි කාව්‍ය රසයන්ගෙන් අනූන කථා ඇතුලත් විම නිසා වෙනි.**

**සිංහල සාහිත්‍යයේ පෝෂණයටද ජාතක පොතින් ලැබුනු පිටුවහල මුවදෙව්දාවත, කව්සිළුමිණ, සසදාවත හා කාව්‍ය ශේඛරය, ගුත්තිල ආදී විශිෂ්ඨ පද්‍ය ග්‍රන්ථ විමර්ශනය කිරිමේදී පෙනී යයි.**

දෙල්තොට පියසිරි හිමි ශ්‍රී නාග ජාතික පාසල


පන්සිය පනස් ජාතක කතා පොතේ එන... තුන්වැනි කතා වස්තුව... සේරිවාණිජ ජාතකය ඇසුරෙනි...
ප්‍රේම වෛරය
සැකසුම, චිත්‍ර පාලිත සඳුආරච්චි
2
"මහණෙනි..." යටගිය.. දවස.. බරණැස් නුවර.. බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක්.. රාජ්‍යය කරන කාලයේ... අප මහා බෝසතාණෝ සේරිව නැමති රටේ. කාච්ඡපුට නමින් වෙළෙන්දෙකුව උපන්නේය...
මේ සේරිව රටේම වඩා විකුණුමා පවත් වන "සේරිව" නම් තවත් වෙළෙන්දෙක් සිටියේය.... ඔහු ඉනා.. මසුරු.. ලෝභ අනීසත දේට ආශා කරන පුද්ගලයෙකි-
මොවුන් දෙදෙනා නගරයෙන් නගරයට ගොස් වඩා විකුණුමා ජීවිකාව කරගෙන යති...
මිතුයා.. අපි.. අද මේ නීලවාහිනී ගඟෙන් එගොඩවී.. අන්ධපුර නගරයෙහි වෙළඳාමෙහි යෙදෙමු
හොඳයි සේරිව.. අපි එහෙනම් ගඟෙන් එතෙර වෙමු..
දෙදෙනාම නීලවාහිනී ගඟෙන් එතෙරවූ පසු..
මිතුර.. ඔබ.. මේ පැත්තට යන්න.. මම මේ වීදිය දිගේ යනවා...
මා යන මේ වීදිය පැත්තට ඔබ.. එන්න එපා...
හොඳයි සේරිව.. මම වෙනත් දිසාවකට ගමන් කරන්නම්...
..වළලු.. ..වළලු..

iii පිටුවෙන්....

## බුදුදහමින් වරප්‍රසාද ලත් කාන්තාව

ථෙරී ගාථා තුළින් එය මනාව ස්ඵුට වේ. සෝමා තෙරණියගේ ප්‍රකාශය වන,

*"ඉත්ථී භාවෝ නො කිං කයිරා චිත්තම්හි සුසමාහිතො*
*ඤාණම්හි වත්ත මානම්හි සම්මා ධම්මං විපස්සිනො"*

මෙයින් සඳහන් වන්නේ සිත සමාධි ගත වන්නේ නම්, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත හැකි නම්, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කිරීමට හැකි නම්, ස්ත්‍රී භාවයේ කිනම් අඩුවක් ද යනුවෙනි.

මේ තුළින් වර්තමානයේ කාන්තාවට ලබා දෙන්නේ මහත් වූ පණිවිඩයකි. කාන්තාවගේ අගය ප්‍රකට කරන ලද තවත් අවස්ථාවක් ලෙසින් මාතෘත්වය සඳහන් කළහැක.

- ඇය මහා බ්‍රහ්මයාට සම කළ අවස්ථාවක් ලෙස (බ්‍රහ්මාති මාතා පිතරෝ)
- මව තම නිවසේ මිතුරියක් ලෙස (මාතා මිත්තං සකේ ඝරේ)
- දෙමාපියන් පෙරදිග දිසාව ලෙස (මාතාපිතා දිසා පුබ්බා)
- දෙමාපිය උපස්ථානය මංගල කරුණක් ලෙස (මාතා පිතු උපට්ඨානං)
- මව්පියන්ට නොසළකන්නා පිරිහෙන බව ( යෝ මාතරං වා පිතරං වා)

යන අවස්ථා තුළින් බමුණු මත බිඳ දමා කාන්තාවන්ට සමාජයේ ගෞරවාන්විතව කටයුතු කිරීමට, බුදු දහම තුළින් උදා කර දුන් බව මනාව ප්‍රකට වෙයි.

එසේ ලබා දුන් එම ගෞරවාන්විත බව ආරක්ෂා කර ගැනීමට කටයුතු සලසා ගැනීමට, නැවත උදා වූ මහගු අවස්ථාවක් ලෙස උඳුවප් පොහෝ දිනය හඳුන්වා දිය හැකිය.

# මතට තිත තැබිය යුත්තේ ඇයි?

## මත්පැන් පානයෙන් වැළකීසිටීමෙන් ආනිසංස 30 ක් ලැබේ.

1. තුන් කල්හි කරන යම් කටයුත්තක් වේද එය වහා වැටහෙන බව.
2. සෑම කල්හිම එළඹ සිටි සිහි ඇත්තකු වීම.
3. උම්මන්තක නොවී ඉපදීම.
4. ඥානවන්තයෙකු වීම.
5. අලස නොවීම.
6. (ජඩ නොවීම) නොහික්මුණු ක්‍රියා නොකිරීම.
7. කෙළතොලු නොවීම.
8.තරුණමදයෙන් ආදී මත් වූ ස්වාභාවයක් නැතිබව.
9. අප්‍රමාද විහරණ ඇත්තෙකු වීම.
10.මෝහයෙන් මුලා වී කටයුතු කරන්නෙකු වීම.
11. තැති ගැනීම් නැත්තෙකු වීම.
12.එකට එක නොකිරීම.
13.ඊර්ෂ්‍යා නොකරන බව.
14. සත්‍ය වචන කතා කරන්නෙකු වීම.
15 කේලාම් පරුෂ හිස් වචන කතා කරන්නෙකු නොවීම.
16.දිවා රෑ දෙකෙහි අලස බවින් තොරව කටයුතු කරන්නෙකු වීම.
17.කළගුණ දන්නෙකු වීම.
18.කළ උපකාරයට ප්‍රති උපකාර කරන්නෙකු වීම.
19.මසුරු මළ ධර්ම නැත්තෙකු වීම.
20.ත්‍යාග වන්තයෙකුවීම.
21.මහ සිල්වතෙකු වීම.
22.සෘජු ගතිපැවතුම් ඇත්තෙකු වීම.
23.ක්‍රෝධ නොකරන සත්පුරුෂයෙකු වීම.
24.පව් කිරීමට බිය ඇත්තෙකු වීම.
25.සෘජු අදහස් ඇත්තෙකු වීම.
26.මහ ප්‍රඥාවන්තයකු වීම.
27.මහ චිත්ත ශක්තියක් ඇත්තෙකුවීම.
28.දාර්ශනික අදහස් ඇති පණ්ඩිතයෙකු වීම.
29.අර්ථය අනර්ථය වැටහෙන හසල බුද්ධියක් ඇති බව.
30.''ධම්මෝහවේ රක්ඛති ධම්මචාරී''

iv පිටුවෙන්....

## පස්කම් සැපයට ගිජුවී නොයමු අප සැම නිරයට

ස්වාමීනි, මේ ග්‍රීෂ්ම වෙලාවෙහි තුනී සෙවණැති ගස මුල වැඩ සිටින්නේ ඇයි? එවිට බුදුරජාණන් වහන්සේ ඥාතී සෙවණ සිසිල් වෙයි. යනුවෙන් දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ ඥාතීන්ට උපකාර පිණිස පැමිණි බව දැන විඩූඩභ ආපසු සැවැත්නුවරට ගියේය. මේ අයුරින්ම දෙවන තුන්වන වර ද සිදුවිය. සතරවන දින ද විඩූඩභ යුදයට ගොස් අචිරවතී ගඟ අසල කඳවුරු බැඳගෙන සිටියදී රාත්‍රී මහා ගංවතුරක් ගලා විත් විඩූඩභ රජු ඇතුළු පිරිස මුහුදට ගසා ගෙන ගියේය.

මල් කඩ කඩා රැස් කරන තැනැත්තෙකු මෙන් මෙලොව පඤ්කම් නැමැති මල් සොයන්නා වූ එහි තදින් ඇලුනාවූ සත්වයා නිදා සිටි ගමක් මහ මුහුදට ගසාගෙන යන පරිදි මෘත්‍යුමාර විසින් සතර අපාය නැමැති මුහුදට රැගෙන යයි.

මේ විෂකුරු සසරේ අප ලද මිනිසත් භාවය මුළාවට නොව සසරින් මිදීම පිණිස යොදාගෙන කටයුතු කිරීම වැදගත් බව මේ ධම්මපදයෙන් ප්‍රකාශ වෙයි. ඔබ සැමට ඒ දහම් මඟ විවර වේවා.

## බුදු වදනින් කායිකව නිරෝගි වෙමු


08 පිටුවෙන්...

- සබ්බංහත්ථං මුඛේ පක්ඛිස්සා මීතිසිකඛා කරණියා (ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරිම)
- න සකබළෙන මුඛේ නබ්‍යාහරිස්සිමී තිසික්ඛාකරණියා (ආහාර මුඛයේ තිබියදිකතාකිරිම)
- න පිණ්ඩුක්ඛෙපකං පුද්ගල කායික නිරෝගිබව සඳහා බුදුරදුන් ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි "සක්මන් මළුව" අනුමත කොට ඇත. එමෙන්ම සාමණේර භික්ෂුවගේ දින චරියාව තුළ එන "මළු පෙත්මං හැමද නිමවා... " යන්නෙන් මිදුල් අතුගෑම, කැලි කසල ඉවත් කිරිම, තණ කොළ ගැලවිම ආදි ක්‍රියාකාරකම් මගින් ශාරිරික ව්‍යායාමයන් සිදුවේ. නූතනයේ ව්‍යායාම පිළිබඳ නිතර කතාබහට ලක් වේ. එය කායික නිරෝගි බවට අත්‍යවශ්‍ය සාධකයකි. බුදුරදුන් එය මීට වසර 2606ට පෙර දේශනා කොට ඇත. තවද බුදුරදුන් කායික රෝගාබාධවලට නියම කළ ඖෂධ මහාවග්ග පාළියේ භේසජ්ජක්ඛන්ධකයේ සඳහන්වේ.
- **සර්ප විෂට** -
මළමුත්‍ර උණු අලු හාමටි
- **පාණ්ඩුවට** -
ගව මුත්‍රයෙහි දැමූ අරළු
- **උදරවාතාබාධ** - ලුණුකාඩි
- **වස පෙවුන විට** -
අසුචි දියකර පෙවීම
- **වණයට** -
අබ කුඩු එළිම/නස්‍ය කිරිම
- **ඇස් ලෙඩ** - අඳුන් ගෑම
- **ඇඟ කැසීම** -
ගොම මැටි තම්බා ගත් කහට කුඩු
- **හන්දිපත් වේදනාව** -
ලේ ඇරිම
- **කකුල් පැලීම** -
පය තෙල් ගැල්වීම
- **තුවාල** - කහට වතුර
- **ඉනා බෙහෙතක් කැවුන විට** නගුලේ හීවැලේ ඇලුණු මඩ ජලයෙන් දියකර පෙවිම
- **මස්දලුව** -
ලුණු කැටයකින් කැපීම

මීට අමතරව නොයෙක් බෙහෙත් සඳහා වලගසාල්, තිප්පිලි, ගම්මිරිස්, අරළු, බුලු, කළුලුණු, සිඳි ලුණු, බළල් ලුණු, කොසඹ කොළ, කෙළිඳ කොළ, දුම්මැල්ල කොළ, කපුකොළ, කහ ඉගුරු, වදකහ කටුකරෝසන, සැවැන්දරා, කලාදුරු වැනි වර්ග අනුමත කොට ඇත.

යථොක්ත කරුණු අනුව බුදුරදුන් යනු ශ්‍රේෂ්ඨ කායික වෛද්‍යවරයෙක් බව මින් සනාථ වේ.

# සුරස අතිරේකය




# තම දියණියට ජීවිතයේ අපූර්වත්වය කියාදෙන පියෙකුගේ හෘදස්පන්දනය කියැවෙන ගීතයක්........

මගේ දුවේ ඔබ අවදියෙන් නම්
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මේ මිහිරි දේවල් දූ

සේපාලිකා මල් බිමට බැහැලා
ඇවිදින්න යන වෙලාවයි
නිල් තාරකා බිම බලාගෙන
වැව් දියට පෙම් බැඳි වෙලාවයි
මේ පොළව කොතරම් සුන්දරද
මගේ දූ තනියම හිනාවෙයි

සණ කළුවරට අප පෙම් කළොත්
ඉර හඳ තරුවලට ණය ගැතියි
ලොව දුන්නු දේවල් අද අපට
හෙට ලොවට පෙරළා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
මුළු ලොවම ඔබටත් ආදරෙයි.

**ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ**
**සංගීතය හා තනුව - රෝහණ වීරසිංහ**
**ගායනය - කරුණාරත්න දිවුල්ගනේ**

දිහවල පමණක් නොවේ ඇතැම් විට අප රාත්‍රියද නිදිවර්ජිතව පහන් කරමු. එහෙත් සැබවින්ම අප සිටින්නේ අවධියෙන්ද?

අප වටා පවතින ලෝකය සැප සම්පතින් පිරී ඇත. ඇඟිලි තුඩු මෙහෙයවමින් අපට ක්ෂණයෙන්ම අන්තර්ජාලය හරහා ලොව වටා සැරිසරන්නට පුළුවන. බොත්තමක් එබූ සැනින් මහල් තිහක ගොඩනැගිල්ලක ඉහළ මාළයට ගමන් කරන්නට අපට පුළුවන. ගගන ගාමීහු පෘථිවිය හා සමාන තවත් ග්‍රහලොවක ජනපද බිහි කරන්නට සිහින මවති. මේ තාක්‍ෂණික විප්ලවය මැද අප සිටින්නේ අවධියෙන්ද?

කාර්මීකරණය තුළ මිනිසා කාර්මික මිනිසෙකුව" ඇති බව ටොම් බර්න් පවසයි. මින් හැඟෙන්නේ තාක්‍ෂණිකව දියුණු වන්නට වන්නට මිනිසා යන්ත්‍රයක් බවට පත්වන බව නොවේද? යාන්ත්‍රිකරණය වූ සමාජයක් දිවිගෙවන මිනිසාට අවධි වූ මනසක් කොයින්ද? ඔහු හුදු යන්ත්‍රයක්ම පමණි. ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම්ද යාන්ත්‍රීකරණය වී අවසන්ය. වහල් යුගය අවසන් වූවද මිනිසා යාන්ත්‍රීකරණය තුළ වහලෙකු වී ඇත. යම් කිසි රටාවකට සකස් කරන ලද යාන්ත්‍රික ක්‍රියාවලියක නිරතවන මිනිසාගේ තාර්කික බුද්ධිය, සංවේදී බව, මානුෂීය හැඟීම් නිද්‍රෝප ගතවී ඇත. එනිසා අප දෙනෙත් හැරගෙන නින්දේ පසුවෙමු.

යාන්ත්‍රිකරණ ජීවිත රටාවේ නින්ද්‍රෝපගත මනසින් කටයුතු කරන්නාවූ අප විඳිය යුතු ජීවිතය විඳවමින් සිටින්නෙමු. රත්න ශ්‍රී විජේසිංහයන් අප අමතන්නේ විඳවන්නාවූ නිද්‍රෝපගත ජීවිතයෙන් මිදී යළිත් අවධිවන්නටය.

ඇතැම් විට ජීවිතයේ සොඳුරු බව අපට දැනෙන්නේ විශ්‍රාමික සුවයෙන් පසුවන විටය. එහෙත් පරිසරයේ සුන්දරත්වය විඳින්නට සොඳුරු තැන් සොයා යන්නට කායික දුර්වලතා බාධාවක් වේ. ජීවිතයේ සුන්දරත්වය හොඳින්ම වින්දනය කළ හැක්කේ තාරුණ්‍යයේ හා ළමා අවධියේ පසුවන්නන්ටය. එහෙත් දෙමාපියන්ගේ අනාගත සිහින රාජ්‍ය අභිශේක දරන්නට ඔවුන්ටද අධිඅවේගී ගමනක යෙදෙන්නට සිදුව තිබේ. එනිසාම නින්ද්‍රෝපගත යාන්ත්‍රික ජීවිතය තුළ තමාගේ සොඳුරුතම කාලයද ඔවුන් ගෙවන්නේ වෙහෙසට පීඩාවට පත් වෙමිනි.

මේ මොහොත මනස යළි අවධි කරන්නට සුදුසුම කාලයයි. චිත්ත පීඩාවන්, වෙහෙස ආදිය පසෙකලා ජීවිතය දෙස බලන්නට දොර හැරිය යුතු කාලයයි.

ගාමිණී කුමාර විතානයන් ගේ ''සිත් පහන් වේවා" කෘතියෙහි ඇමරිකානු ස්වදේශික චිනුක් ගෝත්‍රික ආශිර්වාද යාඥාවක් මෙසේ සඳහන් වේ.

අප කතා කරමු වන අරනට
සවිමත්ව අහසට නැගෙන මහා වනස්පතියනට
මුල්, පොළෝ ගැඹුරෙහි වුව
අතු පතර දෙව් ලොවයි
ෆර් - පයින් සිඩාර් - මහා වනස්පතියනි
අප ඔවුන් විමසමු
උගත් වනු මැන අපට
මඟ කියා දෙනු මැනව
සයුර හා වන පියස් කෙත් බිම්හි
සරණ හැම සතුන් ගෙන්
වෘකයන් - මුවන් - රාජාලි - කොබෙයියන්
මහා තල්මසුන් - මුල්ලන් - රමණීය මාරක තල්මසුන්
සහ සැමන් මසුන්ගෙන්
වයඹ වාසී අප සමඟ
ජීවත්ව කල් ගෙවන
අප ඔවුන් විමසමු
උගැන්වුව මැන අපට
මඟ කියා දෙනු මැනව

තාරකා, සඳ මඬල, සූර්යයා
රිද්මය සහ ජීවිතයේ සෘතූන් පාලනය කරනා
අපූර්ව හා ශ්‍රේෂ්ඨ විශ්වයේ කොටසක් බව අප
සිහිපත් කර දෙවනා
අප ඔවුන් විමසමු
උගැන්වුව මැන අප හට
මඟ කියා දෙනු මැනව

මිනිසා මේ විශ්වයේම එක කොටසක් පමණි. සත්ව වර්ග තුළ වර්ගීකරණයට ලක්වන එක්තරා සත්ව වර්ගයක් පමණි. එහෙත් අපට ඒ බව අමතකය. මුළු විශ්වයම තමාගේ යැයි සිතමින් විශ්වය දිනන්නට වෙරදරන මිනිසා තම කෙටි ජීවිතය නිම කරනුයේ සංතෘප්ත නොවූ මනසකිනි. තම ජීවිතයේ අරුත තමා වටහා නොගත් බව තමා පසක් කරනුයේ අවසන් මොහොතේය.

සොබා දහමේ කොටසක් වන මිනිසාට සොබා දහමෙන් වියුක්තව ජීවත් විය නොහැක. කෘතීම පරිසරය තුළදී මිනිසා කායිකවත් මානසිකවත් පීඩාවට පත්වන්නේ එහෙයිනි. කලාව, සංවේදීත්වයද ඔහු උපතින්ම උරුම කරගත් දේය. ජීවත්වීමේ කලාව තුළ ඇත්තේද සොබා සෞන්දර්ය ජීවිතය හා කලාව වින්දනය කරමින් ආතතියෙන් තොරව ගමන් කරන ආකාරයයි. පෘථිවිය මත මැවෙන සුන්දරත්වය හදවතින්ම විඳිමින් ජීවිත ගමන වින්දනාත්මක එකක් කරගන්නට රත්න ශ්‍රී අපට ඇරයුම් කරයි.

මලට හානියක් නොකර මලෙන් රොන් ගන්නා බඹරෙකු සේ ජනතාව නොපෙලා අයබදු එකතු කරගත යුතු බව බුදු දහමේ සඳහන් වේ. පෘථිවියටත් පෘථිවිවාසී සහෝදර ජීවීන්ටත් හානි නොකර මල් නොතලා මල් පැනි බොන බඹරුන්සේ සම්පත් පරිභෝජනය කරන්නට අප හුරු විය යුතුය. අද අප භුක්ති විඳින්නාවූ සියල්ල අනාගත පරම්පරාවෙන් ණයට ඉල්ලා ගත් දේය. දකුණු ඇමරිකානු චිනුක් යාඥාව අවසන් වන්නේ මෙලෙසිනි.

මිහිතලය මත දිවි ගෙවන හැමෝගෙම
අපේ මී මුතුන් සහ නෑ මිතුරන්ගෙන්
අනාගත පරපුර ගැන සුබ සිහින දකින්නන්ගෙන්
ඔවුන් ජීවිත හා අපේ ජීවිත තැනූ අයගෙන
ස්තූති පූර්වකව කෘතවේදීව
අප ඔවුන් විමසමු
උගන් වූව මැන අපට
මඟ කියා දෙනු මැනව
අන්තිම මට............

අප දරාසිටින
ඉමහත් ශුද්ධ හා පවිත්‍ර
ආදරයේ හා සත්‍යයේ - මහා ආත්ම බලය
නියොජනය කරන
සකල විශ්වය පුරා ගලන..........
අප සමඟ පවතින
අප ඔවුන් විමසමුඋගැන්වුව මැන
අපට
මඟ කියා දෙනු මැන අපට

ශිෂ්ට යැයි සම්මත මිනිසුන් ගහ, කොළ, සතා සීපාවා විනාශ කරමින් පෘථිවිය තම අණසකට ගන්නට වෙර දරති. අනෙකුත් ජීවින්ගේ ජීවත් වීමේ අයිතිය සොරා ගනිමින් ඔවුන් සතු බිම් කඩට තම වර්ගයා සමඟින්ම සටන් වදිති. එහෙත් අශිෂ්ට වනචාරීහූ මිහිමවගේ දරුවන්ව තමා මිහිමත දිවි ගෙවන අනෙකුත් ජීවීන් ගහා කොළ ගංඟා සහොදරත්වයෙන් සලකති. එසේ නම් මිලේච්ඡයින් වන්නේ ශිෂ්ට යැයි පවසන අපමය. සියැටල් වැනි රතු ඉන්දියානුවන් හා අනෙකුත් ගෝත්‍රිකයන් සොබා දහමේ දරුවන්ව ජීවිතය මැනවින් වින්දනය කළහ. ඔවූහූ අවධිවූ මනසකින් දිවි ගෙවන සැබෑ බුද්ධිමතුන් වෙති.

අපගේ අධිවේගී යාන්ත්‍රික දිවි පෙවෙත නවතා සොබා දහමට කලාවට අනුගත වෙමින් ජීවිතයේ සාරය සොයා යන්නට රත්න ශ්‍රී අප පොළඹවයි.

සොබා දහමේ සුන්දරත්වයත් කලාවත් එක්වූ විට මැවෙන්නේ අපූර්ව සුන්දරත්වයකි. රාත්‍රිය සුවඳවත් කරන සේපාලිකා මල් බිම විසිරී තිබේ. රත්න ශ්‍රී දකින්නේ සේපාලිකා රාත්‍රියේ සුන්දරත්වය දකින්නට ඇවිද යන අයුරිනි. තාරකාවල ආලෝකය දිය මත වැටී ඇති අයුරු පෙනෙන්නේ ඔවු නොවුන් ළංවී පෙම් බස් දොඩන පෙම්වතුන් ලෙසිනි. මේ සියලු සොබාදහමේ සුන්දරත්වයටත් අපට ජීවිතය ලබා දුන් අයව ජීවත් කරන මිහි මවට අප ස්තූති පූර්වක විය යුතුය. අප අද භාවිතා කරන සම්පත් හෙට ලොවට පෙරලා දිය යුතුය. මිනිසුන් සතුන් හා පරිසරය සමඟ හෘදයාංගවම බැදී දිවි ගෙවිය යුතුය. අවධි මනසකින් ජීවිතය වින්දනය කළ හැක්කේ එවිටය. රත්න ශ්‍රී අපට දෙන උපදේශය දූ දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද පොදුය.

තම දියණියට ජීවිතයේ අපූර්වත්වය වටහා දෙන පියෙකුගේ ස්වරූපයෙන් ගීතය ලියවී ඇති නිසා මේ පද පෙළ හෘදයාංගවම අපට දැනෙයි. කරුණාරත්න දිවුල්ගනේගේ හඬ පියෙකුගේ ස්වරයෙන් අප හදවතට සමීප වෙයි. රෝහණ වීරසිංහ නම් සෞන්දර්යය වේදියාගේ සංගීතය හා තනුව රත්න ශ්‍රීගේ අරමුණ සාක්ෂාත් කර ඇත.

**චාමිකා ජනානි ද සිල්වා**

# භික්ෂුණී ශාසනය ස්ථාපිත වූ උඳුවප් පොහොය



**බුද්ධ වර්ෂ ක්‍රමයෙන් නම් අටවෙනි පොහොය උඳුවප් පොහොය වේ. ව්‍යවහාර මාස ක්‍රමයෙන් 12 වෙනි පොහොය උඳුවප් පොහොයයි. කාන්තාවන්ට විමුක්ති මාර්ගය උදා කළ පොහොය උඳුවප් පොහොය වේ.**

පෞරාණික භාරතයේ රජුවූ බ්‍රාහ්මණ මති මතාන්තර අනුව ජාතික හෝ ආගමික නිදහසත් අහිමි වූ පිරිසක් ලෙස කාන්තාවට ස්වතන්ත්‍රව සමාජයේ හැසිරීම වාරණය වී තිබිණි. පවුලේ කුළුදුල් දරුවෙකුව දූරියක උත්පත්තිය පවා අනර්ථයකැයි සැළකූ ස්ත්‍රිය වැන්දඹුවක වන්නේ නම් සති පූජා කළ යුතු යැයි ඇදහූ යුගයක් විය එදවස.

එවන් පසුබිමෙක කාන්තා නිදහස සාක්ෂාත් කරමින් අප බුදුපියාණන් වහන්සේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් විමුක්ති මාර්ගය හිමි කර දුන්නේ මේ උඳුවප් පොහෝ දිනකය. බුද්ධත්වයෙන් පස්වැනි වසරේදීය. මහා ප්‍රජාපතී ගෝතමී, ඛේමා, නන්දා, යශෝදරා ඈ රාජකීය කාන්තාවන් සසුන් ගතව භික්ෂුණී ශාසනය පිහිටවනු ලැබුවද වත්මනෙහි එය ඒකාන්තයෙන් පිළිගැනීමට මැලිවීම කෙසේ සාධාරණිය කළ යුතුද යන්න ප්‍රශ්නකාරීය.

අනුබුදු මිහිඳු හිමිපාණෝ ශ්‍රී ලංකාද්වීපයට වැඩමවීමෙන් දෙරටක රාජ්‍යත්වය වඩාත් ස්ථාවර වත්මන් දඹදිව අශෝක අධිරාජ්‍යයා සහ දේවානම්පියතිස්ස නරපතියාත් රජකරන සමයකය. එදවස වුවද මෙරට කාන්තාවන් නිදහස් වූයේ නැත.

එසේ වුවද ඒ වෙනස තුනී කෙරුණු සංඝමිත්තා මහා තෙරණින් වහන්සේගේ ලංකාගමනය පරිපූර්ණ වූයේ ද උඳුවප් පොහෝ දිනකය. සංඝමිත්තා තෙරණින් වහන්සේගේ ලංකාගමනය හිස් අතින් වූවක් නොවේ. ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ.

**ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ. ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වූයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබුණ වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි.**

ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වූයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබීමෙනි. එහි වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි. දේශීය කාන්තාවන් පන්සියයක් දහම අසා පැවිදිවීමට කැමැති වන්නේද මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

ශ්‍රී ලාංකික ස්ත්‍රී වර්ගය තුළ අපරිමිත වෙනසක සන්ධිස්ථානය සඟමිත් තෙරණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය සනිටුහන් කරයි. එසේ ඇරඹුණ සිරිලක භික්ෂුණී ශාසනයේ තෙරණීන් වහන්සේ වරෙක චීන දේශයේ භික්ෂූනී ශාසනය පිහිටුවීමට ද පෙරමුණ ගත් වග ශාසන ඉතිහාසය පෙන්වා දෙයි. එසේ වැඩම කළේ දේවසාරා තෙරණින් වහන්සේය.

සමසක් වැනි කෙටි කාලයකින් අනුලා දේවියගේ සසුන් ගතවීමෙන් මෙරට ඇරඹී භික්ෂුණී සංඛ්‍යාව හතලිස් දහසක ඉක්මවූ බවද දැක්වේ. දුටුගැමුණු රජ දවස මිරිසවැටි පුජෝත්සවයට භික්ෂුණීන් වහන්සේ අනූදහසක් සැපත් වූ බවද වංශකථාවේ දැක්වේ.

රුවන්වැලි සෑ රඳුන්ගේ සමාරම්භක උත්සවය දා පියදස්සී තෙරණින් වහන්සේ දෙසූ දහම් සූත්‍රය ඇසූ දහ හතර දහසක් කාන්තාවන් ධර්මාවබෝධය ලැබූ වග මහා වංශයේ 29 වන පරිච්ඡේදයේ පෙන්වා දෙයි. මහිලා, ගිරිකාලී, දාසී, සමණා ආදී වූ භික්ෂුණීන් වහන්සේ පස් නමක් රුහුණේ සිට අනුරාධපුරය වැඩ කර විනය ඉගැන්වූ පුවත දීප වංශයේ දැක්වේ. බැමිණිතියා සාය පැවැති යුගයේ පවා උන් වහන්සේ ශාසන උන්නතිය වෙනුවෙන් පෙනී සිටියහ. පොලොන්නරු යුගයේ මහා මල්ලක නම් වූ භික්ෂුණී ආශ්‍රමයක් සිව්වන මිහිඳු රජතුමා විසින් කරවා පූජා කරන ලද බවද දැක්වේ.



එසේ නම් භික්ෂුණී සසුන අපේ රටෙන් අතුරුදහන් වීමේ ඛේදවාචකය කුමක් වුවද අද වන විට මෙරට කාන්තාවන් අත්පත් කරගත් වරප්‍රසාද බොහෝය. රජයේ රැකියාවන්ට පමණක් නොව දේශපාලනයට ද කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනයට ඉඩකඩ හිමිය.

එසේ නම් රංගිරි දඹුලු රජ මහා විහාරය මුල්කොට ගෙන පූජ්‍යපාද ඉනාමලුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ප්‍රමුඛ එම සංඝ සභාව යළි භික්ෂුණී ශාසනය පිහිටුවීමට ගත් මුලිකත්වය අතිශය සාධනීය පියවරක්ම බව සිහි කටයුතු එය අප රජ දවස භික්ෂුන් වහන්සේට ලැබුණ තැන ගෞරවය යළිත් එලෙසම සිදුවිය යුතු අතර එය අවප්‍රමාණ කිරීමට යම් යම් අංශවල අදහස් කර පරිශ්‍රමයක් දරත් නම් එය මඟහැරවීම මගින්ම පමණක් භික්ෂුනී සසුන සුරක්ෂිත කරවීම උතුම් ක්‍රියාවකි.

දිවයින පුරා විහිදී සිටින තෙරණින් වහන්සේ නිස්සරණාධ්‍යාසයෙන් සිදුකරන ශාසනික සාමාජික මෙහෙවර පිළිබඳ අධ්‍යනයක යෙදීමට කාලෝචිතය. බුදුන් වහන්සේ පිහිටුවා වදාළ භික්ෂු, භික්ෂූනී, උපාසක, උපාසිකා හතර වර්ගීකරණය චිරාත්කාලයක් සසුනේ පැවැත්වීමට හේතුවේවා.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
පියදාස රත්නසිංහ

# බුදු දහමින් විමුක්තිය ලද කාන්තාව



ප්‍රාග් බෞද්ධ යුගයේ කාන්තාව සමාජයේ සැඟවුණු චරිතයක් සේම ඇයට ආගමික සාමාජික අධ්‍යාපනික වශයෙන් කිසිම හිමි කමක් අයිතිවාසිකමක් නොලැබිණි. කාන්තාව කෙරෙහි ලබා දුන්නේ අන්ත අසරණ තත්වයක් බව වටහා ගත් බුදුරජාණන් වහන්සේ වනිතාව කෙරෙහි අහිමි වූ ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා සාමාජික යන සියලුම අයිතීන් ලබාදීමට පියවර ගත් සේක. ඒ අංශ අතර දියණියක වශයෙන්, බිරිඳක් වශයෙන්, උපාසිකාවක් වශයෙන්, භික්ෂුණියක් වශයෙන් ලබා දිය යුතු සියලු වරප්‍රසාදයන් හිමිකර දීමට ක්‍රියා කළහ.

බ්‍රාහ්මණ සමාජයේ ඔවුන්ගේ ආකල්පයන් යටතේ දියණියක් බිහිවීම සැලකුවේ පරපුරේ විනාශය ගෙන දෙන අසුභදායක පෙරනිමිත්තක් වශයෙනි. එහෙත් මෙම වැරදි චින්තනය මුළුමනින්ම වෙනස් කිරීමට බුදු දහම කටයුතු කර තිබේ. දියණියක වශයෙන් ඇයට හිමිකර දිය යුතු සියලු වර ප්‍රසාද නොඅඩුව හිමිකර දුන්හ. වර්තමානයේ වුවද එදා ලැබුණු ඒ වර ප්‍රසාද කාන්තාවන් භුක්ති විඳින බව අමතක කළ යුතු නොවේ.

බිහි වූ දරුවා පිළිබඳව සැළකිය යුත්තේ ගැහැණු බව හෝ පිරිමි බව නොව සෑම දරුවෙක්ම දරුවෙක්ය යන, ආකල්පයෙන් ක්‍රියා කළ යුතු බව බුදු දහම පෙන්වා දී තිබේ. එහිදී ස්ත්‍රි හෝ වේවා පුරුෂ වේවා කවර හෝ දරුවෙකු ඇමතීමට බුදුරජාණන් වහන්සේ භාවිතා කළේ "පුත්ථිමා"(පුතා) යන ආදරණීය වචනයයි. මෙයට කදිම නිදසුනක් ලෙස, දිනක් කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ හමු වීමට පැමිණ කණස්සල්ලෙන් සිටීමට හේතු විමසන විට මල්ලිකා දේවියට දියණියක් ලැබුණු බව කණගාටුවෙන් දැන්වීය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ කොසොල් රජුට පැහැදිලි කළේ,

*"ඉත්ථිපිහි ඒකච්චියා සෙය්‍යො පෝස ජනාධිප මේධාවිනි සීලවතී සස්සු දේවා පතිබ්බතා"*

*"තස්සායෝ ජායතී පොසෝ - සූරෝ හෝති දිසම්පති තාදිසා සුභගියා පුත්තෝ - රජ්ජම්පි අනුසාසති"*

රජතුමනි, කනස්සල්ලට පත් නොවන්න. දියණිය පුතෙකුටත් වඩා ශ්‍රේෂ්ඨ විය හැක. සිල්වත්ව පතිවත ආරක්ෂා කර සිට පුතෙකු බිහි කළ හොත් එම පුතණුවන් රාජානුශාසනාවට පවා සුදුසුය. ඔබේ දියණිය ද එවැනි කෙනෙකු විය හැකිය. මේ තුළින් කාන්තාව පිළිබඳ ඇඳ තිබූ වැරදි චිත්‍රය මුළුමනින් ම මකා දැමීමට හැකි විය.

බ්‍රාහ්මණ සමාජය යටතේ කාන්තාවට බිරිඳක් වශයෙන් ද අත් වූයේ ඉතා ශෝචනීය තත්වයකි. එදා බිරිඳට කටයුතු කිරීමට සිදු වූයේ සහකාරියක් වශයෙන් නොව මෙහෙකාරියක් වශයෙනි. නිවසක ප්‍රධානියා විය යුත්තේ ස්වාමියා පමණක් නොව බිරිඳ ද එම තත්වයට පත් විය යුතු බව සූත්‍ර රාශියකින් ම කරුණු දක්වමින් බිරිඳගේ වර ප්‍රසාද තහවුරු කර තිබේ. කාන්තා වරප්‍රසාදයන් තහවුරු කළ බුදුරජාණන් වහන්සේ ඇයට හිමි කර දිය යුතු සමාජමය වරප්‍රසාදයන් පුරුෂයාට සමාන ලෙසින් ම ලබාදී ඇති අයුරු සිඟාලෝවාද සූත්‍රයේ දී මනාව පැහැදිලි වේ.

එහිදී ස්වාමියා විසින් බිරිඳ විෂයෙහි ඉටුකළ යුතු යුතුකම් පහක් සඳහන් කර තිබේ. ගෞරවයෙන් කථා කිරීම, අවමන් නොකිරීම, පර ස්ත්‍රී සේවනයෙන් වැළකීම, ඉසුරු පවරා දීම හා අලංකාර වස්ත්‍රාභරණ ලබා දීම දැක්විය හැක.

මෙහිදි ස්වාමියාට තම අයිතිවාසිකම් පමණක් තහවුරු කොටගෙන හුදකලා වීමට ඉඩ දී නැත. මේ තුළින් බිරිඳකගේ අයිතිවාසිකම් ද ඉටුකර දිය යුතු බව පෙන්වා දී තිබේ. එසේම කාන්තාවට සමාජයේ ගෞරවාන්විතව ජීවත් වීමට ද මේ නිසා ඉඩ ප්‍රස්ථාව ලැබේ.

සංවාස සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර දෙන්නේ ආචාර ධර්මයන්ගෙන් සමන්විය යුතු වන්නේ කාන්තාවන් පමණක් නොව දෙදෙනාම ආචාර ධර්මවල පිහිටා ක්‍රියා කළ යුතු බවයි. එහිදී සමාජයේ ජීවත්වන පවුල් හතරක් පිළිබඳ මෙම සූත්‍රයේ දක්වා තිබේ. එම කණ්ඩායම් වන්නේ,

- **ඡවෝ ඡවාය සද්ධිං සංවසති**
  මළ මිනීයක් මළමිනීයක් සමඟ ජීවත් වීම,
- **ඡවෝ දේවියා සද්ධිං සංවසති**
  මළ මිනියක් දෙව්දුවක හා විසීම
- **දේවෝ ඡවාය සද්ධිං සංවසති**
  දෙවියෙක් මළමිනියක සමඟ විසීම
- **දේවෝ දේවියා සද්ධිං සංවසති**
  දෙවියෙක් දිව්‍යාංගනාවක් සමඟ විසීම ආදියයි.

මෙහිදී බුදුරජාණන් වහන්සේ මෙම කණ්ඩායම් හතරෙන් ම අනුමත කොට ඇත්තේ හතරවන පවුල් ඒකකයයි. මෙහි දී ප්‍රකාශ වන්නේ බිරිඳත් ස්වාමියාත් දෙදෙනාම ගුණ ධර්මවලින් යුක්ත වු අය විය යුතු බවයි. එක් පාර්ශවයක් පමණක් යහපත් ව අනෙක් පාර්ශවය රිසිසේ කටයුතු කිරීමක් මෙහිදී අපේක්ෂා නොකෙරේ. ගුණ ධර්මවලින් යුක්ත වීම දෙදෙනාටම අනිවාර්ය වේ. මෙය වර්තමානයේ පිරිහී යන පවුල් සංස්ථාව නැවත ගොඩ නැඟීමට ප්‍රබල සාධකයක් කොට ගැනීම ඉතා වැදගත් වේ.

සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ භාර්යාවක් සතු විය යුතු උතුම් ලක්ෂණ පහක් පෙන්වා දේ.

- පතිපූජිකා (සිය ස්වාමියා ගරු සරුව පුදන)
- කුල නන්දනී (නෑයන් සතුටු කරන)
- ජනරංජනී (ජනයාගේ සිත් සතුටු කරන)
- ධර්මචාරිණී (සීලා දී ගුණ ධර්මයන්හි හැසිරෙන)
- වරාංගනා (කාන්තාවන්ට උතුම් වන්නී)

යනුවෙන් වරප්‍රසාදයට ලක් වී තිබේ. මෙම උතුම් ලක්ෂණ භාර්යාවක් තුළ එක් එක් වශයෙන් නොව සෑම කරුණක්ම අඩු වැඩි වශයෙන් තම ජීවිතවලට පුරුදු පුහුණු කර ගත යුතුය. ඕනෑම ගෙයක් අලංකාර, ප්‍රිය මනාප, නිවසක් බවට පත් වන්නේ බිරිඳක් නිසාය. ගෙදර දොර කටයුතු මැනවින් පාලනය කරමින් දරුවන් හදා වඩා ගනිමින් බිරිඳක් වශයෙන් උසස් සේවයන් ඇය සලසයි.

"සත්තභරියා" සූත්‍රයෙන් භාර්යාවන්ගේ ලක්ෂණ අනුව කොටස් හතකට වර්ග කර ඇති ආකාරය දැකිය හැකිය.

- මාතු භරියා(මවක් බඳු බිරිඳ)
- භගිනි භරියා (සොහොයුරියක් බඳු බිරිඳ)
- දාසි භරියා ( දාසියක් බඳු බිරිඳ)
- සඛි භරියා (මිතුරියක් බඳු බිරිඳ)
- චෝර භරියා ( සොරක් බඳු බිරිඳ)
- වධක භරියා (වධකාවියෙක් බඳු බිරිඳ)
- සාමි භරියා ( ස්වාමි දුවක් බඳු බිරිඳ)

මොවුන් අතරින් පළමු හතරදෙනා ශ්‍රේෂ්ඨ උතුම් කොට දක්වා ඇත. ඉතිරි තුන්දෙනා ගර්හාවට ලක් කොට ඇත. බුදු දහමේ කාන්තාවකට බමුණු මිථ්‍යා සංකල්ප බැහැර කොට උත්තරීතර නිදහසක් ලබා දී ඇත. බුදු දහමට අනුව කාන්තාවට ලැබිය හැකි උත්තරීතරම පදවිය වන්නේ භික්ෂුණී භාවයයි. ශාසනික දායාදයක් ලබමින් සසර දුක් කෙළවර කොට නිවන් පසක් කර ගැනීමට ද ඒ තුළින් ඇයට ඉඩකඩ සැලසුණි. ථේරීගාථා එයට නිදසුන්ය.

15 පිටුවට...

ශාස්ත්‍රපති
පානදුරේ උප්පලවණ්ණා දීපනී
මෙහෙණින් වහන්සේ
ශ්‍රී උත්පලාරාමය, වැල්ලව



# පස්කම් සැපයට ගිජුවී නොයමු අප සැම නිරයට

අද ලොව කැළඹෙන්නේ කරුණු තුනක් පාදක කරගෙනයි. පළමුවැන්න අධිසුඛෝපභෝගී ජීවන රටාවකට කෑදර වූ බලවතුන් ලෝකයේ සම්පත් බහුතරයක් තමා සතුකර ගැනීමේ තෘෂ්ණා බරිත අධිවේගී ගමනයි. දෙවැන්න නම් තමන් පමණක් බලවතා විය යුතු යැයි පුද්ගලයින් හා රටවල් අසාධාරණ මිථ්‍යාමතයක එල්ලී තමා පරයා නැගී සිටින්නවුන් පාගා දැමීමට ගෙනයන තරඟකාරි ක්‍රියාමාර්ග. තුන්වැන්න නම් ඉහත කී දෙපාර්ශවය විසින් විශ්වයට මුදාහරින නරක දුෂ්ට සිතුවිලි තරංගයක් මගින් සත්ව සහතිකයේ පැවැත්මට සුභවාදී මෙහෙවරක් යෙදුනු ස්වභාව ධර්මයේ ක්‍රියාදාමය විකෘතිය ගෙන දෙන පීඩා.

බුදුරජාණන් වහන්සේ පිවිතුරු දහම් මඟට පිටුවා විකෘති මානසිකත්වයෙන් යුක්ත වූ මිනිසුන් ගෙනයන මේ අපරාධකර ක්‍රියාමාර්ග අභිමුඛයෙහි අප කුමක් කළ යුතුද? නොදරුවන් රෙදිපිළි ගේ දොර අපිරිසිදු කරයි. වැඩිහිටියන් ඒවා පිරිසිදු කොට යථා තත්වයට ගනී. අනුවණ වූ මිනිසුන් ලෝකය වනසද්දී නැණවතුන් යළි යළිත් එය සනසාලිය යුතුය.

පව්කාරයන්ගේ සිත්වලින් මුදාහරින දූෂිත චේතනා මර්ධනය කොට බලවත් ලෙස නැගී සිටිය හැකි යහපත් චේතනා යහපත් මිනිසුන් විසින් මුදාහල යුතුය. ඉවසීම, කරුණාව, මෛත්‍රිය වැනි බුද්ධ පාක්ෂික සාධු චරියාවන් ඒ සඳහා යොදාගත හැකිය. දූවෙන සිත් නිවන්න, මෙත් වඩන්න, සෙත් පතන්න. එවිට අපට ලෝකය නිවැරදි කිරීමට දායක විය හැකිය. ධම්ම පදයෙන් උපුටාගත් මේ ගාථා ධර්මය කියවා බලන්න.

*" පුප්ඵානිහේව පචිනන්තං*
*භ්‍යාසත්ත මනසං නරං*
*සුත්තං ගාමං මහෝ ඝොව*
*මච්චු ආදාය ගච්ඡති "*

කාමය, ලෝක පැවැත්ම තහවුරු කරන තදබල බැඳීමකි. ලෝකය ලෙස අදහස් කළේ පෘතුවිය හෝ වෙනත් ග්‍රහලෝකයන් ගැන නොව අපගේ මේ ස්කන්ධ පංචකයයි. (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ) භාවය ලෙසද මේ ලෝකය හඳුන්වයි. ආත්මභාවය ලෙස එයට උරුමයක් ද ලබාදී තිබේ. මේ ආත්මභාවය නැමැති ලෝකය මගේ ලෝකය ලෙස අයිතිකරගෙන සැප සොය සොයා වෙහෙසෙන්නේ කාමයේ උත්තේජනය පදනම් කරගෙනයි. වස්තු කාම, ක්ලේශ කාම යැයි කාමය දෙවැදෑරුම්ය. ගේ දොර, වතු පිටි, ඉඩ කඩම්, යාන වාහන, මිල මුදල් ඇඳුම් පැලඳුම් ආදී ආකර්ශනීය යුගලපද ලේඛනයකින් හඳුන්වා ඇති සකලවිධ වස්තු සියල්ල කෙරෙහිම අප තුළ ඇති ආශාව වස්තු කාම ලෙසත්, ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා පංචකාම (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ) කෙරෙහි පවතින දැඩි ආශාව ක්ලේශ කාම ලෙසත් බුදුදහමේ හඳුන්වා තිබේ. මේ සියලු ආකාරයේ කාමයන් කෙරෙහි බැඳී ලද දෙයින් තුටු නොවී නොලද දෙය ගැනම සිත සිතා දුක් වෙවී අකුසල් සිත් උපදවා මරණින් පසු දුගතියෙහි උපදින බවයි. මේ ගාථා ධර්මයෙන් කියා දෙන්නේ.

සැවැත්නුවර පසේනදී කොසොල් රජතුමා දිනක් උඩු මහලේ සිට මහමඟ ගමන් කරන පිරිස් දෙස බලාසිටියදී සිත් පහන් කරවන දසුනක නෙත ගැටුණි. එනම් විශාඛා සිටු දියණිය අනේපිඩු සිටුතුමා ආදී සැදැහැ සිත් ඇති මහෝපාසිකාවනගේ නිවෙස් කරා දන් පිණිස වඩින භික්ෂූන් වහන්සේලාගේ දසුනයි.

අනතුරුව කොසොල් රජතුමා ද බුදුරජාණන් වහන්සේ බැහැදක තම නිවසට ද දන් පිණිස වඩින ලෙස බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළහ. මේ අනුව සත්දිනක් මුළුල්ලෙහි බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් පිළිගැන්වූහ. සත්වන දිනයේ දී ද මහ රජු පසුදින දානයට ආරාධනා කරද්දී බුදුවරු දින හතකට වඩා එකම ස්ථානයකින් නොවළඳන්නේ යැයි දේශනා කළ බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව ආනන්ද මහ තෙරුන් වහන්සේ වෙත භාර කළහ.

ආනන්ද මහ තෙරුන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ සතියක් එහි පිළිවෙලින් දන් වැළඳූහ. අටවෙනි දිනයෙහි කොසොල් රජතුමා රාජකාරි කටයුතු වෙනුවෙන් වෙන්වී දානමය කටයුතුවල යෙදීමට නොහැකි විය. රජ ගෙදරින් අණක් නොලැබුණු කල්හි එහි සේවක සේවිකාවෝද දන් පිළියෙල කිරීමෙහි නිරත නොවී සිටියහ. දානය පිණිස මාළිගාවට වැඩි බොහෝ භික්ෂූන් වහන්සේ බලා සිට කල් ඉකුත්ව ඇති බැවින් ආපසු වැඩම කළහ. එදින මහ රජු පන්සීයක් දෙනා වහන්සේ සඳහා පිළියෙල කළ ආහාර එසේම තිබෙනු දැක කිපී බුදුන් වහන්සේ වෙත ගොස් භික්ෂූන් මා ගැන නොසිතා යාමට හේතුව කුමක්දැයි ප්‍රකාශ කළහ. එවිට තථාගතයන් වහන්සේ භික්ෂූන් අතර වරදක් නැත මහරජ, ඔබ කෙරේ මගේ ශ්‍රාවකයන් තුළ කිසිදු විශ්වාසයක් නැත. එනිසා එහි නොගියේය. යනුවෙන් වදාළ සේක. එහිදි තථාගතයන් වහන්සේ භික්ෂූන් අරඹයා කරුණු නමයක් පෙන්වාදී භික්ෂූන් වහන්සේලා එම ස්ථානවලට පමණක් යා යුතු යැයි දේශනා කළහ. එම ස්ථානයන් මෙසේය.

- භික්ෂූන් එනු දැක සතුටු සිතින් නැගිට සිටීම
- සතුටු සිතින් වඩා හිඳුවා පසඟ පිහිටුවා වැඳීම.
- සතුටු සිතින් සුදුසු අසුන් පනවා වඩා හිඳුවීම.
- ඇති දෙය නොසඟවා දීම.
- බොහෝ ඇතිවිට බොහෝ කොට දීම.
- මිහිරි දෙයම සකස් කොට දීම.
- දෙන දෙය සකස් කොට දීම.
- අනුමෙවෙනි බණ අසන්නට ලැදිව හිඳීම.
- බණ අසන විට කන්දී මනාව ඇසීම.

මෙම දේශනාව අවසානයේ රජතුමා තීරණය කළේ බුදුරජාණන් වහන්සේ ඥාතී සම්බන්ධතාවයක් තිබෙන නම් මෙතරම් මා අවතක්සේරු නොවනු ඇත කියාය. උන්වහන්සේ ඥාතී කුලයකින් විවාහයක් කරගතහොත් බුදුන් වහන්සේ ඥාති රජවරුන් නිතර මා හමුවීමට පැමිණේවි යැයි සිතා මට සරණ පිණිස දියණියක් එවන්න යැයි ශාක්‍යයන් වෙත පණිවුඩයක් යැවීය. කුලමානයෙන් මත්ව සිටි ශාක්‍යවංශිකයෝ තම වංශයට නොගැළපෙන රජකෙනෙකුට සිය කුමරියන් පාවාදීමෙන් සිය වංශයට සිදුවන හානිය සළකා මහානාම ශාක්‍ය රජහට දාව දාසියකගේ කුසින් උපන් වාසභ ඛත්තියා නම් තරුණියක් ඒවා කොසොල් රජ මුලා කළේය. ඇය නොබෝ කලකින් බිහිකළ පුතු විඩූඩභ නම් විය.

විඩූඩභ කුමරු දාසය වන වියට පත් කල්හි මුතුන් මිත්තන් දකින්නට කිඹුල්වතට ගොස් ආපසු පැමිණි විට දාසියකගේ පුතු වාඩිවූ පුටුව යැයි කියමින් සේවිකාවක් ඔහු වාඩිවූ පුටුව යැයි කියමින් සේවිකාවක් පුටුව සෝදන්නට විය. විඩූඩභ කුමරුගේ සේවා භටයෙක් සිය ආයුධයක් අමතකවීම නිසා රැගෙන එන්නට ආපසු ගියවිට මේ ක්‍රියාව දුටුවේය. ඔහු සැනෙකින් පැමිණි කුමරුට සියළු තොරතුරු දැන්වීය. කුමරු ඒ අසා කුපිතව යම් දිනක මා රජ වූ විට ඔවුන්ගේ බෙලි කපා ලේ වලින් මා හුන් ඒ පුටුව සෝදවමියි අදිටන් කොට ගෙන සිටියේය. කොසොල් රජු මිය ගිය විට විඩූඩභ රජ පැමිණ නොබෝ දිනකින් ශාක්‍යයන්ට එරෙහිව යුද සෙනඟ පිරිවරා කිඹුල්වතට යාමට පිටත් විය.

බුදුරජාණන් වහන්සේ එදවස ලොව බලා වදාරා තම ඥාතින්ට එරෙහිව විඩූඩභ යුද වදින්නට සැරසෙන බව දැන එහි වැඩම කොට අතරමඟ තනී සෙවණ සහිත ගසක් මුල වැඩ සිටියහ. විඩූඩභ බුදුරජාණන් වහන්සේ දැක සමීපයට ගොස් වැඳ මෙසේ විමසයි.

15 පිටුවට...

ශාස්ත්‍රපති
වික්‍රමසිංහ අතපත්තු

රංගිරි ශ්‍රී ලංකා 2019 දෙසැම්බර්- 2563 උදුවප් කලාපය

# කතිකාවත් පිළිබඳ විමසුමක්........

**'කතික වත්තං' යනුවෙන් පෙළ බසින් හැඳින්වෙන කතිකාවත් ඓතිහාසික පක්ෂයෙන් වැදගත් කරුණු රැසක් අනාවරණය කරන්නා වූ ලේඛන විශේෂයක්ම ය. දෙදෙනකු හෝ එයට වැඩි පිරිසක් හෝ එක් වී සාකච්ඡා කොට බැස ගන්නා පොදු සම්මුති කතිකාවත් නම් වේ. මේවා වනාහි ප්‍රබන්ධ නොවන ගද්‍ය විශේෂයක් වෙයි. එසේම ලංකා ඉතිහාසය පිළිබඳව සලකා බැලුවහොත් සම්බුද්ධ ශාසනය පිරිහෙමින් පැවති අවස්ථාවන්හි ධර්ම විනයධර මහ තෙරවරු එක්ව සාකච්ඡා කොට ශාසන පරිහානිය වලක්වා ලීමට රාජ්‍ය අනුග්‍රහය ලබා ගනිමින් සම්මත කර ගන්නා ලද පොදු ව්‍යවස්ථා 'සාසන කතිකාවත්' නම් වේ.**

මෙම කතිකාවත් රචනයෙහි පරමාර්ථයන් රැසකි. එනම්,

- ශාසන අර්බුදයක් පැනෙන කල්හි ශාසන ශුද්ධියක් ඇති කොට පරිහානි අවස්ථාවෙන් බේරා ගැනීම.
- අනාගතයේ එවන් වාතාවරණයන්ගෙන් සසුන මුදවා ගැනීම.
- ශාසනය විනාශ කරන අර්බුදකාරී පුද්ගලයින් සසුනෙන් නෙරපීම හෝ ඔවුන් නිවැරදි මඟට ගැනීම.
- කලානුරූපීව වෙනස් වන ධර්ම හා විනය කරුණු මොනවාදැයි සාකච්චා කොට කාලයට ඔබින සේ සකසා ගත යුතු කරුණු මොනවාදැයි සම්මත කිරීම ආදී කරුණු මෙහිලා ප්‍රධාන වෙයි.

කතිකාවත්හි ඉතිහාසය සලකා බැලීමේදී එය අශෝක සමය දක්වාම දිවෙන්නකි. කතිකාවත් ස්වරූපය දරන ප්‍රථම ලේඛනය වනුයේ භෛරාට් (බාභෘ) ලිපියයි. මෙය මත්ස්‍ය, සූරසේන හා චේදී ආදී පෙදෙස්හි වෙසෙන භික්ෂූන් වහන්සේලාට නිතර නිතර සිහිපත් කරමින් තම බාහිර හා අභ්‍යන්තර සංවර බව රැකීමේ අදිටනින් අශෝක රජු විසින් එළි දැක්වූවකි.
ලක් දෙරණ තුළ හමුවන කතිකාවත් අතර,

- පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු කතිකාවත
- පොළොන්නරුවේ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල කතිකාවත
- වත්හිමි විජයබාහු / සංඝරක්ෂිත හිමිගේ කතිකාවත
- 11 පරාක්‍රමබාහු රජුගේ කතිකාවත
- කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත
- රාජාධි රාජසිංහ කතිකාවත
- V1 පරාක්‍රමබාහු රජුගේ සංඝ සම්මුතිය ආදිය වැදගත් ස්ථානයක් ගනී.

එසේම පූර්ව කතිකාවත් ඇසුරින් කතිකාවත්හි ආකෘතිය සැකසෙනු පෙනේ. එනම් සාම්ප්‍රදායික ක්‍රමය නම්, ' ඇමදෙනා වහන්සේම සමඟින විනය පෙළ අටුවා සහිතව බලා සාකච්ඡා කිරීමෙන් පූර්ව කතිකාවතුත් බලාගෙන මැත භාගයෙහි වරදවා ගෙන පැවත ආ නුසුදුසු කාරණාවලින් දුරුවන සැටිත් එහිම ඇතුළත් කොට ලියා ගෙන.... ' ලෙසින් වෙයි.
උක්ත සඳහන් කරන ලද කතිකාවත් කිහිපයක් පිළිබඳ කරුණු පහත පරිදි පෙළ ගස්වාලිය හැකිය.

## කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත

මෙය සංඝරාජ කතිකාවත ලෙසින් ද හඳුන්වනු ලැබේ. කීර්ති ශ්‍රී රාජසිංහයන්ගේ රාජ පද ප්‍රාප්තියෙන් විසි හත් වසරකට පසුව මෙහි බිහි වී ඇත. මෙය රචනා කිරීමට හේතුව ලෙසින් දක්වා ඇත්තේ සමකාලීන භික්ෂු සමාජයේ පැවති විනය විරෝධි කටයුතු ඉවත් කරමින් භික්ෂු සංස්ථාවේ යහ පැවැත්ම තහවුරු කිරීමට බවයි. මෙහි ආරම්භය සනිටුහන් වන්නේ මෙසේයි.
'

පූර්ව කතිකාවතුත් බලාගෙන මැත භාගයෙහි වරදවා ගෙන පැවත ආ නුසුදුසු කාරණාවලින් දුරුවන සැටිත් එහිම ඇතුළත් කොට...' යනුවෙනි.
එසේම මෙහි මුල් කොටස දඹදෙණි කතිකාවත හා සාම්‍යයක් ඇති බැවින් ඉන් උපුටා ගත්තක් බව සිතිය හැකිය. මෙම කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත 11 පැරකුම් රජ දවස පැවති ශාසන පිරිහීම වැළැක්වීම සඳහා සම්පාදනය වූවකි. මෙයට අනුව,

' අඥාන, දුර්ඥාන, චූලක, අප්‍රතිපත්ති, දුස්ප්‍රතිපත්ති... වන ශාසනාවචර කුල පුත්‍රයෙක් දැක....' ලෙසින් සඳහන් වී ඇත.

මෙම කතිකාවත සලකා බලන කල්හි එහි කරුණු කාරණා රැසක් අන්තර්ගත කරමින් රචනා වූවකැයි පැහැදිලි ය. ඒ කරුණු අතුරින් පහත ඒවා වැදගත් කොට සැලකිය හැකිය.

- මහා පරාක්‍රමබාහු කතිකාවත ගැන තොරතුරු
- උදුම්බරගිරි විහාරවාසී මහා කාශ්‍යප තෙරුන් වහන්සේ විසින් කළ ශාසන මෙහෙවර
- ප්‍රධාන ධර්ම සංගායනා තුන පිළිබඳ තතු
- මහ පැරකුම් රජුගේ සේවාවන්
- තුන් නිකාය සමඟි කිරීම පිළිබඳ
- තැනින් තැන කරවූ මහා විහාරයන් සහ ඒවායෙහි මහා සංඝයා වහන්සේලා වාසය කරවීම පිළිබඳ
- විජයබාහු වත්හිමියන්ගේ කතිකාවතෙහි තොරතුරු අතුරින් සසුනෙහි වියවුල් ඇතිවීම, දෙමළුන්ට බයේ සංඝයා වහන්සේලා පොළොන්නරුව හැර මායා රටට වැඩම කිරීම, රජු විසින් සිවුරු පිරිකර පිදීම හා සංඝ විවාදයන් සංසිඳුවීම සහ දළඳා වහන්සේට තුන් මහල් ප්‍රාසාදයක් කරවීම ආදී පුවත් ප්‍රධාන වෙයි.
- කෝට්ටේ පැරකුම් රජුගේ තොරතුරු අතුරින් ද්‍රවිඩ හා කේරළ වියවුල් සංසිඳුවීම, සංඝාරාම කරවීම, භික්ෂූන්ට ඇප උපස්ථාන කිරීම සහ ශාසනාභිවෘද්ධිය සැලසීම ඈදී කරුණු සුවිශේෂී වෙයි.

' නක්ෂත්‍ර, වෛද්‍ය කර්මය, යක්ෂ ප්‍රලය ආදී බුදුන් එපා කර වදාළ නින්දිත ශාස්ත්‍ර ඉගැන්වීමෙන්...' ලෙසින් වූ අකටයුතුකම් නිසා එදා බුද්ධ ශාසනය පිරිහීමට පත් විය. තවද භික්ෂුව ග්‍රාම නිලධාරි තනතුරු පවා ලැබූ බව ' ග්‍රාම ක්ෂේත්‍රාදී ' යන වදනින් අවධාරණය වෙයි. ගොවිතැන, වෙළදාම හා යකුන් එළවීම වැනි දැයින් එවක භික්ෂුව ගිහියෙකුගේ මට්ටමට පත් වී තිබුණි.

එමෙන්ම ඥාති කුලවල අය පමණක් පැවිදි කිරීමෙන් පුත්‍රදාර පෝෂණයත් ඉතා භයානක අන්දමින් සිදු විය. මෙවන් අකටයුතුකම්වලින් සසුන මුදවා ගැනීම උදෙසා කීර්ති ශ්‍රී රාජසිංහ රජු නොගත් උත්සහයක් නැති තරම්. එකී ප්‍රයත්නයන් අතුරින්,

- දළඳා වහන්සේ හට ගම්, කෙත්වතු, ඇතුන්, අසුන් හා වස්තු පිරිනැමීම
- මහියංගණ, අනුරපුර හා සමනළ කන්ද වැනි ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම
- නිතිපතා සද්ධර්මය ශ්‍රවණය කොට ග්‍රන්ථ සම්පාදනයට ආධාර දීම
- උපසම්පදාව පිහිටුවීමට වෙහෙසීම
- කුල දරුවන් පැවිදි කිරීම
- නොයෙක් ස්ථානවල විහාර කරවීම ආදිය පිළිබඳව උක්ත කතිකාවතෙහි තොරතුරු ඇතුළත් ය.

තවද දඹදෙණි කතිකාවතෙහි නොමැති කරුණු දහයක් මෙහි අන්තර්ගත වන බව මෙය විමසා බලන්නෙකුට හැඟෙනු ඇත. එනම්,

**' තිරශ්චීන කතා හා කාම විතර්කාදී පාප විතර්කයේ නොයෙදී...'**

දෙමාපියනට උපකාර කිරීම අනුදත් බැවින්...සංග්‍රහයන් හැර සෙසු රන් රිදී තඹ මුදු මාල ආදී පළඳනා ද ගම්බිම්, ගවමහිස, දාසිදාස, කැති උදලු, වෑ පොරෝ, ඇද, පුටු ආදී නොකට යුතුය. '
මෙහි වූ උපභෝග පරිභෝග වස්තූන් පටු පරමාර්ථ වෙනුවෙන් නොදිය යුතු වුවද තමාට දන් දෙන හෝ නොදෙන දුප්පත් අසරණ ජනයාට බෙදීම වරදක් නැත. තවද පැවිද්දන්ගේ පොත්පත් සිවුරු පිරිකර ආදිය නෑ නොනෑයින්ට නොදිය යුතු අතර සිවුරු හැර ගිහි බවට පත් අය පැවිදි කල ලැබූ දේ ගෙන නොයා යුතුය. මෙවන් කරුණු භික්ෂු අපවාදයන්ගෙන් මිදවීමට සමත් බව පැහැදිලි ය.

එසේම මෙම කතිකාවතට අනුව ' පින් පිණිස ධර්මය ලියනවා මිස බරපැන් පිණිස කොයි නමක්වත් පොත්පත් නොලිය යුතුය. ' මන්ද ධර්මය වෙළඳ භාණ්ඩයක් කිරීම සසුනේ පරිහානිය උච්ච අවස්ථාවකට පත් කරන්නක් බැවින්ම ය.

මේ අයුරින් බලන කල කාලීනව වැදගත් වූ සම්මුති රැසකින් මෙම කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත පූරිත වනු ඇත. මෙහි බස ද පහසුවෙන් අවබෝධ වන සරල බසකි. භික්ෂූන්ගේ චිර පැවැත්ම මෙහි මුඛ්‍ය පරමාර්ථය වී ඇත.

## රාජාධි රාජසිංහ කතිකාවත

මෙහි අන් කතිකාවත් මෙන් සංඥාපන නැත. එහෙත් කතිකාවත් දෙකක් පිළිබඳ කරුණු දක්වයි. ඉන් 1 පරාක්‍රමබාහු කතිකාවත විශේෂ වෙයි. සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම පිළිබඳ තොරතුරු දැක්වීම මෙහි මුඛ්‍ය පරමාර්ථය කර ගත් අතර මින් විශද කරවන තවත් කරුණු කිහිපයකි.

' ශාසනවතර සමාන ශ්‍රද්ධා නැති හිරි ඔතප් රහිත පුද්ගලයින්ගේ බාහුල්‍යතායෙන් ශාසන දූෂණ වන පරිදි අසා එබඳු අප්‍රතිපත්ති දුස්ප්‍රතිපත්ති හැරවීම පිණිස ධර්මානුකූල මහා ආඥාව පනවන ලදී...'
මෙම කතිකාවතෙහි විශේෂත්වයක් නම් මෙය ධර්මානුකූල ආඥාවක් වීමයි. තවද උපසම්පදා භික්ෂුවක් පිළිපැදිය යුතු ප්‍රධාන කරුණු 14ක් පිළිබඳව ද මෙහි වැදගත් සටහනක් වෙයි.

මේ ආදී වශයෙන් සලකා බලන කල්හි වත්මන් භික්ෂු භික්ෂුණී දිවියට අත්‍යවශ්‍ය ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය මෙන්ම නූතන ලෝකයට අවැසි දැන උගත්කමින් ද පොහොනා විය යුතු ආකාරය පිළිබඳව ද මේවායෙහි විස්තර මනාව සනිටුහන් වේ. එබැවින් භික්ෂුන් වහන්සේ වූකලි අධ්‍යාපනයෙන් සහ බොදු ජනයාගේ ගරු සැලකිලි ලැබීමට සුදුසු අධ්‍යාත්මික ගුණ ධර්මයන්ගෙන් පූරිත අයෙක් විය යුතු බැවින් මෙකී කතිකාවත්වලින් ලැබෙනුයේ ඉමහත් වූ පිටුබලයකි.



ආර්. එම්. එරන්දි සසිප්‍රභා මානෑව